
PR 6770

# ආහාර මිල ඉහළ යාම ගෘහ ඒකකවල ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් දක්වන බලපෑම

එච්.එම්.ජේ.කේ. හේරත්



HARTI

National Science Foundation
30 APR 2015
NSLRC
Colombo

# ආහාර මිල ඉහළ යාම ගෘහ ඒකකවල ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් දක්වන බලපෑම

එච්.එම්.ජේ.කේ. හේරත්

සිංහල පර්යේෂණ වාර්තා : අංක 47

2011 දෙසැම්බර්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

114, විජේරාම මාවත,

කොළඹ 07.

ප්‍රථම මුද්‍රණය : 2011 දෙසැම්බර්

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියළුම හිමිකම් ඇවිරිණි

ISBN : 978-955-612-131-5

පරිගණකගත කිරීම : තරංගා ද සිල්වා

පිටු සැකසුම හා කවර නිර්මාණය : ඒ.පී.උදේනි කරුණාරත්න

# පෙරවදන

මානව පරිණාමයේ ආරම්භයේ සිට මේ දක්වාම පැවැත්ම සඳහා ආහාර පරිභෝජනය කිරීම සිදු විය. මේ නිසාම මිනිසාට තම ජීවිත පැවැත්ම සඳහා ආහාර අත්‍යාවශ්‍ය අංගයක් විය. වර්තමානයේ මිනිසා තම පැවැත්ම සඳහා විවිධ ආහාර නිෂ්පාදනයට මෙන්ම මිලදී ගැනීමටද හුරු පුරුදු වී ඇත. විශේෂයෙන්ම මෑත වකවානුව ආහාර නිෂ්පාදනය ගෝලීය මට්ටමින් විශාල වෙනස්කම් රැසකට බඳුන් වූ අවධියක් ලෙස හඳුනාගත හැකිය. එනම් ගෝලීයකරණය සමග ලෝකය පුරා ආහාර සඳහා විශාල ඉල්ලුමක් ඇති වූ අතර එය සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවට ද විශාල ලෙස බලපෑ කරුණක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2006 වසරේ ගෝලීය වශයෙන් ආහාර මිල අසාමාන්‍ය ලෙසින් ඉහළ යාමක් වාර්තා විය. එහිදී 2007 හා 2008 වසරවල මෙහි කැපී පෙනෙන වෙනසක් සිදුවිය. එවැනි පසුබිමක් තුළ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා නාගරික පරිසරය තුළ මෙන්ම වතු ආශ්‍රිතව ආහාර මිල වැඩිවීමක් සිදුවිය. මෙම ආහාර මිල ඉහළ යාම නිසා ඇති වූ බලපෑම මගහරවා ගැනීමට විවිධ මට්ටමේ ක්‍රියාමාර්ගයන්ට එළැඹීමට ජනතාව පෙළඹුණහ. මෙවැනි පසුබිමක් තුළ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ආහාර මිල ඉහළ යාම ගෘහ ඒකකවල ආහාර සංරක්ෂිතතාවය සම්බන්ධයෙන් දක්වන බලපෑම පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදී.

එම අධ්‍යයනය මගින් 2007 වසරේ සිට 2009 දක්වා කාලය තුළදී ශ්‍රී ලංකාවේ ආහාර මිලෙහි වැඩිවීමක් හඳුනාගත හැකිවිය. එම කාලපරිච්ඡේදය තුළ සහල් මිල 60%කින්ද, කිරිගු පිටි මිල 37%කින්ද, පාන් මිල 40%කින්ද, මාංශ බෝග මිල 38%කින්ද, අර්තාපල් මිල 22%කින්ද වැඩි වී ඇත. මිල වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් පාරිභෝගිකයින් විකල්ප බෝගයන්ට මාරුවීම, කල් පවතින භාණ්ඩ මිල දී ගැනීම සීමා කිරීම හා ඉතුරුම් පරිභෝජනයට යොදා ගැනීම බහුලව සිදු කොට ඇත.

දේශීය වශයෙන් වගා කළ හැකි ආහාර බෝග පිටරටින් ආනයනය නොකර මෙරට වගා කිරීමේ රජයේ ප්‍රතිපත්තියේ ඇති වැදගත්කම හා කාලීන බව මෙම අධ්‍යයනය මගින් තහවුරු වී ඇත. ගෙවතු දස ලක්ෂයක් ඇති කිරීම, 'පුරන් කුඹුරු වගා කිරීම', 'අපි වවමු – රට නගමු' වැනි සීඝ්‍ර කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්, පොහොර සහනාධාරය ලබා දීම යන කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සෘජුව ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා හේතු වේ. මෙම වැඩසටහන් නිරතුරුව අධීක්ෂණයට ලක් කිරීම අපේක්ෂිත අරමුණු කරා ළඟා වීම සඳහා වැදගත් බව අධ්‍යයනයෙන් නිර්දේශ කෙරේ. මෙම පර්යේෂණයේ සොයා ගැනීම් හා නිර්දේශ මගින්ද චින්තන ඉදිරි දැක්මෙහි අපේක්ෂිත ආහාර සුරක්ෂිතතාවය යන අවස්ථාව සාක්ෂාත් කරගැනීම සඳහා වැදගත් වනු ඇත.

නීතිඥ ලලිත් කාන්ත ජයසේකර

අධ්‍යක්ෂ

# ස්තූතිය

වර්තමානයේ ආහාර නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීම සඳහා මෙරට ජනතාවට මහ පෙත්වීමක් ලබා දීම මෙන්ම අනාගතයේ ඇතිවිය හැකි ආහාර සම්බන්ධ අර්බුදකාරී තත්ත්වය අරමුණු කරමින් ආහාර මිල ඉහළ යාම හා ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ජනතාව දක්වන බලපෑම අධ්‍යයනය කිරීම සඳහා මූලික මගපෙන්වීම ලබා දෙමින් අප දිරිමත් කළ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ නීතිඥ ලලිත් කාන්ත ජයසේකර මහතාට ප්‍රථමයෙන් ස්තුතිය පුදකර සිටිමි. එසේම මෙහිදී ආරම්භයේ සිට අවසානය දක්වා පැවති අඩුපාඩු මගහරවා ගනිමින් වඩාත් සාර්ථක අධ්‍යයනයක් සිදු කිරීම කෙරෙහි මහ පෙන්වූ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය එල්.පී. රූපසේන මහතාට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

මෙම අධ්‍යයනය ආරම්භයේ සිට අවසානය දක්වා වූ කටයුතු සඳහා සහය දැක්වූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යාව පිළිබඳ උපාධිධාරී ඩබ්.ජී. කමල් අමරසිංහ මහතාටද මාගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමි.

මෙම අධ්‍යයනයේ වැදගත්ම කර්තව්‍යය වන තොරතුරු රැස්කිරීම සඳහා සහය දැක්වූ වතු ආශ්‍රිත නිලධාරී මහතුන් සහ වතු කම්කරුවන් ස්තුති පූර්වකව සිහිකරන අතර, මෙම අධ්‍යයනය සඳහා දත්ත එක්රැස් කරගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු කාර්යය මණ්ඩලයටත් අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දුන් ප්‍රදේශවාසීන්ටත් මාගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමි. විශේෂයෙන් ම ඔවුන්ගේ කාලය වැය කරමින් මේ සඳහා කළ කැපවීම ඉතාමත් අගය කොට සලකමි.

දත්ත රැස්කිරීමේ සිට සියලු කාර්යයන් සඳහා සහය දැක් වූ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ සංඛ්‍යාන සහකාර උපුල් අරුණශාන්ත මහතාටත්, සංඛ්‍යාන නිලධාරි එන්.එස්.ජේ.කේ. නිශ්ශංක මහතාටත්, අනියම් විමර්ශිකා ජී. නිරෝෂා මහත්මියටත් මාගේ ස්තුතිය පුදකර සිටින අතර, මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත ලබා දෙමින් ඒ සඳහා මා සමඟ ක්ෂේත්‍ර කටයුතුවල නියැලුණු සමීක්ෂණ නිලධාරීන් මෙන් ම අවශ්‍ය තොරතුරු සපයමින් මෙම අධ්‍යයනය සාර්ථක කරගැනීමට සහයෝගය ලබා දුන් ගොවි මහතුන්, වතු හා ධීවර ජනතාව ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මෙම පර්යේෂණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කළ ප්‍රකාශන ඒකකයේ අංශ ප්‍රධාන පූජිත ද මැල් මහතාටත්, කළමනාකරණ සංස්කරණ කටයුතු සිදු කළ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිණී වත්සලා ගමගේ මහත්මියටත්, වාර්තාව මුද්‍රණය කිරීමේ කටයුතු මැනවින් ඉටු කරදුන් මුද්‍රණ අංශයේ කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමි.

එච්.එම්.ජේ.කේ. හේරත්

# සංක්ෂිප්තය


2006 වර්ෂයේ සිට ගෝලීය වශයෙන් ආහාර මිල අසාමාන්‍ය වේගයකින් ඉහළ යාමක් දක්නට ලැබෙන අතර විශේෂයෙන්ම 2007 දී සහ 2008 යන වසරවල එය කැපී පෙනෙන අගයක් ගනු ලැබීය. මෙම ප්‍රවණතාවය අනුව යමින් මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේද ආහාර මිල සීඝ්‍රයෙන් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නාගරික, ග්‍රාමීය සහ වතු යන සෑම අංශයක ම ගෘහ ඒකකවල ආහාර වියදම් පියවා ගැනීම සඳහා විකල්ප උපායමාර්ග අනුගමනය කිරීමට සිදුවිය. ආහාර මිල ඉහළ යාමේ බලපෑමට දක්වන ප්‍රතිචාර ඒ ඒ අංශයේ ගෘහ ඒකකයෙන් ඒකකයට වෙනස් වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේද ශ්‍රී ලංකාවේ ආහාර මිල ඉහළයාමට ප්‍රතිචාර වශයෙන් ඒ ඒ ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප උපාය මාර්ග සහ එම ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් දක්වන බලපෑම පිළිබඳව විමර්ශනය කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත භාවිතා කරන ලදී. එසේම සමීක්ෂණ නියැදිය සඳහා බහු පියවර, ස්ථර, සසම්භාවී නියැදි ක්‍රම භාවිතා කරනු ලැබිණි. සමස්ත නියැදිය ගෘහ ඒකක 250කින් සමන්විත වේ. ගෘහ ඒකක මට්ටමේ ආහාර සුරක්ෂිතතාවය ඇස්තමේන්තු කිරීම සඳහා ලෝක ආහාර වැඩසටහන (WEP) මඟින් ගොඩනගන ලද ආහාර පරිභෝජන මට්ටම් (Food Consumption Score) ඇස්තමේන්තු කිරීමේ ආකෘතිය භාවිතයට ගනු ලැබීය. ඒ අනුව සංඛ්‍යාත්මකව ඒකක 40ට පහළ පරිභෝජන මට්ටමක් නිරූපණය වන ගෘහ ඒකක ආහාර අනාරක්ෂිතභාවයට පත්වී යැයි හඳුනාගනු ලැබීය.

ආහාර මිල ඉහළයාම පිළිබඳ විශ්ලේෂණය අනුව, 2007 සිට 2009 දක්වා කාලය තුළ සහල් මිල 60%කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම තිරිඟු පිටි 37%කින්ද, පාන් 40%කින්ද, මාංශ භෝග 38%කින්ද, අර්තාපල් 22%කින්ද වශයෙන් ඉහළ ගොස් ඇත. එමෙන්ම කිරිපිටි මිල 35%ක් හා සීනි මිල 47%කින් වැඩි වී ඇති බැව් හඳුනාගත හැකිය. සෑම ගෘහ ඒකකයකම ආහාර සුරක්ෂිතතාවය සඳහා එය බලපා ඇති අතර, විශේෂයෙන්ම වතු, නාගරික, පැල්පත් සහ ධීවර ගෘහ ඒකකයන් සඳහා බලපෑම ඉහළ අගයක් ගනී. ඇස්තමේන්තු කරන ලද ආහාර පරිභෝජන මට්ටම පිළිබඳ ආකෘතියට අනුව, සමස්ත නියැදියෙන් 14%ක් ආහාර අනාරක්ෂිතතාවයට පත්ව සිටී. ආහාර මිලදී ගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය විවෘත වෙළෙඳපොළයි. එම ප්‍රමාණය 73%ක් වේ. ග්‍රාමීය අංශය හැර අනෙකුත් අංශයන් සඳහා එය ආසන්න වශයෙන් 100%කි. මෙම අධ්‍යයනයේදී තවදුරටත් ආහාර මිල ඉහළ යාම හමුවේ ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප උපාය මාර්ග පිළිබඳව විශ්ලේෂණය කරනු ලැබීය. ඒ අනුව, සාපේක්ෂව අඩු මිල ආහාර මිලදී ගැනීම සහ මිලට ගනු ලබන ප්‍රමාණය අඩු කිරීම (80%), ණය පදනම මත මිලට ගැනීම (66%), දෛනිකව පරිභෝජනය කරනු ලබන ආහාර ප්‍රමාණය අඩු කිරීම (66%) සහ මිතුරන් සහ අසල්වැසියන්ගෙන් ඉල්ලා ගැනීම (57%) ප්‍රධාන විකල්ප උපාය මාර්ගයන් වශයෙන් හඳුනාගන්නා ලදී. එසේම ආහාර මිලදී ගැනීම සඳහා ණය ලබාගැනීම (17%) තවත් විකල්ප ක්‍රියාමාර්ගයන් ලෙස හඳුනාගන්නා ලද අතර, එය දෙවෙනි වන්නේ නිවාස සෑදීම සහ අළුත්වැඩියා කිරීම (26%) සහ කෘෂි යෙදවුම් මිලට ගැනීමට (21%) පමණි.

ගෘහ ඒකකවල ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා වතු නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල වඩා දිළිඳු ගෘහ ඒකක ඉලක්ක කරගනිමින් දැනට ක්‍රියාත්මක වන ආහාර ආධාර වැඩසටහන් නැවත සංවිධානය කිරීම, ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සඳහා දිළිඳු ගෘහ ඒකකවල සාමාජිකයින්ගේ සහභාගීත්වය ලබාගනිමින් ආදායම් ඉපයීමේ අවස්ථා ඇති කිරීම මඟින් ඔවුන්ගේ මිලට ගැනීමේ හැකියාව ඉහළ දැමීම හා ණය බරින් මුදවා ගැනීමට අවස්ථාව සලසාදීම මඟින් සියලුම අංශයන් ආවරණය වන පරිදි විශේෂ ගෙවතු සංවර්ධන වැඩසටහන් ඇති කිරීම, සුදුසු ව්‍යාප්තීකරණ යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ ගෘහණියන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් ඇති කිරීම, ප්‍රාදේශීය වශයෙන් ආහාර නිෂ්පාදනය ඉහළ දැමීම මඟින් ආහාර මිල අඩු කිරීමට කටයුතු කිරීම හා එය දිළිඳු ජනතාවගේ ආහාර මිලදීගැනීමේ හැකියාව ඉහළ දැමීම සඳහා ඉවහල් කරගැනීම මෙම අධ්‍යයනය මඟින් නිර්දේශ කෙරේ.

## පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| පෙරවදන | | iii |
| ස්තූතිය | | iv |
| සංක්ෂිප්තය | | v |
| පටුන | | vi |
| වගු සටහන් | | x |
| ප්‍රස්තාර සටහන් | | xii |
| රූපසටහන් | | xii |
| පළමු පරිච්ඡේදය | | 1 |
| හැඳින්වීම | | |
| 1.1 | අධ්‍යයනයේ පසුබිම | 1 |
| 1.2 | අධ්‍යයනයේ අරමුණු | 4 |
| 1.3 | න්‍යායාත්මක පසුබිම | 4 |
| 1.4 | පර්යේෂණ ක්‍රමවේදය | 6 |
| 1.5 | අධ්‍යයනයේ සීමා | 8 |
| 1.6 | වාර්තාවේ සැකැස්ම | 9 |
| දෙවැනි පරිච්ඡේදය | | 11 |
| සාහිත්‍ය විමර්ශනය | | |
| 2.1 | හැඳින්වීම | 11 |
| 2.2 | වෙනත් අධ්‍යයනයන් සහ සොයාගැනීම් | 11 |
| 2.3 | සාරාංශය | 17 |
| තෙවැනි පරිච්ඡේදය | | 18 |
| මෑතකාලීන සාර්ව ආර්ථික ප්‍රවර්ධනයේ ප්‍රවණතා සහ මිල මට්ටමේ හැසිරීම | | |
| 3.1 | හැඳින්වීම | 18 |
| 3.2 | ශ්‍රී ලංකාවේ මෑතකාලීන සාර්ව ආර්ථික වර්ධනයේ ප්‍රවණතා | 18 |
| 3.3 | සාමාන්‍ය මිල මට්ටමේ ඉහළයාම | 21 |
| 3.3.1 | මිල දර්ශකයේ උපතතිය | 21 |

3.3.2 සහල් මිලෙහි හැසිරීම 23

3.3.3 තිරිඟුපිටි සහ පාන් මිලෙහි හැසිරීම 24

3.3.4 අතිරේක ආහාර ද්‍රව්‍යයන්ගේ මිලෙහි හැසිරීම 24

3.3.5 එළවළු සහ පලතුරු මිල ගණන්හි හැසිරීම 28

3.3.6 පොල් සහ පොල්තෙල් මිල ගණන්හි හැසිරීම 29

3.3.7 මාළු, කරවල, බිත්තර සහ මස් මිල ගණන්හි හැසිරීම 30

3.3.8 කිරිපිටි සහ සීනි මිලෙහි හැසිරීම 32

3.3.9 සාරාංශය 33

**සිව් වැනි පරිච්ඡේදය** **34**

**ආහාර මිල ඉහළයාම නිසා උද්ගතවන ගැටළු හා ඒ ඒ**

**ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප උපාය මාර්ග**

4.1 හැඳින්වීම 34

4.2 ගෘහ ඒකක මුහුණපාන ලද ප්‍රධාන අපහසුතා 34

4.3 ඒ ඒ ගෘහ ඒකක ආහාර මිල ඉහළයාමට ප්‍රතිචාර වශයෙන් ගනු ලබන විකල්ප ක්‍රියාමාර්ග 35

4.4 අත්‍යාවශ්‍ය වියදම් ඉහළ යාම පිළිබඳ පීඩනයට මුහුණු දීම සහ ණය ලබා ගැනීම 39

4.5 රජය සහ රාජ්‍ය නොවන සංවිධාන මඟින් සැපයෙන ආධාර 43

4.6 කාන්තා ගෘහ මූලික ගෘහ ඒකක සම්බන්ධයෙන් දක්වන බලපෑම 44

4.7 යැපෙන්නන් සංඛ්‍යාව 45

4.8 සාරාංශය 46

**පස් වන පරිච්ඡේදය** **47**

**ගෘහ ඒකකවල පරිභෝජනයේ විවිධත්වය සහ ආහාර**

**සුරක්ෂිතතාව තක්සේරු කිරීම**

5.1 හැඳින්වීම 47

5.2 ආහාර පරිභෝජනයේ විවිධත්වය : ආහාර පරිභෝජන මට්ටම - න්‍යායත්මක පසුබිම 47

5.3 ආහාර පරිභෝජනයේ විවිධත්වය සහ තුලනාත්මක ආහාර පරිභෝජන මට්ටම 49

5.3.1 ධාන්‍ය සහ අල වර්ග පරිභෝජනය 51

5.3.2 මාංශ භෝග පරිභෝජනය 51

5.3.3 සත්ව ආහාර පරිභෝජනය 52

5.3.4 එළවළු සහ පලතුරු පරිභෝජනය 53

5.3.5 තෙල් සහ මේද පරිභෝජනය 53

5.3.6 සීනි පරිභෝජනය 53

5.3.7 කිරිපිටි පරිභෝජනය 53

5.4 ප්‍රධාන ආහාරය සපයාදෙන මූලාශ්‍ර 54

5.5 ආහාර පරිභෝජනයේ මට්ටම අධ්‍යයන නියැදි සඳහා අදාළ කරගැනීම 54

5.6 ඒ ඒ අංශයේ ආහාර අනාරක්ෂිතභාවය 56

5.7 සාරාංශය 59

**හය වැනි පරිච්ඡේදය** **60**

**ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමේ විභවතා සහ සීමාවන්**

6.1 හැඳින්වීම 60

6.2 ප්‍රමාණවත් ආහාර සැපයුමක් තහවුරු කිරීම 60

6.2.1 වගා කර ඇති ඉඩම් 60

6.2.2 ග්‍රාමීය අංශයේ ඉඩම් කැබලිවල සංයුතිය 62

6.2.3 ග්‍රාමීය අංශයේ ඉඩම් අයිතිය 62

6.2.4 ඉඩම් පිළිබඳ ගැටළු 62

6.3 ගෙවත්ත වගා කිරීම 62

6.3.1 ගෙවත්තේ ප්‍රමාණය 62

6.3.2 ගෙවත්ත වගා කිරීමේ ප්‍රධාන අරමුණ 63

6.4 කෘෂිකාර්මික නිෂ්පාදනයේ විභවතා 63

6.5 ආහාර නිෂ්පාදනය පිළිබඳ සීමාවන් 64

6.6 ආහාර ලබාගැනීමේ ප්‍රවේශයන් (accessibility) තහවුරු කිරීම 64

6.7 දැරිය හැකි මිලක් යටතේ ආහාර ලබාගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම 66

6.8 සාරාංශය 66

**හත් වැනි පරිච්ඡේදය** 67

**අධ්‍යයනයේ සොයාගැනීම්, නිගමන සහ නිර්දේශ**

7.1 අධ්‍යයනයේ සොයාගැනීම් 67

7.2 නිගමන 67

7.3 නිර්දේශ 68

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 69

ඇමුණුම 1 71

ඇමුණුම 2 80

ඇමුණුම 3 87

වගු සටහන්

| | | පිටු අංකය |
|---|---|---|
| 1.1 | ගෘහ ඒකක වියදම් දශමකය අනුව ආහාර පානාදිය සඳහා සාමාන්‍ය වියදම | 3 |
| 1.2 | ඒ ඒ පියවර අනුව ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා ප්‍රධාන නියැදිය තෝරාගැනීම | 8 |
| 1.3 | ඒ ඒ පියවර අනුව ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා විශේෂ නියැදිය තෝරාගැනීම | 8 |
| 2.1 | 2008 මුල් භාගයෙහි සහල් මිල ඉහළයාම හේතුවෙන් පරිභෝජනයෙහි වෙනස්වීම (බංගලාදේශය) | 13 |
| 2.2 | 2008 මුල් භාගයෙහි ආහාර සැකසීමට ගන්නා තෙල් වර්ගවල මිල ඉහළයාම හේතුවෙන් පරිභෝජනයෙහි වෙනස්වීම (බංගලාදේශය) | 13 |
| 2.3 | 2008 මුල් භාගයෙහි මාංශ බෝග වර්ගවල මිල ඉහළයාම හේතුවෙන් (බංගලාදේශය) | 14 |
| 2.4 | 2008 වසරේදී අළුතින් පාසැලට ඇතුළත් කිරීම සහ පාසැල්යාම නවතාදැමීම (බංගලාදේශය) | 14 |
| 3.1 | මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සහ උප ප්‍රධාන අංශයන්ගේ වර්ධන ප්‍රතිශතයක් වශයෙන් (2001 - 2008) | 19 |
| 3.2 | කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2002 = 100) | 22 |
| 3.3 | ධාන්‍ය සහ මාංශ බෝග සඳහා වාර්ෂික සාමාන්‍ය සිල්ලර මිල | 25 |
| 3.4 | ජාත්‍යන්තර ධාන්‍ය වෙළෙඳපොළ අපනයන මිල (ඇ.ඩො./ටොන් 1 සඳහා) | 26 |
| 3.5 | අල වර්ග සහ එළවළු ආහාරවල වාර්ෂික සාමාන්‍ය මිල, 2007-2009 (රු./කි.ග්‍රෑ.) | 28 |
| 3.6 | පොල් සහ පොල්තෙල්වල සාමාන්‍ය සිල්ලර මිල (රු.) | 29 |
| 3.7 | සත්ව ආහාරවල වාර්ෂික සාමාන්‍ය මිල (රු./කි.ග්‍රෑ.) | 31 |
| 3.8 | ශ්‍රී ලංකාවේ ඒ ඒ අංශයේ ආහාර පරිභෝජනයේ මාසික සාමාන්‍ය වියදම (%) | 32 |
| 3.9 | කිරිපිටි සහ සීනිවල සාමාන්‍ය වාර්ෂික මිල(රු./කි.ග්‍රෑ.) | 33 |
| 4.1 | සමස්ත ගෘහ ඒකක මුහුණපා ඇති අපහසුතාවයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාතය (%) | 35 |
| 4.2 | ගෘහ ඒකක විසින් අනුගමනය කරන ලද ප්‍රතිචාර උපක්‍රමයන්ගේ සාමාන්‍ය (%) | 36 |
| 4.3 | ආහාර මිල ඉහළයාමේ ගැටළුව හමුවේ ඒ ඒ ගෘහ ඒකක විසින් දක්වන ලද ප්‍රතිචාරයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාතය* | 38 |

4.4 ණය ලබාගෙන ඇති ගෘහ ඒකක සංඛ්‍යාව හා එහි ප්‍රතිශතය 39

4.5 ණය ලබාගැනීමේ ප්‍රධාන හේතුව (අංශ වශයෙන්) 41

4.6 ණය ලබාගැනීමේ දෙවන හේතුව (අංශ වශයෙන්) 42

4.7 ස්ත්‍රී පුරුෂභාවය අනුව ගෘහ මූලිකත්වයේ ව්‍යාප්තිය 44

4.8 ඒ ඒ අංශයෙහි යැපෙන්නන් සංඛ්‍යාව (%) 45

5.1 ඒ ඒ ආහාර කාණ්ඩය සඳහා ලබාදී ඇති බර තැබීම් වටිනාකම 48

5.2 ඒ ඒ ආහාර කාණ්ඩය සඳහා බර තැබීමට පාදක කරගන්නා ලද නිර්නායක 49

5.3 ඒ ඒ ආහාර කාණ්ඩය සඳහා බරතැබීමට පාදක කර ගන්නා
ලද නිර්ණායක (දින ගණන් වලින්) 50

5.4 සතියේ ආහාර පරිභෝජන රටාව (දින ගණන්වලින්) 50

5.5 ඒ ඒ අංශයේ තුලනාත්මක ආහාර පරිභෝජන මට්ටම 51

5.6 සතිය තුළ මාංශ බෝග පරිභෝජනය නොකළ ගෘහ ඒකක ප්‍රතිශතය 52

5.7 මස්, මාළු, බිත්තර සහ කරවල පරිභෝජනය නොකළ ගෘහ ඒකක ප්‍රතිශතය 52

5.8 ප්‍රධාන ආහාරය වන සහල් ලබාගන්නා ප්‍රධාන මූලාශ්‍ර 54

5.9 ආහාර පරිභෝජනයේ මට්ටම (අධ්‍යයන නියැදීඹ සඳහා අදාළ
කරගත් නව ප්‍රමිතිය අනුව) 55

5.10 ඒ ඒ අංශයෙහි අවම මට්ටමේ ආහාර පරිභෝජනය කරන ගෘහ ඒකක ප්‍රතිශතය 55

5.11 ඒ ඒ අංශයෙහි අවම මට්ටම් සීමාවේ ආහාර පරිභෝජනය කරන
ගෘහ ඒකක ප්‍රතිශතය 56

5.12 ඒ ඒ අංශයන්හි පිළිගත හැකි ආහාර පරිභෝජන මට්ටමක සිටින
ගෘශ ඒකකයන්ගේ ප්‍රතිශතය 56

5.13 ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකක සංඛ්‍යාව (%) 57

5.14 දෛනිකව කම්කරුවකු ලබන සාමාන්‍ය වැටුප රු. (අංශ වශයෙන්) 57

5.15 ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකක සංඛ්‍යාව සහ
පුද්ගලයන් සංඛ්‍යාව (අංශ වශයෙන්) 58

6.1 ග්‍රාමීය අංශයේ ගෘහ ඒකක සතු වගා කර ඇති බිම් කැබලි සංඛ්‍යාව 61

6.2 ගෘහ ඒකක සතු ගෙවත්තේ ප්‍රමාණය (%) 63

## ප්‍රස්තාර සටහන්


| | | පිටු අංකය |
|---|---|---|
| 3.1 | ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සහ එහි ආංශික සංයුතිය (%) | 21 |
| 3.2 | කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2002=100) | 23 |
| 3.3 | සහල්, තිරිඟු පිටි, පාන්, මාංශ බෝග සහ කුළු බඩු මිල ගණන්හි වාර්ෂික සාමාන්‍යය | 25 |
| 3.4 | ජාත්‍යන්තර වෙළෙඳපොලේ සහල් අපනයන මිල (ඇ.ඩො.-ටොන් 1 ක් සඳහා) | 27 |
| 3.5 | ජාත්‍යන්තර වෙළෙඳපලේ තිරිඟු, බඩඉරිඟු හා සෝගම් සඳහා අපනයනමිල (ඇ.ඩො. – ටොන් 1 ක් සඳහා) | 27 |
| 3.6 | අල වර්ග හා එළවළු ආහාර වාර්ෂික සාමාන්‍ය සිල්ලර මිල (2007 – 2009) | 29 |
| 3.7 | පොල් හා පොල්තෙල්වල සාමාන්‍යය සිල්ලර මිල (රුපියල්) | 30 |
| 3.8 | සත්ව ආහාරවල වාර්ෂික සාමාන්‍යය මිල (රු. කි.ග්‍රෑ.) | 31 |
| 3.9 | කිරිපිටි හා සීනිවල සාමාන්‍ය වාර්ෂික මිල (රු.) | 33 |
| 4.1 | ණය ලබාගෙන ඇති ගෘහ ඒකක සංඛ්‍යාවේ ප්‍රතිශතය | 40 |
| 4.2 | ණය ලබාගැනීමේ ප්‍රධාන හේතුව (අංශ වශයෙන්) | 41 |
| 4.3 | ණය ලබාගැනීමේ දෙවන හේතුව (අංශ වශයෙන්) ප්‍රතිශතය | 42 |
| 4.4 | රජය සහ වෙනත් රාජ්‍ය නොවන අංශයෙන් සැපයෙන ආධාර (ප්‍රතිශතය) | 43 |
| 4.5 | ඒ ඒ අංශ සම්බන්ධයෙන් කාන්තා ගෘහමූලිකත්වයේ ව්‍යාප්තිය (%) | 44 |
| 4.6 | ඒ ඒ අංශයෙහි යැපෙන්නන් සංඛ්‍යාව (%) | 45 |
| 6.1 | ග්‍රාමීය අංශයේ ගෘහ ඒකක සතු වගා කර ඇති බිම් කැබලි සංඛ්‍යාව (%) | 61 |


## රූපසටහන්


| | | |
|---|---|---|
| 1.1 | අධ්‍යයනය සඳහා තෝරාගත් නියැදි බලප්‍රදේශ | 10 |

පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1 අධ්‍යයනයේ පසුබිම

ආහාර මූලික මිනිස් අවශ්‍යතාවයක් වන අතර ආහාර ලබාගැනීමේ අයිතිය මූලික මිනිස් හිමිකමකි. මිනිසා විසින් තම මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ අනුපිළිවෙල සලකා බැලීමේදී පළමුව ආහාර ලබාගැනීමට උත්සාහ ගනු ලැබේ. ආහාර මිනිසාගේ මූලික හිමිකමක් වන නිසා ආහාර ලබාගැනීම සඳහා සැමට අවකාශ තිබිය යුතුය. එම නිසා සෑම රජයක් විසින්ම ජනතාවට අවශ්‍ය ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා ප්‍රමුඛ අවධානය යොමු කරනු ලැබේ. මෙහිදී ප්‍රධාන සාධක තුනක් පිළිබඳව අවධානය යොමු කරයි. එනම් රටේ ජනතාවට අවශ්‍ය ප්‍රමාණයේ ආහාර සැපයුමක් (availability) සහතික කිරීම, සැමට ආහාර පහසුවෙන් ලබාගැනීමට හැකිවීම (accessibility) සහ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ගණන් එම රටේ ජනතාවට දැරිය හැකි මට්ටමකින් පවත්වාගෙන යාම (affodability) යන සාධක වේ. මෙම සාධක එකක් හෝ කීපයක් පිළිබඳ ගැටළු මතුවුව හොත් එම රටෙහි නැත්නම් එම ප්‍රදේශයෙහි එමෙන් ම කිසියම් ගෘහ ඒකකයක් හෝ පුද්ගලයෙකු සම්බන්ධයෙන් ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටළු මතුවේ. ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව පසුගිය දශක තුනක පමණ කාලයක සිට විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇති අතර ආරම්භයේ ඉදිරිපත් වූ නිර්වචනවල දුර්වලතා පසුව ඉදිරිපත් කළ නිර්වචන්වල දී ප්‍රතිපෝෂණය කර තිබේ. "ක්‍රියාකාරී සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් පවත්වාගෙන යාම සඳහා සියළුම ජනතාවගේ දෛනික ආහාර අවශ්‍යතා සපුරාගැනීමේදී සුරක්ෂිත හා පෝෂ්‍ය පදාර්ථ අඩංගු ආහාර ලබාගැනීමට අවශ්‍ය භෞතික, සමාජීය හා ආර්ථික ප්‍රවේශයන් තහවුරු කිරීම" (The State of Food Insecurity 2001) ආහාර සුරක්ෂිතතාව ලෙස නිර්වචනය කෙරේ.

කෙසේ වෙතත්, ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද පාලනය කළ නොහැකි විවිධ සාධක මත ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ගැටළු මතුවේ. විශේෂයෙන්ම ජාත්‍යන්තර වෙළෙඳපොළ තොග සැපයුම සීමාවීම සහ මිල ඉහළ යාම හේතුවෙන් දේශීය වශයෙන් ආහාර මිල ස්ථායීතාවය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගැටළු මතුවේ. එමෙන් ම ස්වභාවික සාධක එනම් දේශගුණ විපර්යාසයන් සහ වාරිකව ආහාර නිෂ්පාදනයේ ඇතිවන විචලනයන් මිල උච්චාවචනය සඳහා හේතුවේ. නිෂ්පාදනයෙහි සහ මිලෙහි උච්චාවචනය නිසා කෙටිකාලයේදී පරිභෝජනයේ ඇති වන වෙනස්වීම් දිගු කාලයේදී ගෘහ ඒකකවල ආහාර සුරක්ෂිතාව සම්බන්ධයෙන් ගැටළු මතුවීම සඳහා මූල බීජය වේ (Albert Valdes, and Anwar siamwalla, 1981). හැමවිටම කිසියම් නිශ්චිත මට්ටමක ආහාර සැපයුමක් සහතික කරගැනීම සඳහා සෑම ගෘහ ඒකකයක් විසින්ම ප්‍රතික්‍රියා දැක්වීමේ යාන්ත්‍රණයක් (coping mechanism) භාවිතයට ගැනේ. රටක ජනතාව වෙතින් ආහාර සඳහා කෙරෙන ඉල්ලුම සහ එහි සැපයුම අනුව ආහාර මිල ගණන් තීරණය වන අතර මිල ගණන් ඉහළයාමේ බලපෑම ගෘහ ඒකකයෙන් ඒකකයට වෙනස් වේ.

තම ගෘහ ඒකකයට අවශ්‍ය ආහාර සම්පූර්ණයෙන්ම වෙළෙඳපොළින් මිලට ගනු ලබන්නන් ශුද්ධ ආහාර මිලට ගන්නන් (net food buyers) වන අතර තමා විසින් නිෂ්පාදනය කරනු ලබන ආහාර ද්‍රව්‍යවලින් පරිභෝජනය ඉක්මවන ප්‍රමාණය (surplus) වෙළෙඳපොළ වෙත අලෙවි කරන්නන් ශුද්ධ

ආහාර අලෙවි කරන්නන් (net food sellers) වශයෙන් හැඳින්වේ. ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ඉහළ යාම ප්‍රධාන වශයෙන් ශුද්ධ ආහාර මිලට ගන්නන් සඳහා අයහපත්ව බලපාන අතර ශුද්ධ ආහාර අලෙවි කරන්නන් සඳහා යහපත් ලෙස බලපානු ලැබේ. එය රටක විවිධ ජන කොට්ඨාස සඳහා විවිධ පරිමාණයෙන් බලපෑම් කරනු ලබන අතර අඩු ආදායම් ලබන වැඩි වශයෙන් ආහාර මිලට ගැනීම සඳහා වෙළෙඳපොළ මත යැපෙන වඩා දිළිඳු ජන කොට්ඨාස සඳහා වැඩි අයහපත් බලපෑමක් සිදු කෙරේ. බොහෝ විට මෙම ජන කොට්ඨාස නාගරික දිළින්දන්, ග්‍රාමීය ඉඩම් නොමැති ජනතාව, බොහොමයක් සුළු පරිමාණ ගොවීන් සහ පිටිසරබද ආත්තික ආදායම් ලබන දිළින්දන්ගෙන් සමන්විත වේ (ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය, 2008). අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ඉහළ යාම හමුවේ රටක ගෘහ ඒකකයන් එයට හැඩගැසීම සඳහා දක්වන ප්‍රතිචාර උපක්‍රම (coping strategies) ප්‍රධාන විචල්‍යයන් තුනක් ආශ්‍රයෙන් විශ්ලේෂණය කළ හැකිය. එම විචල්‍යයන් වනුයේ ගෘහ ඒකකයන්ගේ පරිභෝජනය, වියදම් සහ ආදායමයි.

ගෝලීය වශයෙන් 2007 සහ 2008 වසරවල ආහාර ද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා පීඩනයට පත්වී ඇති ජනතාව සම්බන්ධයෙන් ඒ ඒ රාජ්‍ය සහ අන්තර්ජාතික සංවිධානවල විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එයට අනුබද්ධ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය වැනි ආයතනවල අවධානය යොමු වී තිබේ. අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල ඉහළ යාම මඟින් ඒ ඒ රටවල සාර්ව ආර්ථික විචල්‍යයන් කෙරෙහි දක්වන බලපෑම තක්සේරු කිරීමට සහ ඒ සඳහා කෙටිකාලීන හා දිගුකාලීන වශයෙන් පිළියම් යෙදීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් උපදෙස් දීමට සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මෙම රටවල් සහ සංවිධානවල අවධානය යොමු කර තිබේ. එහිදී ආහාර ද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම හමුවේ ඒ ඒ රටවල ගෘහ ඒකක දක්වන ප්‍රතිචාර උපක්‍රම පිළිබඳව සූක්ෂම විශ්ලේෂණයන් සිදු කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. මේ පිළිබඳව සිදු කර ඇති අධ්‍යයනයන් මඟින් ආහාර මිල ගණන් ඉහළ යාම ඒ ඒ රටවල අඩු ආදායම්ලාභී දිළිඳු ජනතාව කෙරෙහි දැඩි පීඩනයක් ඇති කර තිබෙන බව අනාවරණය වේ. ශ්‍රී ලංකාවේ යුද තත්වයක් පැවති උතුරු නැගෙනහිර ඇතැම් දිස්ත්‍රික්කවල ආහාර සැපයුම සීමාවීම සහ මිල ඉහළයාම එම දිස්ත්‍රික්කවල ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් දක්වන බලපෑම පිළිබඳව ලෝක ආහාර වැඩසටහන වැනි ආයතන මඟින් සමීක්ෂණයන් සිදුකර ඇති නමුදු ජාතික වශයෙන් සූක්ෂම සමීක්ෂණයක් සිදුකර නොමැත.

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් 2006/07 වසරේදී පවත්වනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් පිළිබඳ සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ ගෘහ ඒකකයක සාමාන්‍ය මාසික වියදම රු.22,671කි. නමුත් නාගරික අංශය හැර ග්‍රාමීය සහ වතු අංශයේ ගෘහ ඒකකයක මාසික සාමාන්‍ය වියදම ජාතික මට්ටමේ ගෘහ ඒකකයක සාමාන්‍ය වියදමට වඩා අඩු අගයක් ගනී. වතු අංශයේ ගෘහ ඒකකයක සාමාන්‍ය මාසික වියදම (රු.12,879) මෙන් තෙගුණයක මාසික වියදමක් (රු. 37,978) නාගරික අංශයේ ගෘහ ඒකකයක් විසින් දරනු ලබයි. නමුත් මෙම අංශ දෙකේම ගෘහ ඒකකයන්ගේ සාමාජික සංඛ්‍යාව සමාන වේ. අනෙක් අතට පළාත් වශයෙන් සලකා බැලීමේදී බස්නාහිර (රු. 32,872) හැර අනෙකුත් සියළුම පළාත්හි ගෘහ ඒකකයක සාමාන්‍ය මාසික වියදම ජාතික මට්ටමේ ගෘහ ඒකකයක සාමාන්‍ය මාසික වියදමට වඩා අඩු අගයක් ගනී. මෙම සමීක්ෂණයේ තොරතුරු අනුව, ජාතික වශයෙන් ඒ ඒ අංශ අතර මෙන් පළාත් අතරද ගෘහ ඒකක ආදායම මෙන්ම වියදම්වල විශාල අසමානතා ඇති බව අනාවරණය වේ. එය පරිභෝජනයේ අසමානතා සඳහා හේතු වේ.

ආහාර මිල ගණන් අසාමාන්‍ය ලෙස ඉහළ යාම හේතුවෙන් ඉහත අසමානතාවයන්ට ලක්වී ඇති ගෘහ ඒකක වඩාත් පීඩාවට පත්වේ. ශ්‍රී ලංකාවේ ගෘහ ඒකකවල ආහාර වියදම් අනුපාතිකය (ආහාර ද්‍රව්‍ය සඳහා දරන වියදම මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස) 35.8% ක් වන අතර ශ්‍රී ලංකාවේ මුළු ගෘහ ඒකකවලින් 80%කට වැඩි ප්‍රමාණයක ආහාර වියදම් අනුපාතය ජාතික ආහාර වියදම් අනුපාතයට වඩා වැඩි අගයක් ගනු ලබයි. තවද ශ්‍රී ලංකාවේ ගෘහ ඒකකවලින් 50%ක් තමන්ගේ මාසික වියදමින් හරි අඩක් ආහාර පානාදිය සඳහා වියදම් කරයි (වගු අංක 1.1).

**වගු අංක 1.1 : ගෘහ ඒකක වියදම් දශමකය අනුව ආහාර පානාදිය සඳහා සාමාන්‍ය වියදම**

| දශමක | ශ්‍රී ලංකා වියදම් කාණ්ඩය (රු.) | මුළු මාසික වියදම (රු.) | ආහාරපානාදිය සඳහා වියදම (රු.) | ආහාරපාන වියදම් අනුපාතිකය % |
|---|---|---|---|---|
| | | 22671 | 8105 | 35.8 |
| 1 | 7310 ට අඩු | 5373 | 3276 | 60.8 |
| 2 | 7310-9575 | 8573 | 4899 | 57.1 |
| 3 | 9576-11415 | 10456 | 5851 | 56.0 |
| 4 | 11416-13600 | 12547 | 6807 | 54.3 |
| 5 | 13601-15899 | 14743 | 7526 | 51.0 |
| 6 | 15900-18833 | 17271 | 8161 | 47.3 |
| 7 | 18834-22962 | 20813 | 9189 | 44.2 |
| 8 | 22963-28883 | 25681 | 10147 | 39.5 |
| 9 | 28884-40815 | 34036 | 11376 | 33.4 |
| 10 | 40815 ට වැඩි | 77305 | 13842 | 17.9 |

මූලාශ්‍රය : ගෘහ ඒකක ආදායම් සහ වියදම් පිළිබඳ සමීක්ෂණය, (2006/2007), ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.

ලෝකයේ වෙනත් රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ 2007 සහ 2008 වසරවල ආහාර මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. ප්‍රධාන ආහාරය වන බත සපයන සහල්වල මිල ගණන් 2007 මැයි මස සිට සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර මිල ඉහළ යාමේ ප්‍රතිශතය ආසන්න වශයෙන් 100%කි. තිරිඟු පිටි සහ පාන් මිල ගණන් 2007 වසරේ අවසාන භාගයේ සිට ඉහළයාම නිසා ආදේශන ප්‍රතිඵලයක් වශයෙන් සහල් මිල ගණන් දිගටම ඉහළ යන ලදී. බොහොමයක් ආහාර ද්‍රව්‍යවල ආනයන මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ ගිය අතර කිරිපිටි මිල ගණන් 2006 වර්ෂයට සාපේක්ෂව 20%කින්ද තිරිඟු ඇට මිල ගණන් 47%කින්ද වැඩි විය. අනෙකුත් ආහාර ද්‍රව්‍ය අතර පරිප්පු 68%කින් හා වියළි මිරිස් 31%කින් වැඩි වී තිබේ. අසාමාන්‍ය ලෙස මිල ගණන් ඉහළ යාම 2007 වසරෙන් ආරම්භ වූ අතර එය 2008 වසරේදීද එලෙසම පැවතුණි. ආහාර මිල ගණන් ඉහළ යාම හමුවේ එයට ප්‍රතිචාර වශයෙන් ඒ ඒ ගෘහ ඒකක ඔවුන්ගේ පරිභෝජන රටාවන් හැඩගස්වා ගැනීම නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් විශාල වශයෙන් ගැටළු මතුවේ. එය ඔවුන්ගේ ජීවන මට්ටම යහපත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෙටිකාලීන සහ දිගුකාලීන වශයෙන් මහත් ගැටළු රාශියක් නිර්මාණය කරයි. එබැවින් ආහාර මිල ගණන් ඉහළයාම ගෘහ ඒකකයන්ගේ ආහාර සුරක්ෂිතතාව සඳහා දක්වන බලපෑම අධ්‍යයනය කිරීම වැදගත් වන අතර එයින් ලබාගන්නා තොරතුරු සහ දර්ශක රාජ්‍ය සහ වෙනත් සංවර්ධන කාර්යයන්හි නියැළී සිටින්නන් සඳහා ප්‍රයෝජනයට ගත හැකිවේ. එමෙන්ම මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින් දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග නැවත හැඩගස්වා

ගැනීම සඳහා අධ්‍යයනය මගින් අනාවරණය කරගන්නා ප්‍රතිඵල සහ දර්ශක ප්‍රයෝජනවත් වේ. තවද, වඩා ප්‍රතිඵලදායක වූ උපක්‍රම, ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ආරම්භ කිරීමේදී ඒ ඒ අංශ නියෝජනය කරන ජන කොට්ඨාස ඉලක්ක කරගනිමින් සීමිත සම්පත් බෙදාහැරීම සඳහා සුවිශේෂ වූ යාන්ත්‍රණයක් සැකසීමට මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල උපකාරීවේ.

## 1.2 අධ්‍යයනයේ අරමුණු

ශ්‍රී ලංකාවේ 2007 සහ 2008 වසර දෙකෙහි අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම හමුවේ ඒ ඒ අංශයේ ගෘහ ඒකක දක්වන ප්‍රතිචාර උපක්‍රම සූක්ෂම විශ්ලේෂණයකට භාජනය කිරීම සහ එය ඔවුන්ගේ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් දක්වන බලපෑම අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. පහත සඳහන් විශේෂ අරමුණු සපුරා ගැනීම සඳහා ද අධ්‍යයනයේ අවධානය යොමු වේ.

01. ආහාර ද්‍රව්‍ය උප කාණ්ඩයට අයත් ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්ගේ 2007 සහ 2008 වසරවල සාමාන්‍ය මිල මට්ටමෙහි හැසිරීම අධ්‍යයනය කිරීම.

02. ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්ගේ සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාම හමුවේ නාගරික, ග්‍රාමීය සහ වතු අංශයන්හි ගෘහ ඒකකයන්ගේ ප්‍රතිචාර හා උපක්‍රම තක්සේරු කිරීම.

03. ආහාර මිල ගණන්හි ඉහළ යාම ගෘහ ඒකකවල ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් දක්වන බලපෑම අධ්‍යයනය කිරීම.

04. ඒ ඒ අංශයන්ගේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම් සඳහා අවශ්‍ය වූ ආහාර සැපයුමක් පවත්වාගෙන යාමට කෙටිකාලීන හා දිගුකාලීන වශයෙන් සුදුසු ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.

## 1.3 න්‍යායාත්මක පසුබිම

දියුණු වෙමින් පවතින රටවල උද්ධමන තත්ත්වයක් තුළ ආහාර සැපයුම එකම මට්ටමක පැවතීම සම්බන්ධයෙන් විවිධ න්‍යායාත්මක මතවාද ඉදිරිපත් වී තිබේ. ඉල්ලුමේ ඌනතාවය, ආදායම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති, සේවා නියුක්තිය ඉහළ දැමීම, අතිරේක ඉල්ලුම සහ උද්ධමනය, පහළ මූර්ත දළ ජාතික නිෂ්පාදිතය යනාදී බොහොමයක් සංකල්ප ඒ අතර ප්‍රධාන වේ. ඌන නිෂ්පාදන ධාරිතාව හේතුකොටගෙන සංවර්ධනය වෙමින් පවතින රටවල සැපයුම සම්බන්ධයෙන් සීමාවන් (botlenecks) රාශියක් ජනිත කර තිබේ. පළමුව මෙම රටවල ගෘහ ඒකක පරිභෝජනය තුළ අඩංගු ආහාර පරිභෝජන ප්‍රතිශතය ඉහළ මට්ටමක පවතින අතර එය අතිරේක ආහාර ඉල්ලුම හා බැඳී පවතී. දෙවනුව, බොහොමයක් ආහාර නිෂ්පාදනවල සාපේක්ෂ මිල අනම්‍ය වේ. එම නිසා කෘෂිකාර්මික ආහාර සඳහා ජනිත වන අතිරේක ඉල්ලුම මගින් ඒවායේ මිල ගණන් තියුණු ලෙස ඉහළයාමක් පෙන්නුම් කරයි. තෙවනුව කෘෂිකාර්මික නිෂ්පාදනවල මිල ගණන් වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වන අතර කාර්මික නිෂ්පාදනවල මිල ගණන් එම ආයතන විසින් "පාලනය" කරන බැවින් හා ඔවුන් ලබන ඉහළ වැටුප්වල අවසාන ප්‍රතිඵලය වන්නේ ආහාර

මිල ගණන් ඉහළ යාමයි. එබැවින් සාමාන්‍යයෙන් කාර්මික භාණ්ඩවල නිෂ්පාදනයේ කාල ප්‍රමාදය (time - lag) අවසානයේ ඒවායේ මිල ගණන්ද ඉහළ යාමක් අපේක්ෂා කෙරේ. අවසාන වශයෙන් ආහාර සහ කාර්මික භාණ්ඩ යන දෙවර්ගයේම මිල ගණන් ඉහළ යාම සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ යාමට (උද්ධමනය) හේතු වේ. මෙම ක්‍රියාවලියේදී පිරිවැය මඟින් උද්ධමනයට තල්ලුවක් ලබාදෙන අතර කාර්මික භාණ්ඩ සැපයුම සඳහා ගන්නා කාල - ප්‍රමාදය ආහාර මිල ගණන් ඉහළ යාම සඳහා ආරම්භක අවධියේදී උත්ප්‍රේරණයක් ලබාදේ. ඒ අනුව කාල - ප්‍රමාදය අවසානයේ අනෙකුත් භාණ්ඩද එය අනුගමනය කරනු ඇත. (Maynard,1961, Chakrabwrti,1977 ) කෙසේ වෙතත්, සංවර්ධනය වෙමින් පවතින රටවල උද්ධමනය, ආහාර මිල ගණන් ඉහළ යාම වැනි එක් සිද්ධියක් මත පමණක් තීරණය නොවේ. න්‍යායාත්මක, වාස්තවික සහ රාජ්‍ය ප්‍රතිපත්තිමය සාධක ඇතුළුව උද්ධමනය සාධක ගණනාවක් මත තීරණය වේ. විශේෂයෙන්ම උද්ධමනය රටක සාර්ව-ආර්ථික කළමනාකරණ ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී බලපානු ලැබේ. අනෙක් අතට උද්ධමන අනුපාතය තීරණය වීමේදී ආහාර සැපයුම සහ එහි මිල ගණන් තීරණාත්මක සාධකයක් වන අතර එහි හැසිරීම අනෙකුත් සාධක සඳහාද බලපානු ලැබේ.

සෑම රටකම සාර්ව ආර්ථික ප්‍රතිපත්ති කළමනාකරණයේදී සාමාන්‍ය මිල මට්ටම ස්ථාවරව පවත්වාගෙන යාම ප්‍රධානතම අභිමතාර්ථයකි. සාමාන්‍ය මිල මට්ටමේ ඇතිවන වෙනස්කම් මුදලේ ක්‍රය ශක්තිය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි. මිල මට්ටම ඉහළ යන විට මුදලේ ක්‍රය ශක්තිය පිරිහෙන අතර මිල මට්ටම පහළ යන විට ක්‍රය ශක්තිය ඉහළ නගී. මෙලෙස සාමාන්‍ය මිල මට්ටමේ ඇති වන වෙනස්කම් ජනතාවගේ ජීවන තත්ත්වය කෙරෙහි සෘජුව බලපානු ලැබේ. රටක මිල දර්ශකයේ හැසිරීම පරීක්ෂා කිරීම මඟින් සාමාන්‍ය මිල මට්ටමේ ප්‍රවණතාවයන් හඳුනාගත හැකිය. ඇතැම් මිල දර්ශක පාරිභෝගික භාණ්ඩ හා සේවාවල මිල මට්ටම මැනීමට භාවිතා වන අතර ඇතැම් ඒවා සමස්ත මිල මට්ටම මැනීමට භාවිතා වේ. මේ අනුව ප්‍රයෝජනයට ගත හැකි මිල දර්ශක කිහිපයකි.

01. පාරිභෝගික මිල දර්ශකය

02. තොග මිල දර්ශකය

03. දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

**පාරිභෝගික මිල දර්ශකය**

කිසියම් ජන කොටසක් වර්තමානයේදී පරිභෝජනය කරන භාණ්ඩ හා සේවා පැස කිසියම් පාද වර්ෂයකදී ලබා ගත් මිලටම ලබාගැනීම සඳහා දැරීමට සිදුවන වියදම ප්‍රතිශතයක් ලෙස පාරිභෝගික මිල දර්ශකය මඟින් නිරූපනය කෙරේ.

මේ සඳහා ලැස්පියර් දර්ශක අංක භාවිතා කෙරේ.

පාරිභෝගික මිල දර්ශකය $\underline{P_1Q_0}$ x100 $P_0Q_0$

$Q_0$ = පාදක වර්ෂයේදී මිලට ගෙන පරිභෝජනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය

$P_0$ = පාදක වර්ෂයේ මිල

$P_1$ = සලකා බලන වර්ෂයේ මිල

### තොග මිල දර්ශකය

දේශීය වශයෙන් නිෂ්පාදකයින් ලබන මිල ගණන් හා ආනයනය කරන භාණ්ඩ (පිරිවැය, රක්ෂණය, නැව් ගාස්තු සහ තීරුබදු ඇතුළත්ව) කිසියම් පාද වර්ෂයකදී ලබාගත් මිලටම ලබාගැනීම සඳහා දැරීමට සිදුවන වියදම ප්‍රතිශතයක් ලෙස තොග මිල දර්ශකයෙන් නිරූපනය කෙරේ.

### දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

කිසියම් වර්ෂයක රටක භාණ්ඩ හා සේවාවල නිමැවුමේ වර්තන වටිනාකම, එහි ස්ථාවර වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය නැත්නම් ආරෝපිත මිල දර්ශකය ලෙස දැක්වේ.

$$\text{ද.දේ.නි. අවධමනකය} = \frac{\text{අදාළ වර්ෂයේ වර්තන මිල යටතේ ද.දේ.නි.}}{\text{අදාළ වර්ෂයේ ස්ථාවර මිල යටතේ ද.දේ.නි.}} \times 100$$

(පාදක වර්ෂයේ මිල)

## 1.4 පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතීය දත්ත පදනම් කරගන්නා ලදී. ප්‍රධාන වශයෙන් මෙම අධ්‍යයනයේ අරමුණු ඉටු කරගැනීම සඳහා ව්‍යුහගත ප්‍රශ්න මාලාවක් මගින් ගෘහ ඒකක තොරතුරු ලබාගැනීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් පැවැත්වීම සිදුකරන ලද අතර එයින් ලබාගත් දත්ත සහ තොරතුරු ප්‍රාථමික දත්ත වශයෙන් භාවිතා කරන ලදී. ආහාර ද්‍රව්‍යය මිල ගණන්හි උපනතීන් පිළිබඳව විග්‍රහය සඳහා පාදක කරගන්නා ලද්දේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් ප්‍රකාශයට පත්කර ඇති දත්ත සහ තොරතුරු වේ. මීට අමතරව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කර ඇති වාර්තා, වෙනත් වාර්තා සහ අන්තර්ජාලයෙන් ලබාගන්නා ලද දත්ත සහ තොරතුරු මෙම අධ්‍යයනයේදී ද්විතීය දත්ත වශයෙන් භාවිතා කරන ලදී. ශ්‍රී ලංකාවේ මෑතකාලීන සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ සංක්ෂිප්ත විවරණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කර ඇති වාර්ෂික වාර්තා සහ වෙනත් වාර්තා පදනම් කරගනු ලැබිය. මෙම තොරතුරු ලබාගත් ක්‍රමවේදය පහත දැක්වේ.

## ගෘහ ඒකක සමීක්ෂණය

ගෘහ ඒකක ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා බහු පියවර – ස්ථර, සසම්භාවී නියැදි (Multi -stage Stratified Randam Sampling System ) මගින් ගෘහ ඒකක 250 නියැදියක් තෝරාගන්නා ලදී. අදාළ ගෘහ ඒකක 250 ග්‍රාමීය, නාගරික සහ වතු යන ස්ථර නියෝජනය කරයි. ප්‍රධාන නියැදියට අතිරේකව මෙම අධ්‍යයනයේදී ඉලක්කගත විශේෂිත නියැදි දෙකක්ද තෝරා ගන්නා ලදී. එය ධීවර ගම්මානයකින් සහ නාගරික පැල්පත්වාසීන් වෙසෙන ගම්මානයකින් සමන්විත වේ. එම විශේෂිත නියැදි දෙක සඳහා එක් ජන කොට්ඨාසයකින් ගෘහ ඒකක 25 බැගින් තෝරා ගන්නා ලදී. මෙම විශේෂිත නියැදි දෙකෙහි දත්ත සහ තොරතුරු විශ්ලේෂණය සඳහා සිද්ධි අධ්‍යයනයක් සිදු කරන ලද අතර එහි ප්‍රතිඵල සමස්ත නියැදියේ ප්‍රතිඵලවලින් කොතෙක් දුරට වෙනස් වන්නේ ද යන්න පරීක්ෂා කිරීම විශේෂිත නියැදි තෝරාගැනීමේ ප්‍රධාන අරමුණ විය.

සමීක්ෂණයට භාජනය වූ ප්‍රධාන නියැදිය දිවයිනේ පළාත් හයක් නියෝජනය කරයි. එම පළාත් තෝරා ගන්නා ලද්දේ සසම්භාවී නියැදි ක්‍රමවේදය අනුවය. එම පළාත් හය තුළින් සසම්භාවීව දිස්ත්‍රික්ක හයක් දෙවන පියවරේදී තෝරාගන්නා ලදී. එම දිස්ත්‍රික්ක හය තුළින් තුන්වන පියවර වශයෙන් නැවතත් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය බැගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හයක් සසම්භාවීව තෝරා ගනු ලැබිය. හතරවන පියවරේදී නියැදියට අදාළ ග්‍රාම නිලධාරි කොට්ඨාස 10 තෝරා ගනු ලැබුවේ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස නාම ලේඛනය සංගහනය ලෙස ගෙන එයින් සසම්භාවීව ග්‍රාම නිලධාරි කොට්ඨාස දෙක බැගින් (නුවරඑළිය සහ ඌවපරණගම හැර) ග්‍රාම නිලධාරි කොට්ඨාස 08ක් හා නුවරඑළිය සහ ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් ග්‍රාම නිලධාරි කොට්ඨාස 01 බැගින් (වතු ජනාවාසවල එක සමාන වෘත්තියක නියැලි ගෘහ ඒකක බැවින්) ග්‍රාම නිලධාරි කොට්ඨාස 02ක් වශයෙනි. තෝරා ගන්නා ලද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඡන්ද නාමලේඛනයේ ගෘහ ඒකක, සංගහනය ලෙස ගෙන සම්භාවිතා වගුව භාවිතා කරමින් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයකින් සසම්භාවීව ගෘහ ඒකක 25 බැගින් ගෙන ගෘහ ඒකක 250ක් පස්වන පියවරේදී තෝරා ගන්නා ලදී. විශේෂ නියැදිය සඳහා ප්‍රධාන නියැදිය තෝරා ගන්නා ලද දිස්ත්‍රික්ක දෙකකින් (හම්බන්තොට සහ ගම්පහ) ඉලක්කගත නියැදි දෙකක් තෝරා ගන්නා ලදී. තෝරාගන්නා ලද විශේෂ නියැදි දෙක සඳහා එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයකින් සසම්භාවීව ගෘහ ඒකක 25 බැගින් තෝරා ගනු ලැබිය. මෙම අධ්‍යයනයේදී ශ්‍රම බලකාය, යැපෙන්නන් සංඛ්‍යාව, ඒ ඒ ගෘහ ඒකකයේ ආහාර පරිභෝජන මට්ටම සහ ඒ ඒ ගෘහ ඒකකය විසින් මුහුණපාන අපහසුතාවයේ තීව්‍රතාවය යන විචල්‍යයන් විශ්ලේෂණය සඳහා භාවිතයට ගනු ලැබේ. ශ්‍රම බලකාය ලෙස ගෙන ඇත්තේ වයස අවුරුදු 10ට වැඩි හා අවුරුදු 60ට අඩු නියැදි ජනගහනය වේ. යැපෙන්නන් ලෙස වයස අවුරුදු 10ට අඩු සහ 59ට වැඩි නියැදි ජනගහනය ගනු ලැබිය. ඒ ඒ ගෘහ ඒකකයේ ආහාර පරිභෝජන මට්ටම තීරණය කරනු ලැබුවේ ලෝක ආහාර වැඩසටහන විසින් ගොඩනගන ලද ආකෘතියකට (modle) අනුවය. ඒ සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණ දිනට පෙර දින 07 තුළ ඒ ඒ ගෘහ ඒකකය විසින් පරිභෝජනයට ගනු ලැබූ ආහාර වර්ග සහ එම ආහාර ලබාගත් වාර ගණන පදනම් කරගනු ලැබිය. ඒ ඒ ගෘහ ඒකකය විසින් මුහුණපාන අපහසුතාවයේ තීව්‍රතාවය හඳුනාගැනීම සඳහා 2007 සහ 2008 වසර දෙකේදී මුහුණපාන ලද අපහසුතාවයන් 09 සම්බන්ධයෙන් අවධානය යොමු කළ අතර එහි දැඩි බව හඳුනාගැනීම අවස්ථා මට්ටම් හතරක් යටතේ එනම් දිනපතාම, බොහෝවිට, සමහරවිට සහ කලාතුරකින් ලෙස ගෙන ඒ සඳහා 4,3,2 සහ 1 වශයෙන් බර තැබීමක් ලබාදී ඒ ඒ අපහසුතාවයෙහි ඓක්‍යයෙහි සාමාන්‍ය ප්‍රතිශතයක් ලෙස ගෙන දර්ශකයක් ගොඩනගා ගන්නා ලදී.

වගු අංක 1.2 : ඒ ඒ පියවර අනුව ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා ප්‍රධාන නියැදිය තෝරාගැනීම

| I<br>පළාත | II<br>දිස්ත්‍රික්කය | III<br>ප්‍රා.ලේ.කො. | IV<br>ග්‍රා.නි.කො. | V<br>ගෘහ ඒකක<br>(සංඛ්‍යාව) |
|---|---|---|---|---|
| දකුණු පළාත | හම්බන්තොට | අම්බලන්තොට | රිදියගම | 25 |
| | | | මුලන | 25 |
| උතුරු මැද පළාත | අනුරාධපුර | නොච්චියාගම | නාවක්කුලම | 25 |
| | | | කුසුම්පුර | 25 |
| සබරගමු පළාත | රත්නපුර | පැල්මඩුල්ල | කුට්ටාපිටිය | 25 |
| | | | හල්පාවිල | 25 |
| බස්නාහිර පළාත | ගම්පහ | වත්තල | ඇවරියවත්ත | 25 |
| | | | වැලිසර | 25 |
| මධ්‍යම පළාත | නුවරඑළිය | නුවරඑළිය | පාක්වත්ත | 25 |
| ඌව පළාත | බදුල්ල | ඌවපරණගම | ගම්පහවත්ත | 25 |
| එකතුව | 06 | 06 | 10 | 250 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, (2006-2007).

වගු අංක 1.3 : ඒ ඒ පියවර අනුව ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා විශේෂ නියැදිය තෝරාගැනීම

| I<br>පළාත | II<br>දිස්ත්‍රික්කය | III<br>ප්‍රා.ලේ.කො. | IV<br>ග්‍රා.නි.කො. | V<br>ගෘහ ඒකක<br>(සංඛ්‍යාව) |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත | ගම්පහ | වත්තල | බලගල | 25 |
| දකුණු පළාත | හම්බන්තොට | අම්බලන්තොට | කළමැටිය | 25 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, (2006-2007).

## 1.5 අධ්‍යයනයේ සීමා


ක්ෂේත්‍ර සමීක්ෂණය ආරම්භ කරනු ලැබුවේ 2009 ජුනි මාසයේදීය. එබැවින් ආහාර ද්‍රව්‍ය මිල ඉහළ යාමේ බලපෑම අධ්‍යයන කිරීම සඳහා කඩිනම් විශ්ලේෂණ ක්‍රම භාවිතා කරන ලදී. හයදෙනෙකුගෙන් යුතු සමීක්ෂණ කණ්ඩායමක් මාස තුනකදී සමීක්ෂණ කටයුතු අවසන් කළයුතු විය. ප්‍රධාන ඉලක්කය වූයේ වර්ෂය අවසානය වනවිට නිශ්චිත කාලරාමුවක් යටතේ මෙහි ප්‍රතිඵල ප්‍රකාශනයක් මඟින් එළිදැක්වීමය. කාලය සහ මානව සම්පත් සීමාවන්ට යටත්ව වඩාත් තාත්වික තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රශ්නමාලාව සකස් කිරීම සිදු කෙරිණි. එම නිසා සත්‍ය ආදායම පිළිබඳ තොරතුරු ඇතුළත් නොකළ අතර ආදායමෙහි වෙනස්වීම් සහ ආදායම් මූලාශ්‍රය පිළිබඳ තොරතුරු පමණක් ඇතුළත් කරන ලදී. එමෙන් ම ගෘහ ඒකක විසින් පරිභෝජනය කරන නිශ්චිත ආහාර ප්‍රමාණය සහ එහි වටිනාකම සහ වියදම් පිළිබඳව විමසීමක් සිදු කලේ නැත. එහිදී පරිභෝජනය කරන ලද අත්‍යාවශ්‍ය ආහාර වර්ග සහ ඒවා පරිභෝජනයට ගත් වාර ගණන පිළිබඳව පමණක් විමසන ලදී. එම නිසා මෙම දත්ත ජීවන තත්ත්වයේ වෙනසක් ඇතිවී දැයි පරීක්ෂා කිරීමට ඉතා වැදගත් හා ප්‍රමාණවත් නමුත්, ගැඹුරු සංඛ්‍යානමය විශ්ලේෂණයන්

සඳහා ප්‍රමාණවත් නොවේ. ආදායම්, වියදම් සහ පරිභෝජනය ඉහළ යාම සම්බන්ධ පිළිතුරු මගින් ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ඉහළ යාම නිසා ජනතාව මුහුණපාන ලද අපහසුතා තක්සේරු කිරීම සිදුවිය. තවද පසුගිය වසර දෙකක මතකයන් අවදි කිරීම තුළින් ජීවන තත්ත්වයේ වෙනස් වීම් පිළිබඳව තොරතුරු ලබාගෙන ඒවා සාමාන්‍ය මිල ඉහළ යාම හෝ වාරිකව සිදුවන මිල ඉහළ යාමද යන්න නිශ්චය කිරීමට සිදුවිය.

## 1.6 වාර්තාවේ සැකැස්ම

අධ්‍යයනයේ කාලීන වැදගත්කම, න්‍යායාත්මක පසුබිම, අධ්‍යයන ක්‍රමවේදය සහ එහි සීමාවන් පළමු පරිච්ඡේදය මගින් ඉදිරිපත් කරන අතර මේ පිළිබඳව සිදුකර ඇති අධ්‍යයනයන් පිළිබඳ සාහිත්‍ය විමර්ශනය දෙවන පරිච්ඡේදය මගින් සිදුකෙරේ. තෙවැනි පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ මෑතකාලීන සාර්ව ආර්ථික ප්‍රවණතා සහ මිල මට්ටමේ හැසිරීම විශ්ලේෂණය කරනු ලැබේ. සිව්වැනි පරිච්ඡේදයේදී ආහාර මිල ගණන් ඉහළ යාමේ පීඩනයට මුහුණදීම සඳහා ඒ ඒ ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප උපායමාර්ග සාකච්ඡා කරනු ලැබිය. පස්වන පරිච්ඡේදයේදී ඒ ඒ අංශයේ ගෘහ ඒකකවල ආහාර පරිභෝජන රටාව, ආහාර පරිභෝජන මට්ටම හඳුනාගැනීම සහ ආහාර මිල ගණන් ඉහළ යාම ඔවුන්ගේ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් දක්වන බලපෑම විශ්ලේෂණය කරයි. ආහාර මිල ගණන් ඉහළ යාම හමුවේ ආහාර නිෂ්පාදනය ඉහළ දැමීම සම්බන්ධයෙන් ඒ ඒ ගෘහ ඒකක සතු ශක්‍යතාවය සහ ඒ සම්බන්ධ සීමාවන් විශ්ලේෂණය කිරීම හයවැනි පරිච්ඡේදයේදී සිදු කරයි. අවසාන වශයෙන් අධ්‍යයනයේ සොයාගැනීම්, ඵලඹෙන නිගමන සහ සුදුසු නිර්දේශ යෝජනා කිරීම හත්වැනි පරිච්ඡේදය මගින් ඉදිරිපත් කෙරේ.

රූපසටහන් අංක 1.1 : අධ්‍යයනය සඳහා තෝරාගත් නියැදි බලප්‍රදේශ



දෙවැනි පරිච්ඡේදය

# සාහිත්‍ය විමර්ශනය

## 2.1 හැඳින්වීම

දිගු කාලයකදී ඕනෑම රටක ජාතික නිමැවුමේ ඉහළ යාමක් සමඟ සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ යාමක් විද්‍යාමාන වීම සාමාන්‍ය ලක්ෂණයකි. ඒ අනුව ජාතික ආදායම මෙන්ම ඒක පුද්ගල ආදායම ඉහළ යාම නිසා සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ යාම රටක ජනතාවගේ ජන ජීවිතයට අයහපත් බලපෑමක් ඇති නොකරයි. එය සෑම රටකම ආර්ථිකයන් විසින් අපේක්ෂා කරනු ලබන්නකි. එසේ වුවද, කෙටිකාලයේදී සීමිත නිමැවුමක් පසුපස පාරිභෝගික ඉල්ලුම හඹායාම හේතුවෙන් සාමාන්‍ය මිල මට්ටමේ අසාමාන්‍ය ඉහළ යාම නිසා රටක ජනතාවගේ මිලට ගැනීමේ හැකියාව නැත්නම් ක්‍රයශක්තිය දුර්වල කරයි. එහි ආසන්නම බලපෑම මගින් ගෘහ ඒකක අයවැය පියවාගැනීමේ අපහසුතා ඇති කරයි. එම අපහසුතා හමුවේ එයට මුහුණදීම සඳහා ජනතාවට විකල්ප ප්‍රතිචාර උපක්‍රම (coping stategies) අනුගමනය කිරීමට සිදුවේ. එම උපක්‍රම ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම් ස්වරූපයක් ගනු ලබයි. එය ආහාර ද්‍රව්‍ය මිලට ගැනීම පදනම් කරගත සිදුවිය හැකිය. නොඑසේ නම් ආහාර නොවන ද්‍රව්‍ය මිලට ගැනීම පදනම් කරගෙන සිදුවිය හැකිය. එමෙන්ම එම කාර්යයන් දෙකම පදනම් කරගෙන සිදුවිය හැකිය. මෙම ප්‍රතිචාරය උපක්‍රම ගෘහ ඒකකයෙන් ඒකකයට වෙනස් වන අතර එහි බලපෑම ද ගෘහ ඒකකයෙන් ඒකකයට වෙනස් වේ. ශුද්ධ ආහාර මිලට ගන්නන් සඳහා එම ප්‍රතිචාර අයහපත් ලෙස බලපාන අතර ශුද්ධ ආහාර අලෙවි කරනන්නන් සඳහා යහපත් ලෙස බලපානු ලැබේ. මේ පිළිබඳව ප්‍රත්‍යක්ෂව මූල අධ්‍යයනයන් රාශියක් සිදු කර තිබේ. විශේෂයෙන්ම මේ පිළිබඳව මෑතකාලීනව අවධානය යොමුවූයේ 2007 සහ 2008 වසර දෙකේදී ගෝලීය වශයෙන් අසාමාන්‍ය ලෙස සාමාන්‍ය මිල මට්ටමේ ඉහළයාම හේතුවෙනි. මෙම අධ්‍යයනයන්වලදී ආහාර මිල ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන් ඒ ඒ ගෘහ ඒකකයන් විසින් භාවිතා කර ඇති විවිධ හැඩ ගැසීමේ උපක්‍රම සහ එය ඔවුන්ගේ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සම්බන්ධයෙන් දක්වන බලපෑම කෙරෙහි අවධානය යොමු කර තිබේ.

## 2.2 වෙනත් අධ්‍යයනයන් සහ සොයා ගැනීම්

### කාම්බෝජය

කාම්බෝජයේ CDRI (Cambodia's Leading Independent Development Policy Research Institute) ආයතනය 2008දී Impact of High Food Prices of Cambodia මැයෙන් ආහාර මිල ඉහළ යාම එහි ජනතාවට බලපා ඇති ආකාරය පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදී. එම අධ්‍යයනයේදී 2007 මාර්තු - ජුලි සහ 2008 මාර්තු - ජුලි යන වසරක කාලය තුළ මිල මට්ටම්හි ඉහළ යාමේ බලපෑම අධ්‍යයනය කර තිබේ. මෙම අධ්‍යයනයට අනුව අදාල වසරක කාලය තුළ කාම්බෝජයේ සහල් මිල ගණන් 100%කින් ඉහළ ගොස් තිබේ. මස් මිල ගණන් 50% - 70% පරාසය තුළ ඉහළ ගොස් ඇත. මාළු සහ එළවළු මිල ගණන් 20% - 30% පරාසය තුළ ඉහළ ගොස් තිබේ. එරට ජනතාවගෙන් 40%ක ජන කොට්ඨාසයක් තම ආදායමෙන් 70%ක් ආහාර සඳහා වැය කරයි. ආහාර මිල ගණන් ඉහළ යාම මගින් වඩාත්ම පීඩාවට පත්වී ඇත්තේ දිළිඳුම

ජනකොට්ඨාසයට අයත් ශුද්ධ ආහාර මිලට ගන්නන් වේ. සාමාන්‍යයෙන් ඔවුන් දක්නට ලැබෙනුයේ ග්‍රාමීය ප්‍රදේශවලය. ඉහළම ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇත්තේ Tonle Sap සහ Plains Regions යන පළාත්හි ගෘහ ඒකක වේ. දිළිඳුම ආන්තික ජනතාවද (marginal groups) ආහාර මිල ගණන් ඉහළ යාමෙහි අයහපත් බලපෑමට ලක්වී සිටිති. කාම්බෝජ ජනතාවගෙන් 20%ක් "එදාවේල සපුරා ගැනීම" සඳහා ඇමරිකා ඩොලර් 2-3 ක ප්‍රමාණයක් වියදම් කර සහල් සහ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලට ගනු ලැබේ. ලෝක ආහාර වැඩසටහනේ හඳුනාගැනීමට අනුව ජනගහනයෙන් 12%ක් වූ ගෘහ ඒකක සංඛ්‍යාවක් නැත්නම් දශ ලක්ෂ 1.7ක ජනසංඛ්‍යාවක් සමීක්ෂණය සිදු කරන ලද කාලය තුළදී ආහාර ද්‍රව්‍යයන්ගේ ඉහළ මිල ගණන් හේතුවෙන් ආහාර අනාරක්ෂිතභාවයට පත්වී සිටී. ජනතාවගෙන් 50%ක පමණ සංඛ්‍යාවක් නියෝජනය කරන ගෘහ ඒකක ආහාර මිල ගණන් ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන් ඔවුනගේ ආහාර වැය ශීර්ෂය අඩුකර තිබේ. එහි පීඩනය අවසාන වශයෙන් ඔවුන්ගේ පෝෂණය, මාතෘ සෞඛ්‍ය සහ ඉදිරි පරම්පරාවේ පෝෂණය හා සෞඛ්‍ය සම්බන්ධයෙන් අයහපත් ලෙස බලපානු ලැබේ. ආහාර අනාරක්ෂිතභාවයට පත්ව ඇති ගෘහ ඒකකවල ළමුන්ගේ පාසැල්යාම නවතා දැමීම ඉහළ අගයක් ගනු ලබන අතර 2008 ජනවාරි මාසයේදී එම සංඛ්‍යාව 13%ක් විය. 2008 ජුනි මාසය වනවිට එය 22% දක්වා ඉහළ ගොස් තිබේ. මේ අතර ධීවර ජනතාව ආහාර ද්‍රව්‍යයන්ගේ ඉහළ මිල ගණන් හේතුවෙන් වඩාත් පීඩාවට ලක්වී සිටී. දෙගුණ වූ ආහාර මිල ගණන් ධීවර ගෘහ ඒකක දිළිඳු බවේ පතුලට ඇද දමා තිබේ. මාළු අස්වැන්න අඩුවීම හේතුවෙන් ඔවුන්ගේ දෛනික සාමාන්‍ය ආදායම අඩුවී ඇති අතර දෛනික වියදම ඉහළ ගොස් ඇත. මාළු මිල ගණන් 20%කින් ඉහළ ගොස් තිබුණද එය ආහාර මිල ගණන් ඉහළ යාම හා සැසඳිය නොහැකිය. ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ඉහළ යාමට හැඩගැසීම සඳහා කාම්බෝජ ජනතාව ගනු ලැබූ ප්‍රතිචාර උපක්‍රම (coping strategies) ඇස්තමේන්තු කර තිබේ. ගෘහ ඒකකයන්ගෙන් 88%ක ජනගහනය 2008 මැයි මාසය වන විට අත්‍යාවශ්‍ය වියදම් පියවාගැනීමට නොහැකිවීම හේතුවෙන් පීඩාවට පත්ව සිටි බව වාර්තා වේ. නමුත් ඒ ඒ ගෘහ ඒකකයෙන් ඒකකයට පීඩාවට පත්ව ඇති තීව්‍රතාවයේ වෙනස්කම් දැකිය හැකිය. අධ්‍යයනය සඳහා භාජනය කළ නියැදියෙන් 53%ක් ආහාර මිල ඉහළ යාම නිසා පීඩාවට පත්වී ඇති බව වාර්තා වන අතර 27%ක් රෝග පීඩා හෝ සෞඛ්‍ය වියදම් හේතුවෙන් පීඩා විඳින බව වාර්තා කරයි. ඉහළ ඉන්ධන පිරිවැය හෝ ප්‍රවාහන පිරිවැය නිසා 25%ක් පීඩාවට පත්වී සිටී. ණය පියවා ගැනීමට නොහැකි වීම නිසා 19%ක් අපහසුතාවයට පත්වී ඇත. 2007 මැයි සිට 2008 මැයි දක්වා කාලය තුළ Phnom Penh සහ අනෙකුත් නාගරික ප්‍රදේශවල ගෘහ ඒකක තමන්ගේ අත්‍යාවශ්‍ය ආහාර මිලට ගැනීම සඳහා ප්‍රමාණවත් ආදායමක් නොමැතිවීම හේතුවෙන් පිළිවෙලින් 37% - 79% සහ 46% - 91% ආදී වශයෙන් පීඩාවට පත්ව සිටී.

බංගලාදේශය

ආහාර මිල ඉහළ යාම නිසා බංගලාදේශයේ පාසැල් ළමුන් සහ දිළිඳු ජනතාවට දක්වන බලපෑම පිළිබඳව එහි දිස්ත්‍රික්ක පහක නියැදියක් ආශ්‍රයෙන් (Impact of Food Price Rise on School Enrolment and Dropout in the Poor and Vulnerable Households in Selected Areas of Bangladesh, 2009) අධ්‍යයනයක් සිදුකර තිබේ. මෙහිදී 2008 ආරම්භක මාස කීපය තුළ සහල්, මාංශ බෝග සහ ආහාර පිළියෙළ කරගැනීමට ගන්නා තෙල් වර්ගවල මිල ඉහළ යාම පිළිබඳව අධ්‍යයනය කර තිබේ. පාසැල් ළමුන් සහ දිළිඳු ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වී ඇත. අධ්‍යයනයේ ප්‍රතිඵල වශයෙන් සහල් පරිභෝජනය සැලකිය යුතු ලෙස අඩුවීම හඳුනාගෙන ඇත. එමෙන් ම මාංශ බෝග සහ ආහාරයට ගන්නා තෙල් වර්ග පරිභෝජනය අඩුකර තිබේ.

තවද, සහල් නොවන වෙනත් පරිභෝජන භාණ්ඩ පරිභෝජනය අඩු කර තිබේ (Other non- rice food). එසේ ම ආහාර නොවන වියදම් අඩුකිරීම විශේෂයෙන්ම, ළමුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් බලපා ඇති අතර ග්‍රාමීය සහ නාගරික අංශයේ ළමුන් පාසැල් යැවීම පිළිවෙළින් 58% සහ 56% වශයෙන් නවතා ඇත. ඔවුන් නොයෙකුත් රැකියාවන් සඳහා යොමු කර තිබේ. මෙම අධ්‍යයනයේදී ඔවුන් පාසැල් යැවීම නිසා සිදුවන ආවස්ථික පිරිවැය ගණනය කර ඇත. ළමුන්ගේ පාසැල් යාම නවතා දැමීම නිසා පිළිවෙළින් නාගරික සහ ග්‍රාමීය අංශයේ මාසික වියදමින් 10% සහ 7% වශයෙන් ඉතිරි කරගත හැකිවී ඇති අතර විවිධ රැකියාවලට යොමු කිරීම නිසා ගෘහ ඒකකයේ මාසික ආදායම පිළිවෙළින් 10% සහ 11% වශයෙන් වැඩි කරගෙන ඇත. "ශුද්ධ ඉපැයීම්" (ඉතිරිකිරීම් සහ ආදායම) මාසිකව 25%ක් පමණ වේ. මිල ඉහළයාමට එරෙහිව විවිධ ප්‍රතිචාර උපක්‍රම භාවිතා කර ඇති අතර "වැඩි වශයෙන් ණය ලබාගැනීම" සිදුකර තිබේ. තවද, කාන්තා ගෘහමූලික ගෘහ ඒකකවල ළමයින් පාසැල් නොයවා ආදායම් ඉපැයීම සඳහා යැවීම මඟින් මාසික ආදායම 20%කින් වැඩි කරගත හැකිවී ඇති අතර පවුලේ වියදම 10% අඩු කරගත හැකිවී තිබේ. පුරුෂ ගෘහ මූලික ඒකකවල ළමයෙකු පාසැල් නොයැවීම නිසා මාසික වියදම 7.7%කින් අඩු කරගත හැකිවී ඇති අතර ඉපැයීම 11.2%කින් වැඩි කරගත හැකිවී තිබේ.

වගු අංක 2.1 : 2008 මුල් භාගයේහි සහල් මිල ඉහළයාම හේතුවෙන් පරිභෝජනයෙහි වෙනස්වීම (බංගලාදේශය)

| අංශය | ගෘහ ඒකකයක සහල් පරිභෝජනය (%) | | | | පරිභෝජනය අඩුවීමේ සාමාන්‍ය (%) | පරිභෝජනය අඩුවීමේ සාමාන්‍ය (සම්පූර්ණ නියැදිය සඳහා) | මිල ඉහළයාමේ සාමාන්‍ය (%) |
|---|---|---|---|---|---|---|---|
| | අඩුවීම | වෙ.නොවීම | වැඩිවීම | එකතුව | | | |
| ග්‍රාමීය | 25.1 | 67.7 | 7.2 | 100 | 21.58 | -3.00 | 50.65 |
| නාගරික | 18.5 | 73.8 | 7.7 | 100 | 22.79 | -2.00 | 51.85 |

මූලාශ්‍රය : Impact of Food Price Rise on School Enrolment and Dropout in the poor and valnerable Households in Selected Areas of Bangladesh, (2009).

වගු අංක 2.2 : 2008 මුල් භාගයේහි ආහාර සැකසීමට ගන්නා තෙල් වර්ගවල මිල ඉහළයාම පරිභෝජනයෙහි වෙනස්වීම (බංගලාදේශය)

| අංශය | ගෘහ ඒකකයක තෙල් වර්ග පරිභෝජනය (%) | | | | පරිභෝජනය අඩුවීමේ සාමාන්‍යය (%) | පරිභෝජනය අඩුවීමේ සාමාන්‍යය (සම්පූර්ණ නියැදිය සඳහා) | මිල ඉහළයාමේ සාමාන්‍යය (%) |
|---|---|---|---|---|---|---|---|
| | අඩුවීම | වෙනස් නොවීම | වැඩිවීම | එකතුව | | | |
| ග්‍රාමීය | 44.0 | 54.8 | 1.2 | 100 | 36.61 | -13.41 | 94.95 |
| නාගරික | 37.8 | 60.2 | 2.0 | 100 | 37.82 | -12.69 | 82.04 |

මූලාශ්‍රය : Impact of Food Price Rise on School Enrolment and Dropout in the poor and valnerable Households in Selected Areas of Bangladesh, (2009)

වගු අංක 2.3 : 2008 මුල් භාගයෙහි මාංශ බෝග වර්ගවල මිල ඉහළ යාම හේතුවෙන් පරිභෝජනයෙහි වෙනස්වීම (බංගලාදේශය)

| අංශය | ගෘහ ඒකකයක තෙල් වර්ග පරිභෝජනය (%) | | | | පරිභෝජනය අඩුවීමේ සාමාන්‍යය(%) | පරිභෝජනය අඩුවීමේ සාමාන්‍ය (සම්පූර්ණ නියැදිය සඳහා) | මිල ඉහළයාමේ සාමාන්‍යය (%) |
|---|---|---|---|---|---|---|---|
| | අඩුවීම | වෙනස් නොවීම | වැඩිවීම | එකතුව | | | |
| ග්‍රාමීය | 48.8 | 48.3 | 2.8 | 100 | 41.91 | 15.48 | 88.82 |
| නාගරික | 34.7 | 62.6 | 2.7 | 100 | 43.59 | 10.37 | 89.64 |

මූලාශ්‍රය : Impact of Food Price Rise on School Enrolment and Dropout in the poor and valnerable Households in Selected Areas of Bangladesh, (2009).

වගු අංක 2.4 : 2008 වසරේදී අලුතින් පාසැලට ඇතුළත් කිරීම සහ පාසැල් යාම නවතාදැමීම (බංගලාදේශය)

| අංශය | පිරිමි ළමයි | | | | ගැහැනු ළමයි | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පාසැල් වියේ මුළු ළමුන් සංඛ්‍යාව | සහභාගි වූ මුළු ළමුන් සංඛ්‍යාව (%) | පාසැල්යාම නවතා දැමූ සංඛ්‍යාව (%) | අලුතින් ඇතුළත් කළ ළමුන් සංඛ්‍යාව (%) | පාසැල් වියේ මුළු ළමුන් සංඛ්‍යාව | සහභාගි වූ මුළු ළමුන් සංඛ්‍යාව (%) | පාසැල් යාම නවතා දැමූ ප්‍රමාණය (%) | අලුතින් ඇතුළත් කළ ප්‍රමාණය (%) |
| ග්‍රාමීය | 626 | 38.82 | 55.27 | 5.91 | 636 | 40.64 | 58.81 | 0.56 |
| නාගරික | 485 | 41.65 | 52.78 | 5.57 | 549 | 43.29 | 56.10 | 0.61 |

මූලාශ්‍රය : Impact of Food Price Rise on School Enrolment and Dropout in the poor and valnerable Households in Selected Areas of Bangladesh, (2008).

## පකිස්ථානය

පාකිස්ථාන රජයේ ඉල්ලීමකට අනුව එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය විසින් ආහාර හා කෘෂිකර්ම සංවිධානය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ලෝක ආහාර වැඩසටහන, ලෝක සෞඛ්‍ය සංවිධානය සහයෝගය ඇතිව 2008 ජුනි 09 දා සිට ජුලි 13 දා දක්වා High Food Prices in Pakistan - Impact Assessment and the way Forward යන මැයෙන් අධ්‍යයනයක් සිදුකරන ලදී. එහි අරමුණ වූයේ ආහාර මිල ඉහළ යාම එහි ජනතාවට දක්වන බලපෑම ඇස්තමේන්තු කිරීමයි. එම අධ්‍යයනයේ සොයාගැනීම් වූයේ පකිස්තානයේ බස්නාහිර පළාතේ ඇෆ්ගනිස්ථාන මායිමේ සහ ආහාර නිෂ්පාදනය අඩු දිස්ත්‍රික්ක සඳහා ආහාර මිල ඉහළ යාම වැඩි වශයෙන් බලපා ඇති බවයි. ඒ අනුව මිලියන 7ක ජනතාවක් පීඩාවට පත්වී සිටී. ප්‍රධාන වශයෙන් ළමුන්ගේ අධ්‍යාපනය සඳහා මෙය අයහපත් ලෙස බලපා ඇති අතර පොදුවේ ජනජීවිතය සඳහා කම්පනයක් ඇති කර තිබේ. එහි ජනතාව ආහාර මිල ඉහළ යාමට ප්‍රතිචාර උපක්‍රම වශයෙන් ආහාර වියදම් අඩු කර ඇත. අසනීප සඳහා ප්‍රතිකාර ගැනීම මගහැරීම හේතුවෙන් අසනීපවීම

6% - 30% දක්වා ඉහළ ගොස් ඇත. එමෙන්ම ළමුන්ගේ පාසැල්යාම නවතාලීම සහ පසුගිය වර්ෂයේ අලුතින් ළමුන් පාසැල්වලට ඇතුළත් කිරීම පහළ යාම විශේෂයෙන් අවධානයට යොමු කළ යුතු කරුණකි. මෙය සහශ්‍ර ඉලක්ක ළඟා කරගැනීම සම්බන්ධයෙන් ගැටළු මතු කරයි. වයස අවුරුදු 5ට අඩු ළමුන්ගෙන් 38%ක් මන්දපෝෂණයෙන් පෙළෙති. එමෙන්ම උපතේදී මරණ අනුපාතය ඉහළ යාමට එය හේතු වේ (දහසකට 50කි). දිළිඳු ජනතාවගේ ආහාර, සෞඛ්‍ය සහ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔවුන්ගේ මුළු වියදමෙන් 70%ක් හෝ ඊට වැඩි වියදමක් දැරීමට සිදුවී තිබේ. ආහාර මිල ඉහළ යාම සෞඛ්‍ය ආරක්ෂාව සහ අධ්‍යාපන වියදම් අඩු කිරීමට හේතු වී ඇත. විශේෂයෙන්ම මෙය ගැහැනු ළමයින් සම්බන්ධයෙන් ඉතාම කණගාටුදායක වේ. ආහාර මිල ගණන් නාගරික සහ ග්‍රාමීය ගෘහ ඒකක සම්බන්ධයෙන් දක්වන බලපෑම වෙනස්වේ. ආදායම, ආහාර මූලාශ්‍ර, වියදම් රටාවේ වෙනස්කම් ඒ සඳහා හේතු වේ. ඒ වගේම ආහාර මිල ඉහළ යාමට දක්වන ප්‍රතිචාර උපක්‍රමද අංශයෙන් අංශයට වෙනස්වේ. දිළිඳු ජන කොට්ඨාසයේ ආහාර වියදම් වසර දෙකකට පෙර පැවති මට්ටමට සාපේක්ෂව 13% කින් ඉහළ ගොස් තිබේ. එසේ වුවද, පොහොසත්ම ජන කොට්ඨාසයේ ආහාර වියදම් ඉහළගොස් ඇත්තේ 5%කින් පමණි. ආහාර සඳහා වන වියදම් 2005/06ට සාපේක්ෂව 23%-28% දක්වා ඉහළ ගොස් ඇත.

## ශ්‍රී ලංකාව

ලෝක ආහාර වැඩසටහන මගින් 2007 අප්‍රේල් 15 – 30 දක්වා කාලය තුළ ද්විතීය දත්ත භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව තක්සේරු කිරීමක් (assessment) සිදු කර තිබේ. මෙම අධ්‍යයනය සඳහා සහභාගී වූ පර්යේෂණ කණ්ඩායම ආහාර හා කෘෂිකර්ම සංවිධානය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ලෝක ආහාර වැඩසටහන, ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සෙ.ගො.ප.පු. යන ආයතන සමඟ සම්පව කටයුතු කර ඇත. මෙම අධ්‍යයනයේදී ආහාර සුලභතාවය (food availability) ආහාර උපයෝජ්‍යතාවය (food accessibility) සහ ආහාර පරිහරණය (food utilisation) පිළිබඳව අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ ආහාර සුලභතාවය ප්‍රධාන වශයෙන් වී නිෂ්පාදන සහ අලෙවිය මත තීරණය වී ඇති අතර 2005-2006 කාලසීමාව තුළදී එහි සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර තිබේ. එසේ වුවද, දිවයිනෙහි ශුද්ධ සහල් සැපයුම ගෘහ ඒකක ඉල්ලුම සපුරාලීමට එය ප්‍රමාණවත් නොවේ. දෙවනුව පරිභෝජනය කරන අල වර්ග වැනි ද්විතීය ආහාර වර්ග නිෂ්පාදනය පහළ ගොස් ඇති අතර අතිරේක ආහාර ඉල්ලුම සපුරාගනු ලබන්නේ තිරිඟුපිටි ආනයනය මගිනි. සහලින් ස්වයංපෝෂිතභාවය පිළිබඳව දිස්ත්‍රික්ක අතර අසමානතාවයන් පවතී. අතිරික්ත වී නිෂ්පාදනයක් ඇති ප්‍රධාන දිස්ත්‍රික්ක කීපයක් පමණක් ඇත. එයින් උතුරුමැද පළාතේ ප්‍රදේශ කීපයක අර්බුධකාරී තත්ත්වය එහි නිෂ්පාදනය සඳහා බලපා තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් පළාත් අතර අතිරික්ත නිෂ්පාදන හුවමාරුවීම සීමාවී තිබේ. ලිබරල්වාදී වෙළෙඳපොළ ක්‍රමයක් තුළ වී සහ සහල් අලෙවිය වඩාත් තරඟකාරී විය යුතු නමුත් වෙළෙඳපොළ තොරතුරු සීමාවීම හේතුවෙන් සැපයුම් ක්‍රියාදාමය තනිවීම නිසා වෙළෙඳපොළට ප්‍රවේශවීමේ අවස්ථාවන්ට බාධා පැමිණ තිබේ. කීපදෙනෙකු පමණක් තම අලෙවි කටයුතු ඒකාබද්ධ කරමින් සැපයුම් ක්‍රියාදාමය හොඳින් සම්බන්ධීකරණය කරන අතර පුළුල් වූ වෙළෙඳපොළක් සඳහා ප්‍රවේශවීමට ඇති ඉඩප්‍රස්ථා සීමාවී ඇත. ඒ හෙයින් අතිරේක ඉල්ලුම සඳහා ප්‍රමාණවත් ප්‍රතිචාර නොලැබේ. මාතර, හම්බන්තොට, පුත්තලම, බදුල්ල, මොණරාගල, රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල ග්‍රාමීය ප්‍රදේශවල ඇති දුරස්ථභාවය, වෙළෙඳපොළ සඳහා ප්‍රවේශවීමට ඇති දුර්වල ඉඩප්‍රස්ථා සහ නිෂ්පාදන හිඟය ආහාර සුලභතාවය

සහ සැපයුම සම්බන්ධයෙන් සාකච්ඡා වන මාතෘකාවක් වී තිබේ. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල දුර්වල මාර්ග පද්ධතිය ආහාර සැපයුම සම්බන්ධයෙන් ප්‍රධාන සීමාවක් වී ඇත.

ආහාර මිල ඉහළ යාම සියළුම දිස්ත්‍රික්කවල දිළිඳු ජනතාවට ආහාර ලබාගැනීම සඳහා ප්‍රවේශ වීමට ඇති අවස්ථාව සීමාකරයි. ඉහළ ආහාර මිල ගණන් වාර්තා වන ප්‍රධාන දිස්ත්‍රික්ක වනුයේ යාපනය, මඩකලපුව, බදුල්ල, මොණරාගල, කළුතර, අම්පාර සහ මහනුවර වේ. දරිද්‍රතා සීමාවෙන් පහළ සහ එම සීමාවේ ජීවත්වන ජනතාව සඳහා ආහාර මිල ඉහළ යාම තදින්ම බලපානු ලැබේ. ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් බලපානු ලබන ඊළඟ වැදගත් සාධකය වන්නේ දිළිඳු බවයි. ශ්‍රම බලකායෙන් 25%ක් ඌනසේවා නියුක්තිකයන් වේ. නුපුහුණු ශ්‍රමිකයන්ගේ මූර්ත වැටුප් ඉතා ඉහළ ප්‍රතිශතයකින් පහළ ගොස් ඇති අතර එය 1978 පැවති මට්ටමට වඩා 40%කින් අඩුවී ඇත. මෙහි බලපෑම උතුරු-නැගෙනහිර පළාත්වලදී ඉහළ අගයක් ගනී. තවද, වතු ආශ්‍රිත ශ්‍රමිකයන්ගේ දිළිඳු බව ඉහළ මට්ටමක පවතී. බදුල්ල, හම්බන්තොට, කෑගල්ල, මාතර, මොණරාගල, පුත්තලම සහ රත්නපුර යන දිස්ත්‍රික්ක හතක දිළිඳු බවේ තීව්‍රතාවය (depth of poverty) 7% හෝ ඊට වඩා වැඩි මට්ටමක පවතී. උතුරු-නැගෙනහිර ගැටළු පවතින ප්‍රදේශවල දිළිඳුබවේ තීව්‍රතාවය ඉහත සඳහන් දිස්ත්‍රික්කවල මට්ටමට වඩා ඉහළය. දුර්වල මාර්ග පද්ධතිය සහ යටිතල පහසුකම් නොමැතිවීම නිසා වෙළෙඳපොළට ළඟාවීම සඳහා ඇති භෞතික අපහසුකම් ජනජීවිතයේ ක්‍රියාකාරකම් පහසුවෙන් පවත්වාගෙන යාම සඳහා සීමා පනවා තිබේ. ප්‍රධාන මාර්ගයට පිවිසීම සඳහා ඇති අපහසුකම් විශේෂයෙන්ම උතුරු-නැගෙනහිර සහ මධ්‍යම පළාත්වලදී දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතා අනුපාතය, උපතේදී ළමා මරණ අනුපාතය සහ මාතෘ අනුපාතය පහළ මට්ටමක පැවතියද මන්දපෝෂණය පිළිබඳ දර්ශක ඉහළ මට්ටමක පවතී. එය දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වන අතර ගැටුම් පවතින උතුරු-නැගෙනහිර සහ වතු ජනාවාසවලදී ඉහළ අගයක් ගනී. බීමට සහ පරිහරණයට සුදුසු ජලය ලබාගැනීමේ අපහසුව විශේෂයෙන්ම කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කවලදී වාර්තා වේ. පැල්පත් නිවාස ප්‍රතිශතය දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වේ. බස්නාහිර පළාතේ දිස්ත්‍රික්කවලදී ගෘහ ඒකකවලින් 95% සඳහා වැසිකිළි පහසුකම් ඇති නමුත් කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කවලදී එය 30%කි.

ඉන්දුනීසියාව

ඉන්දුනීසියානු රජයේ ඉල්ලීමකට අනුව ලෝක ආහාර වැඩසටහන මඟින් Monitoring the Impact of High Food Prices on Households in Vulnerable areas මැයෙන් පළාත් හතරක් ආවරණය වන පරිදි අධ්‍යයනයක් සිදුකරන ලදී. එහි ප්‍රතිඵල අනුව 2008 ජනවාරි සිට නොවැම්බර් දක්වා ඉන්දුනීසියාවේ ආහාර මිල ඉහළ යාම, ඉන්ධන සහ ප්‍රවාහන මිල ඉහළ යාම, ණය ලබාගැනීම සහ රකියා අහිමිවීම ප්‍රධාන කම්පනයන් ලෙස හඳුනාගෙන ඇත. විශේෂයෙන්ම ආහාර මිල ඉහළයාම දිළිඳු ජන කොට්ඨාසය සඳහා අතිරේක කම්පනයක් ඇති කර තිබේ. මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණය වට දෙකකින් පවත්වා ඇති අතර පහත සඳහන් ප්‍රතිඵල අනාවරණය කරගෙන ඇත. 2008 අගෝස්තු මාසයේදී ආහාර අනාරක්ෂිතභාවයට පත්ව ඇති ජන සංඛ්‍යාව ග්‍රාමීය ප්‍රදේශවලදී 22%, නාගරික 19% සහ ප්‍රධාන නගරවලදී 3% ලෙස ඇස්තමේන්තු කර තිබේ. එය ඔක්තෝබර්-නොවැම්බර් වන විට පිළිවෙළින් 29%,18% සහ 1% ක් විය. 2008

ඔක්තෝබර් වනවිට ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකකවලින් වැඩිම ප්‍රමාණයක් (34%) වාර්තා වන්නේ NTT (Nusa Tenggara Timur) දෙවනුව NTB (Nusa tenggara Barat) (24%) යන පළාත්වලය. ආහාර අනාරක්ෂිතභාවයට පත්ව ඇති ගෘහ ඒකක අතර කෘෂි නිෂ්පාදන අලෙවි කරන්නන් (ආහාර නිෂ්පාදන හෝ මුදල් බෝග, එළවළු, පලතුරු, සත්ව නිෂ්පාදන) පුහුණු සහ නුපුහුණු කෘෂි කම්කරුවන්, නුපුහුණු කෘෂිකාර්මික නොවන කම්කරුවන්, හෙක්ටයාර් 0.5කට වඩා අඩු ඉඩම් හිමි ගොවීන්, ආදායම් මූලාශ්‍ර 0-2 දක්වා වූ ගෘහ ඒකක, මිතුරන් නොමැති ගෘහ ඒකක ප්‍රධාන වේ. එමෙන් ම ආහාර අනාරක්ෂිතභාවය සඳහා බලපා ඇති ප්‍රධාන කරුණු හතරක් හඳුනාගෙන තිබේ.

01. කෘෂිකාර්මික ඉඩම් නොමැතිවීම හෝ සීමාවීම සහ ඉතා පහළ මට්ටමක වූ ප්‍රධාන ආහාර නිෂ්පාදනය.

02. විශාල වශයෙන් අනියම් කම්කරුවන් ප්‍රතිශතයක් නියෝජනය කරන බැවින් වෙළෙඳපොළ මත යැපීමට සිදුවීම.

03. කලාතුරකින් එමෙන්ම අස්ථිර පහළ දීමනා සහිත ආදායම් මාර්ග.

04. ආදායම් මූලාශ්‍ර එකක් හෝ දෙකක් මත විශ්වාසය තැබීමට සිදුවීම වේ.

## 2.3 සාරාංශය

අධ්‍යයනයන් සඳහා යොමු වූ සෑම රටකම දිළිඳු ජනතාව සඳහා ආහාර මිල ගණන් ඉහළ යාමේ බලපෑම මගින් දැඩි කම්පනයන් ඇති කර තිබේ. විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමයින්ගේ පෝෂණය හා සෞඛ්‍ය සම්බන්ධයෙන් බලපෑම් කර ඇත. ළමයින්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන්ද අයහපත් ලෙස බලපා තිබේ. එහි අවසාන ප්‍රතිඵලය වශයෙන් ඒ ඒ රටවලට සංවර්ධනය පිළිබඳ සහශ්‍ර ඉලක්ක සපුරා ගැනීම අභියෝගයට ලක්කර තිබේ.

තෙවැනි පරිච්ඡේදය

# මෑතකාලීන සාර්ව ආර්ථික වර්ධනයේ ප්‍රවණතා සහ මිල මට්ටමේ හැසිරීම

## 3.1 හැඳින්වීම

රටක ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අත්‍යාවශ්‍ය ප්‍රධාන සාධකය එම රටෙහි මූර්ත ජාතික නිෂ්පාදිතය ඉහළ නැංවීමයි. සෑම රටක් විසින්ම මෙම මූලික අභිමතාර්ථය සපුරා ගැනීම සඳහා කටයුතු කරයි. ඒ අතර රටෙහි සාමාන්‍ය මිල මට්ටම ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා අනෙකුත් සාර්ව ආර්ථික විචල්‍යයන් කළමනාකරණය කරනු ලැබේ. ඉහළ ආර්ථික වර්ධනයක් මගින් ඉහළ ආදායම් මට්ටම් ජනිත කරනු ලබන අතර ඒ මගින් පරිභෝජනය ඉහළ නංවනු ලබයි. ස්ථාවර භාණ්ඩ ප්‍රමාණයක් වෙනුවෙන් ඉහළ මිලක් ගෙවීමට සූදානම් වීම ඉල්ලුම ඉහළ යාමට හේතුවේ. එහි අවසාන ප්‍රතිඵලය වන්නේ සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ යාමයි. ශ්‍රී ලංකාව වැනි කුඩා ආර්ථිකයන් ඇති රටවල වෙළෙඳපොළ මිල තීරණය වීම කෙරෙහි දේශීය සීමාවන්ගෙන් ඔබ්බෙහි ඇති සාධකද බලපානු ලැබේ. ආහාර සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ මත යැපෙන රටවල් ශුද්ධ ආහාර මිලට ගන්නන් (net food buyers) ලෙස හැඳින්වේ. සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල් මෙම කාණ්ඩයට අයත් වන අතර ගෝලීය වශයෙන් එම සංඛ්‍යාව 55%කි (ලෝක ආහාර සංවිධානය, 2008). ශ්‍රී ලංකාවද මෙම කාණ්ඩයට අයත් වේ. ඒ අනුව ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි මිල ගණන්හි හැසිරීමද ශ්‍රී ලංකාවේ භාණ්ඩ මිල තීරණය වීම සඳහා සෘජුවම බලපානු ලබයි. මක්නිසාද යත්, ශ්‍රී ලංකාව වැනි කුඩා රටවල් මිල බාරගන්නෙකු (price taker) ලෙස ක්‍රියාත්මක වන හෙයිනි.

## 3.2 ශ්‍රී ලංකාවේ මෑතකාලීන සාර්ව ආර්ථික වර්ධනයේ ප්‍රවණතා

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය පිළිබඳ දත්තයන් අධ්‍යයනය කිරීමේදී එය 4%-5% අතර මට්ටමක පවත්වාගෙන ගොස් තිබේ. එම සංඛ්‍යාලේඛන සමඟ සැසඳීමේදී 2005-2008 කාලයේ මූර්ත ජාතික නිෂ්පාදිතය 6% හෝ ඊට ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට හැකිවීම විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. 2006 සහ 2007 යන වසරවල එය පිළිවෙලින් පසුගිය වසර හතරේ (2005-2008) සාමාන්‍යය වූ 6% මට්ටම ඉක්මවා 6.8% සහ 7.7% අගයක් දක්වා ඉහළ නංවා ගැනීමට හැකිවීම ආර්ථිකයේ කැපී පෙනෙන වර්ධනයක් ඇති කරගැනීමට ඉවහල් විය. ඒ සඳහා ආර්ථිකයේ උප ප්‍රධාන අංශයන්ගේ වර්ධනය කැපී පෙනෙන දායකත්වයක් සපයා තිබේ.

වගු අංක 3.1 : මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සහ උප ප්‍රධාන අංශයන්ගේ වර්ධනය ප්‍රතිශතයක් වශයෙන් (2001-2008)

| ජාතික සහ ආංශික සංයුතිය | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 |
|---|---|---|---|---|---|---|---|---|
| මූර්ත දළ ජාතික නිෂ්පාදනයේ වර්ධනය | -1.5 | 4.0 | 5.9 | 5.4 | 6.2 | 7.7 | 6.8 | 6.0 |
| කෘෂිකාර්මික අංශය | -3.4 | 2.5 | 1.5 | -0.3 | 1.5 | 4.7 | 3.3 | 7.5 |
| කාර්මික අංශය | -2.1 | 1.0 | 5.5 | 5.2 | 8.3 | 7.2 | 7.6 | 5.9 |
| සේවා අංශය | -0.5 | 6.1 | 7.7 | 7.6 | 6.4 | 8.3 | 7.1 | 5.6 |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහබැංකු වාර්ෂික වාර්තාව, (2008).

ආර්ථිකයේ මූර්ත දළ ජාතික නිෂ්පාදිතය 2005 සිට නොකඩවා 6.1% වඩා ඉහළ වර්ධන මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා සියළුම උප අංශයන්ගේ වර්ධනය හේතු වී ඇත. ඒ අතර, ස්වභාවික දේශගුණයේ සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ ඇති වූ අයහපත් බලපෑම නිසා ඇතැම් වසරවල වර්ධනය පහළයාම මෙන්ම මන්දගාමී වීමද සිදු විය. ඒ අනුව 2006 දී 7.7%ක් ලෙස වාර්තා කළ ඉහළ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය 2007 සහ 2008 වසරේදී පහළයාමේ ප්‍රවණතාවක් සනිටුහන් කළේය. ඒ සඳහා පාලනය කළ නොහැකි බාහිර වෙළෙඳපොළ සාධක මෙන්ම කෘෂිකාර්මික වර්ධනය අඩාල කිරීම සඳහා හේතු වූ ස්වභාවික සාධකද සෘජු ලෙස බලපාන ලදී.

කෘෂිකාර්මික අංශයේ වර්ධනය 2007 වසරේදී සැලකිය යුතු මට්ටමකින් පහළ යාම එම වර්ෂයේ සමස්ත වර්ධනය දුර්වල කිරීමට හේතු විය. කෘෂිකාර්මික අංශයේ වර්ධනයේ පහළ යාම සඳහා කෘෂිකාර්මික අංශය නියෝජනය කරන ප්‍රධාන බෝග දෙක එනම් වී සහ තේ නිෂ්පාදනය පහත වැටීම බලපාන ලදී. ඒ සඳහා අයහපත් කාලගුණික තත්ත්වය හේතු විය. තවද 2006 අවසාන භාගයේදී වතු කම්කරුවන්ගේ සෙමින් වැඩ කිරීමේ ව්‍යාපාරය (Go-slow Action) සහ 2007 මුල් භාගයේ පැවති නියඟ සහිත කාලගුණික තත්ත්වය තේ නිෂ්පාදනය අඩාල කිරීමට හේතු විය. අයහපත් කාලගුණික තත්ත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් 2006/07 මහ කන්නයේ සහ 2007 යල කන්නයේ වී නිෂ්පාදනය පිළිවෙළින් 7.7% සහ 4% වශයෙන් අඩු විය. ආරක්ෂක හේතූන් මත නැගෙනහිර පළාතේ ගොවි ජනතාවගේ අවතැන් වීම සහ 2006 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා පැවති අධික වර්ෂාව නිසා වගාව හානිවීමද නිෂ්පාදනයේ පහළ යාම සඳහා හේතු විය. ඊට අතිරේකව 2006 යල කන්නයේ වී නිෂ්පාදන මිලෙහි පහළ යාමද (කිලෝග්‍රෑම් එකක් රු.13.00-15.00) කෘෂිකාර්මික අංශයේ වර්ධනය පහළ යාමට හේතු විය. කෙසේ වෙතත් කෘෂිකාර්මික අංශයේ අනෙකුත් උප අංශ සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී.

කෘෂිකාර්මික අංශයේ වර්ධනය 2008 වසරේදී වාර්තාගත ඉහළ ගියේය. තේ නිෂ්පාදනය ඉතිහාසයේ යම් වසරක ප්‍රථම භාගයේ අත්පත් කරගත් විශිෂ්ටතම වර්ධනය (19%) සහ යල කන්නයේදී වී නිෂ්පාදනයේ ඉහළ අස්වැන්නක් ලබාගැනීමට හැකිවීම කෘෂිකාර්මික අංශයේ ඉහළ වර්ධනය සඳහා හේතු විය. වී නිෂ්පාදනයේ ඉහළ යාම සඳහා වී නිෂ්පාදන මිල ඉහළ මට්ටමක

පැවතීමත් නැගෙනහිර පළාත ත්‍රස්තවාදීන්ගෙන් නිදහස් කරගැනීම හා රජයේ දේශීය කෘෂි නිෂ්පාදනය ඉහළ නැංවීමේ "අපි වවමු – රට නගමු" ජාතික වැඩසටහනද හේතු විය. කෘෂිකාර්මික අංශයේ අනෙකුත් උප අංශද ඉහළ වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2008 තෙවන කාර්තුවේදී භාණ්ඩ "මිල බුබුල" පුපුරා යාමත් සමඟ සමස්ත වර්ධනය පහත වැටිණි.


කාර්මික අංශයේ වර්ධනයද 2005 සිට ඉහළ යාමක් වාර්තා කළ අතර 2007 වර්ෂයේ වර්ධනය 7.6% අගයක් සනිටුහන් කරන ලදී. එම වර්ධනය සඳහා එම අංශය යටතේ ඇති උප අංශයන්ගේ එනම් පතල් සහ කැනීම් නිෂ්පාදන, විදුලිබල, ගෑස්, ජලසම්පාදන සහ ඉදිකිරීම් අංශවල වර්ධනය හේතු විය. කර්මාන්ත නිෂ්පාදන අංශය මෙම උප අංශය තුළ ඇති ප්‍රධාන අංශය වන අතර එය 6.7%ක වර්ධනයක් වාර්තා කළේය. රෙදිපිළි ඇඟළුම් සහ සම්භාණ්ඩ නිෂ්පාදන අංශය කර්මාන්ත උප අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන දායකත්වයක් ලබාදෙන අතර එය සම්පූර්ණ අපනයන ආදායමෙන් 43%ක් නියෝජනය කළේය. එම අංශය 2007දී 8.3%ක වාර්තාගත වර්ධනයක් සටහන් කර ඇත. එසේ වුවද, 2008 වසරේදී කර්මාන්ත අංශයේ වර්ධනය 5.9% දක්වා සැලකිය යුතු ලෙස පහළ වැටිණි. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ගෝලීය ආර්ථිකයේ පසුබෑසීම නිසා ඇති වූ ඉල්ලුමේ පහළ යාමයි. එහි වර්ධනය වසරේ පළමු කාර්තු තුනේදීම 6% ක වර්ධන වේගයක් පවත්වා ගෙන යාමට සමත් වූ නමුත් හතරවන කාර්තුවේදී එහි වර්ධනය 5.2% දක්වා පහළ ගියේය. විදේශීය ඉල්ලුම අඩුවීම නිසා රෙදිපිළි ඇඟළුම් සහ සම්භාණ්ඩ අංශයේ වර්ධනය තියුණු මන්දගාමී බවක් දැක්විය.

පසුගිය වසර කීපයේදීම මෙන් 2007 සහ 2008 වසරවලදීද ආර්ථික වර්ධනයේ ප්‍රධාන දායකත්වය ගනු ලැබුවේ සේවා අංශයයි. කෙසේ වෙතත් එහි වර්ධනය 2006 දී 7.7%ක්ව තිබී 2007දී 7.1% දක්වා පහළ වැටිණි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් හෝටල් සහ ආපනශාලා අංශයේ පසු බෑසීම හේතු විය. තවද ගෝලීය ආර්ථිකයේ පසුබෑම තුළ ආනයන අපනයන වෙළෙඳාමේ මන්දගාමී වර්ධනයද ඒ සඳහා බලපෑවේය. තොග සහ සිල්ලර වෙළෙඳාම් උප අංශය 6.1%කින් වර්ධනය වූ අතර අපනයන වෙළෙඳාම් අංශය 8.8%කින් වර්ධනය වූයේය. හෝටල් සහ ආපනශාලා අංශයේ වර්ධනය සම්බන්ධයෙන් 2007 යහපත් වර්ෂයක් නොවීය. සංචාරක අංශයට ප්‍රබල අභියෝගයක් ලබාදෙමින් සංචාරකයින්ගේ පැමිණීම 11.7%කින් පහළ ගියේය. ඒ සඳහා දිවයිනේ පැවති අනාරක්ෂිතභාවය හේතු විය. මෙම ප්‍රවණතාව 2008දීද එලෙසම දක්නට ලැබුණු අතර හෝටල් සහ ආපනශාලා අංශය තවදුරටත් සංකෝචනය විය. සේවා අංශයේ වර්ධන ප්‍රවණතාව අඩුවීම සඳහා ගෝලීය ආර්ථික අවපාතය නිසා අපනයන වෙළෙඳාම් උප අංශයේ මන්දගාමී වර්ධනය දැඩිව බලපාන ලදී. දූරකථන ආවරණ ප්‍රදේශ පුළුල්වීම නිසා විදුලි සංදේශ අංශයේ වාර්තාගත වර්ධනයක් සනිටුහන් කළේය.

මූර්ත ජාතික නිෂ්පාදිතය ඉහළ යාමත් සමඟ ඇති වූ ජාතික ආදායමේ ප්‍රසාරණාත්මක බලපෑම අවම කිරීම සඳහා 2007 සහ 2008 වසර දෙක තුළදීම රජය දැඩි මුදල් පාලන ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. ඒ මඟින් ආර්ථිකයේ ද්‍රවශීලතාව පාලනය කිරීමට කටයුතු කරන ලදී. ඒ සඳහා සංචිත මුදල් අනුපාත ඉහළ දැමීම සහ වාණිජ බැංකු ණය සීමා කිරීම සඳහා කටයුතු කළේය. එමෙන් ම ආර්ථිකයේ අතිරික්ත ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා රජය විවිධ වෙළෙඳ කටයුතු සඳහා සෘජුව සහභාගී විය. ඒ තුළින් ඉහළ පොළී අනුපාතයක් පවත්වාගෙන යාමට

2007 සහ 2008 යන වසර දෙකේදීම කටයුතු කලේය. සංචිත මුදල් ඉලක්කගත මට්ටමේ පවත්වාගෙන යාම තුළින් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කිරීමට මහ බැංකුව සතු බිල්පත් අලෙවියෙන් හැකියාව ලැබිණි. ඒ මගින් පුළුල් මුදල් සැපයුම පාලනය කිරීම සඳහා 2007 සහ 2008 වසර දෙකේදීම දැඩි මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කලේය.

ප්‍රස්තාර අංක 3.1: ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සහ එහි ආංශික සංයුතිය (%)




මූලාශ්‍රයː ශ්‍රී ලංකා මහබැංකු වාර්තාව, (2007-2008).

## 3.3 සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ යාම

### 3.3.1 මිල දර්ශකයේ උපනතිය

2007 සහ 2008 යන දෙවසර තුළ ම ශ්‍රී ලංකාවේ පරිභෝජන සහ නිෂ්පාදන යන දෙයාකාරයේම මිල ගණන් සීඝ්‍ර ඉහළ යාමට මුහුණ දෙන ලදී. එය විශේෂයෙන්ම ආහාර, ඉන්ධන සහ නිෂ්පාදන යෙදවුම් වෙළෙඳපොළ සම්බන්ධයෙන් දෘෂ්‍යමාන විය. නව කොළඹ පාරිභෝගික මිල දර්ශක අගය 2007 සහ 2008 වසරවල පිළිවෙළින් ඒකක 26.3 සහ 23.7 ලෙස ඉහළ ගියේය. ඉහළ බර තැබීමක් ලබාදී ඇති (46.7%) ආහාර ද්‍රව්‍ය සඳහා වූ මිල දර්ශකය පිළිවෙළින් 36.3 සහ 25.7 වශයෙන් ඉහළ ගොස් තිබේ.

2007 සැප්තැම්බර් මාසයේදී ආහාර ද්‍රව්‍ය උප අංශය සඳහා වූ මිල දර්ශකය සියළුම පාරිභෝගික ද්‍රව්‍ය සඳහා වූ මිල දර්ශකය අභිබවා ඉහළ ගිය අතර එය නොකඩවා 2008 අවසානය දක්වාම ඉහළ මට්ටමක පැවතුණි. ආහාර ද්‍රව්‍ය උප අංශයෙහි මිල ඉහළ යාම ජාතික වශයෙන් සාමාන්‍ය


මිල මට්ටමේ ඉහළ යාම සඳහා ඉතා ඉහළ දායකත්වයක් ලබාදී ඇති අතර 2007 සහ 2008 යන වසර දෙකේදීම ඉහළ උද්ධමන තත්ත්වයක් පැවතීම සඳහාද හේතු විය. ඒ අනුව 2007 සහ 2008 යන වසර දෙකේදී පිළිවෙළින් 15.8% සහ 22.6% උද්ධමන තත්ත්වයක් වාර්තා කළේය.

වගු අංක 3.2 : කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2002=100)

| වර්ෂය | මාසය | සියළුම පාරි. ද්‍රව්‍ය (1) | ආහාරපාන (2) | සාපේක්ෂ දර්ශකය 1/2 |
|---|---|---|---|---|
| 2007 | ජනවාරි | 152 | 151 | 100 |
| | පෙබරවාරි | 155 | 152 | 98 |
| | මාර්තු | 155 | 151 | 98 |
| | අප්‍රේල් | 156 | 152 | 97 |
| | මැයි | 157 | 153 | 98 |
| | ජූනි | 161 | 159 | 99 |
| | ජූලි | 163 | 161 | 99 |
| | අගෝස්තු | 165 | 165 | 100 |
| | සැප්තැම්බර් | 167 | 168 | 101 |
| | ඔක්තෝබර් | 172 | 176 | 102 |
| | නොවැම්බර් | 176 | 185 | 105 |
| | දෙසැම්බර් | 178 | 187 | 105 |
| 2008 | ජනවාරි | 184 | 196 | 107 |
| | පෙබරවාරි | 189 | 204 | 108 |
| | මාර්තු | 192 | 207 | 108 |
| | අප්‍රේල් | 195 | 213 | 109 |
| | මැයි | 199 | 219 | 110 |
| | ජූනි | 206 | 222 | 108 |
| | ජූලි | 206 | 219 | 106 |
| | අගෝස්තු | 206 | 218 | 106 |
| | සැප්තැම්බර් | 207 | 217 | 105 |
| | ඔක්තෝබර් | 207 | 215 | 104 |
| | නොවැම්බර් | 205 | 215 | 105 |
| | දෙසැම්බර් | 204 | 216 | 106 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, (2006-2007).

ප්‍රස්තාර අංක 3.2 : කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2002=100)




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, (2006-2007).

අත්‍යාවශ්‍ය ආහාර කාණ්ඩයන්ගේ 2007 සහ 2008 වසරවල මිල මට්ටමේ ඉහළයාම ජන ජීවිතයේ යහපත් පැවැත්ම සම්බන්ධයෙන් පීඩනයක් ඇති කළේය. ප්‍රධාන ආහාර වර්ග කීපයක මිල ගණන්හි හැසිරීම කෙරෙහි අවධානය යොමු කිරීම මගින් එය පහසුවෙන් අවබෝධ කරගත හැකි වේ.

### 3.3.2 සහල් මිලෙහි හැසිරීම

ජනතාවගේ සෞඛ්‍යය යහපත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය දෛනික කැලරි ප්‍රමාණය ලබාදෙන ප්‍රධාන ආහාර මූලාශ්‍රය සහල්ය. එබැවින් 2007 සිට සහල් මිල මට්ටමේ හැසිරීම පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. ඒ අනුව සහල් මිල ගණන්හි හැසිරීම විශ්ලේෂණය කිරීමේදී තැම්බූ සහල් (සම්බා හා නාඩු) 2007 සාමාන්‍ය මිල සිට 2009 සාමාන්‍ය මිල 59%කින් හා කැකුළු සහල් (සුදු හා රතු) මිල ගණන් 51% කින් ඉහළ ගොස් තිබේ. එහි වාර්ෂික වැඩිවීම 2007 වසරේදී තැම්බූ සහල් සඳහා සාමාන්‍ය මිල රුපියල් 43.4 ක් වූ අතර, කැකුළු සහල් සඳහා සාමාන්‍ය මිල රුපියල් 40.8ක් විය. 2008දී එම වැඩිවීම පිළිවෙලින් 26%ක් හා 53%ක් ලෙස වාර්තා වේ (ඇමුණුම 1). 2006 වසරේ අවසන් භාගයේ පැවති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් 2006/2007 මහ කන්නයේ වී නිෂ්පාදනය 6.3%කින් පහළ යාම සහ වසරේ අවසන් භාගයේ පාන් සහ තිරිඟු පිටි මිල ඉහළ යාම මේ සඳහා හේතු විය. තිරිඟුපිටි මිල ඉතිහාසයේ

පළමු වතාවට සහල් මිල ගණන් අතිබවා ඉහළ යාම හේතුවෙන් එහි පරිභෝජනය සීමා වී සහල් වෙළෙඳපොලේ සහල් මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ යාමද මේ සඳහා හේතු විය. ගෝලීය වශයෙන් ඇති වූ නිෂ්පාදනයේ පහළයාම සහ ආරක්ෂක තොග තත්ත්වයේ පහළ වැටීම ජාත්‍යන්තර වෙළෙඳපොළ සහල් මිල ගණන් ඉහළ යාම සඳහා ඍජුවම බලපාන ලදී. එයට ප්‍රතිචාර වශයෙන් සහල් අපනයනය කරන රටවල් විසින් සහල් අපනයන තහනම් කරනු ලැබීම සහ ඒ සඳහා දැඩි සීමාවන් පැනවීමද සහල් මිල ගණන් ඉහළයාම සඳහා හේතු විය.

සහල් සිල්ලර මිල සම්බන්ධයෙන් රජය විසින් 2008 අප්‍රේල් 16 දින සිට පනවන ලද උපරිම මිල සීමා සහ 2008/2009 මහ කන්නයේ වී නිෂ්පාදනයේ ඉහළ යාම (මෙ.ටො.මිලියන 2.8) මගින් සහල් මිල ගණන් තවදුරටත් ඉහළ යාම පාලනය විය. එසේ වුවද, 2007 සාමාන්‍ය සහල් මිල ගණන් සමඟ සැසඳූ විට එය ආසන්න වශයෙන් 60% දක්වාද ඉහළ ගොස් තිබේ.

### 3.3.3 තිරිඟු පිටි සහ පාන් මිලෙහි හැසිරීම

සහල්වලට පමණක් දෙවැනි වී දෛනිකව ඉහළ කැලරි ප්‍රමාණයක් සපයාදෙන මෙන්ම ආහාර පරිභෝජනයේදී ප්‍රධාන ආහාරයක් වශයෙන් දෙවනුව වැදගත් වන තිරිඟු පිටි සහ පාන් මිල ගණන් 2007 සහ 2008 වසරවලදී සීඝ්‍රයෙන් ඉහළ ගියේය. තිරිඟු නිෂ්පාදනය කරනු ලබන රටවල ඇති වූ නියං තත්ත්වය සහ ආරක්ෂිත තොග ප්‍රමාණය පහළයාම ඒ සඳහා හේතු විය. 2006 වසරේ මිල ගණන් හා සැසඳීමේදී තිරිඟු පිටි සහ පාන් මිල ගණන් ආසන්න වශයෙන් දෙගුණ වී තිබේ.

### 3.3.4 අතිරේක ආහාර ද්‍රව්‍යයන්ගේ මිලෙහි හැසිරීම

වැඩි ප්‍රෝටීන ප්‍රතිශතයක් ලබාදෙන මාංශ බෝග ගණයෙහිලා සැලකෙන කව්පි, මුංඇට සහ රතු පරිප්පු අතිරේක ආහාර ද්‍රව්‍යයන් අතර ප්‍රධාන වේ. මෙම ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ගණන් 2007ට සාපේක්ෂව 2008 සහ 2009 කාලය තුළ පිළිවෙළින් 31%, 38% ලෙස ඉහළ ගොස් තිබේ. උපරිම මිල ඉහළ යාම සටහන් වන්නේ රතු පරිප්පු සඳහා වේ. විශේෂයෙන් ම ශ්‍රී ලංකාවට රතු පරිප්පු ආනයනය කරනු ලබන අතර මේ නිසාම ඒ සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ පවතින මිල ඉහළ යාම රතු පරිප්පු මිල දේශීය වශයෙන් ඉහළ යාමට බලපා ඇති බැව් කිව හැකිය.


වගු අංක 3.3 : ධාන්‍ය සහ මාංශ බෝග සඳහා වාර්ෂික සාමාන්‍ය සිල්ලර මිල

| ආහාර ද්‍රව්‍ය | 2007 | 2008 | 2007,2008 | 2009 | 2007,2009 |
|---|---|---|---|---|---|
| | සාමාන්‍යය මිල | සාමාන්‍යය මිල | සියයට % | සාමාන්‍යය මිල | සියයට % |
| තැම්බූ සහල් | 43 | 67 | 26 | 69 | 60 |
| කැකුළු සහල් | 41 | 63 | 53 | 62 | 51 |
| තිරිඟු පිටි | 51 | 73 | 43 | 70 | 37 |
| පාන් (ග්‍රෑම් 250) | 27 | 37 | 37 | 38 | 40 |
| මාංශ බෝග* | 116 | 152 | 31 | 161 | 38 |
| කුළුබඩු* | 113 | 128 | 13 | 131 | 15 |

මූලාශ්‍රය: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, (2009).

*මාංශ බෝග: කව්පි, මුංඇට සහ රතු පරිප්පු *කුළු බඩු: වියළි මිරිස්, රතු ළූනු සහ ලොකු ළූනු

ප්‍රස්තාර අංක 3.3 : සහල්, තිරිඟු පිටි, පාන්, මාංශ බෝග සහ කුළු බඩු මිල ගණන්හි වාර්ෂික සාමාන්‍යය




මූලාශ්‍රය: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, (2009).


* සටහන : 2009 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පමණි

වගු අංක 3.4 : ජාත්‍යන්තර ධාන්‍ය වෙළෙඳපොළ අපනයන මිල (ඇ.ඩො.ටොන් 1 සඳහා)

| වර්ෂය | මාසය | ඇමරිකා එක්සත් ජනපදය | | | ආර්ජන්ටිනාව | | තායිලන්තය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | තිරිඟු 1 | බඩඉරිඟු 2 | සෝගම් 2 | තිරිඟු | බඩඉරිඟු | සහල් 3 | සහල් 4 |
| 2007 | මාර්තු | 209 | 170 | 171 | 187 | 160 | 325 | 263 |
| | අප්‍රේල් | 209 | 170 | 171 | 187 | 160 | 322 | 256 |
| | මැයි | 203 | 159 | 155 | 219 | 147 | 325 | 352 |
| | ජූනි | 231 | 165 | 166 | 239 | 156 | 332 | 255 |
| | ජූලි | 250 | 146 | 157 | 249 | 141 | 337 | 261 |
| | අගෝස්තු | 276 | 152 | 171 | 273 | 156 | 335 | 269 |
| | සැප්තැම්බර් | 289 | 167 | 161 | 285 | 163 | 342 | 287 |
| | ඔක්තෝබර් | 318 | 170 | 171 | 288 | 167 | 345 | 301 |
| | නොවැම්බර් | 332 | 171 | 171 | 290 | 179 | 358 | 318 |
| | දෙසැම්බර් | 381 | 178 | 192 | 310 | 171 | 376 | 342 |
| 2008 | ජනවාරි | 381 | 266 | 192 | 330 | 199 | 385 | 365 |
| | පෙබරවාරි | 49 | 220 | 225 | 365 | 206 | 463 | 431 |
| | මාර්තු | 481 | 234 | 222 | 395 | 216 | 567 | 522 |
| | අප්‍රේල් | 389 | 248 | 233 | 377 | 228 | 848 | 720 |
| | මැයි | 346 | 242 | 243 | 342 | 207 | 963 | 770 |
| | ජූනි | 358 | 281 | 240 | 338 | 258 | 870 | 645 |
| | ජූලි | 343 | 272 | 268 | 317 | 254 | 837 | 590 |
| | අගෝස්තු | 341 | 227 | 236 | 301 | 215 | 712 | 538 |
| | සැප්තැම්බර් | 308 | 229 | 202 | 280 | 303 | 764 | 487 |
| | ඔක්තෝබර් | 252 | 181 | 208 | 235 | 169 | 683 | 385 |
| | නොවැම්බර් | 247 | 166 | 158 | 189 | 156 | 591 | 320 |
| | දෙසැම්බර් | 246 | 160 | 146 | 177 | 152 | 582 | 310 |


මූලාශ්‍රය: ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය, (2008).

ප්‍රස්තාර අංක 3.4 : ජාත්‍යන්තර වෙළෙඳපොළේ සහල් අපනයන මිල (ඇ.ඩො.-ටොන් 1 ක් සඳහා)




මූලාශ්‍රය: ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය, (2008).

ප්‍රස්තාර අංක 3.5 : ජාත්‍යන්තර වෙළෙඳපොළේ තිරිඟු, බඩඉරිඟු හා සෝගම් සඳහා අපනයන මිල (ඇ.ඩො.-ටොන් 1 ක් සඳහා)




මූලාශ්‍රය: ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය, (2008).

### 3.3.5 එළවළු සහ පළතුරු මිල ගණන්හි හැසිරීම

සෑම ජන කොට්ඨාසයක් සඳහාම පහසුවෙන් විටමින් ලබාදෙන ආහාර කාණ්ඩය වන්නේ එළවළු සහ පලතුරුයි. එළවළු සහ පලතුරු අවශ්‍යතාවයෙන් සම්පූර්ණ ප්‍රමාණයම (ආනයනික පලතුරු වර්ග කිහිපයක් හැර) දේශීය වශයෙන් සපුරා ගැනේ. 2007 සහ 2008 එළවළු සහ පලතුරු මිල ගණන්හි ඉහළයාමක් වාර්තා නොවේ. එසේ වුවද, කොළ එළවළු මිල ගණන්හි සීඝ්‍ර ඉහළ යාම නාගරික ගෘහ ඒකක සඳහා බලපා තිබේ. ඇතැම් මාසවලදී එළවළු මිල ගණන්හි සුළු ඉහළ යාමක් වාර්තා වී ඇති නමුත් ඒ සඳහා කාලීනව (seasonal) එළවළු සහ පලතුරු සැපයුමේ ඇතිවන සීමාවන් හේතු වී ඇත. අනෙක් අතට එළවළු සහ පලතුරු සඳහා යෙදවුම් පිරිවැය ඉහළයාමද ඒ සඳහා හේතු වී තිබේ.

වගු අංක 3.5 : අල වර්ග හා එළවළු ආහාරවල වාර්ෂික සාමාන්‍ය සිල්ලර මිල, 2007 – 2009 (රු.කි.ග්‍රෑ.)

| ආහාර වර්ගය | 2007 | 2008 | 2009 | 2007,2009 |
|---|---|---|---|---|
| | සාමාන්‍යය මිල | සාමාන්‍යය මිල | සාමාන්‍යය මිල | % |
| අල වර්ග* | 41 | 50 | 52 | 26 |
| අර්තාපල් | 81 | 84 | 99 | 22 |
| උඩරට එළවළු** | 75 | 91 | 85 | 13 |
| පහතරට එළවළු*** | 84 | 90 | 81 | -3.5 |
| (කොළ එළවළු මිටියක් සඳහා)*+ | 16 | 20 | 20 | 26 |

මූලාශ්‍රය: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, (2009).

*අලවර්ග (බතල සහ මඤ්ඤොක්කා)


**උඩරට එළවළු (බෝංචි, කැරට්, ලීක්ස්, බීට්, නෝකෝල්, රාබු, මාළුමිරිස් සහ ගෝවා)

***පහතරට එළවළු (බණ්ඩක්කා, වම්බටු, වට්ටක්කා, පිපිඤ්ඤා, කරවිල, පතෝල සහ මෑකරල්)

*+කොළ එළවළු (මුකුණුවැන්න සහ කන්කුන්)

+2009 සැප්තැම්බර් දක්වා

ප්‍රස්තාර අංක 3.6 : අල වර්ග හා එළවළු ආහාරවල වාර්ෂික සාමාන්‍යය සිල්ලර මිල (2007-2009)




මූලාශ්‍රයः හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, (2009).

## 3.3.6 පොල් සහ පොල්තෙල් මිල ගණන්හි හැසිරීම

මෙරට ජනතාව ආහාරයට ගන්නා තෙල් වර්ග අතර ප්‍රමුඛතාවය හිමි වන්නේ පොල් සහ පොල්තෙල් සඳහා වේ. 2007 අවසාන භාගයේ සහ 2008 මුල් භාගයේදී පොල් සහ පොල්තෙල් මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ ගියේය. ආහාර සැකසීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන තෙල් වර්ග සඳහා ආනයන බදු ඉහළ දැමීම ඒ සඳහා හේතු විය. එම තෙල් වර්ග සඳහා ආනයන බදු ඉහළ දැමීම හේතුවෙන් පොල්තෙල් සඳහා ඉල්ලුමේ පීඩනයක් ඇතිවීම නිසා පොල්තෙල් මිල ගණන් ඉහළ ගියේය. එය පොල් එළදාවෙන් බොහොමයක් පොල්තෙල් නිෂ්පාදනය කිරීම සඳහා යොමු වීමට හේතු විය. එහි අවසාන ප්‍රතිඵලය වූයේ වෙළෙඳපොළේ පැවති පොල් ගෙඩි ප්‍රමාණය පහත වැටීමයි. එය පොල් මිල ගණන් ඉහළ යාමට සෘජු ලෙස බලපාන ලදී. 2007 සහ 2008 වසරවලදී ඒ ඒ මාසයේ පොල් මිල ගණන්හි ඉහළ යාම කැපී පෙනෙන අගයක් ගනු ලැබිය (ඇමුණුම 1).


වගු අංක 3.6 : පොල් හා පොල්තෙල්වල සාමාන්‍යය සිල්ලර මිල (රුපියල්)

| ආහාර වර්ගය | 2007 | 2008 | 2009 | 2007,2009 |
|---|---|---|---|---|
| | සාමාන්‍ය මිල | සාමාන්‍ය මිල | සාමාන්‍ය මිල | % |
| පොල් ගෙඩියක් | 22 | 31 | 24 | 9 |
| පොල්තෙල් (750 මි.ලී.) | 123 | 175 | 180 | 46 |

මූලාශ්‍රය : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, (2009).

+සැප්තැම්බර් දක්වා

ප්‍රස්තාර අංක 3.7 : පොල් හා පොල්තෙල්වල සාමාන්‍යය සිල්ලර මිල (රුපියල්)




මූලාශ්‍රය: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, (2009).

### 3.3.7 මාළු, කරවල, බිත්තර සහ මස් මිල ගණන්හි හැසිරීම

ශ්‍රී ලාංකීය ගෘහ ඒකක මාසිකව පරිභෝජනය කරන මාළු, කරවල, බිත්තර සහ මස් යන ප්‍රධාන සත්ව ආහාර කාණ්ඩ සඳහා වෙන් කෙරෙන පරිභෝජන වියදමෙහි සමස්ත වටිනාකම සමස්ත ධාන්‍ය වටිනාකම ඉක්මවයි (17.86%). දිවයිනේ ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලන ප්‍රධාන මූලාශ්‍රයක් වශයෙන් මෙම ආහාර කාණ්ඩය වැදගත් වේ. එබැවින් සත්ව ආහාර මිල ගණන්හි ඉහළ යාම සෑම ජන කොට්ඨාසයකම ජන ජීවිත යහපත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අයහපත් ලෙස බලපානු ලැබේ. 2007 සාපේක්ෂව 2008 සහ 2009 වසරවල සාමාන්‍ය මාළු මිල ගණන් ඉහළ යාම වාර්තා වන්නේ කුඩා මාළු (සාලයා හා හුරුල්ලා) සම්බන්ධයෙනි. එය පිළිවෙලින් 19% සහ 31%ක් ලෙස වාර්තා වේ. ජනගහනයේ පහළම ආදායම් කාණ්ඩයන්ගේ ජනතාවගෙන් වැඩි ප්‍රතිශතයක් කුඩා මාළු වර්ග පරිභෝජනය කරන බැවින්, ඒවායේ මිල ගණන් ඉහළ යාම ඔවුන්ගේ ජන ජීවිතයට දැඩි ලෙස බලපෑම් එල්ල කරනු ලැබේ. එසේම බිත්තර මිල ගණන් 2007ට සාපේක්ෂව 2008 සහ 2009 වසරවලදී පිළිවෙලින් 12% සිට 25%ක් දක්වා ඉහළ ගොස් ඇත. ප්‍රෝටීන් ලබාගන්නා ඊළඟ වැදගත් මූලාශ්‍රය වනුයේ මාළු පරිභෝජනයයි. මෙහිදී සලකා බලනු ලබන මාළු වර්ග පහක 2007ට සාපේක්ෂව 2008 සහ 2009 මිල ගණන් පිළිවෙලින් 16%කින් හා 26%කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම සත්ව ආහාර මිල ගණන්හි හැසිරීම වගු අංක 3.7 මගින් පැහැදිලි වේ.

වගු අංක 3.7 : සත්ව ආහාරවල වාර්ෂික සාමාන්‍යය මිල (රු.කි.ග්‍රෑ.)


| සත්ව ආහාර වර්ගය | 2007 | 2008 | 2007,2008 | 2009 | 2007,2009 |
|---|---|---|---|---|---|
| | සාමාන්‍යය මිල (රු.කි.ග්‍රෑ.) | සාමාන්‍යය මිල (රු.කි.ග්‍රෑ.) | සියයට % | සාමාන්‍යය මිල (රු.කි.ග්‍රෑ.) | % |
| කුඩා මාළු* | 166 | 198 | 19 | 218 | 31 |
| ලොකු මාළු** | 439 | 513 | 16 | 542 | 23 |
| හරක් මස් | 300 | 352 | 17 | 385 | 28 |
| කුකුල් මස් (බ්‍රොයිලර් හා කරි වර්ගය) | 291 | 327 | 12 | 341 | 17 |
| බිත්තර*** (රු.එකක් සඳහා) | 8 | 9 | 12 | 10 | 25 |

මූලාශ්‍රය : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, (2009).

*කුඩා මාළු (සාලායා සහ හුරුල්ලා) **ලොකු මාළු (බලයා,කෙලවල්ල, තෝරා, මෝරා, පරව් සහ තලපත්)

*** බිත්තර (දුඹුරු සහ සුදු)+ 2009 සැප්තැම්බර් දක්වා

ප්‍රස්තාර අංක 3.8 : සත්ව ආහාරවල වාර්ෂික සාමාන්‍යය මිල (රු.කි.ග්‍රෑ.)




මූලාශ්‍රය: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, (2009).

වගු අංක 3.8 : ශ්‍රී ලංකාවේ ඒ ඒ අංශයේ ආහාර පරිභෝජනයේ මාසික සාමාන්‍ය වියදම (%)

| ආහාර කාණ්ඩය | ශ්‍රී ලංකාව | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය |
|---|---|---|---|---|
| ධාන්‍ය | 16.07 | 11.18 | 16.39 | 29.78 |
| පිටතින් ලබාගත් ආහාර | 11.94 | 17.19 | 11.06 | 6.38 |
| මාංශ භෝග | 3.51 | 2.72 | 3.62 | 4.90 |
| එළවළු/කොළ එළවළු | 8.41 | 6.84 | 8.75 | 8.79 |
| අල වර්ග | 2.42 | 1.71 | 2.57 | 2.52 |
| මස් | 4.23 | 6.14 | 3.85 | 3.34 |
| මාළු | 8.61 | 11.34 | 8.26 | 3.99 |
| කරවල | 4.03 | 2.53 | 4.45 | 2.80 |
| බිත්තර | 0.99 | 1.00 | 0.98 | 1.08 |
| පොල් | 5.47 | 4.45 | 5.73 | 4.95 |
| කුළුබඩු | 9.30 | 8.81 | 9.40 | 9.47 |
| ටින්/බෝතල්/පැකට් වශයෙන් සැකසූ | 0.30 | 0.46 | 0.27 | 0.09 |
| කිරි සහ කිරි ආහාර | 8.72 | 9.63 | 8.55 | 8.20 |
| තෙල් සහ මේද | 2.16 | 1.96 | 2.16 | 2.92 |
| සීනි/හකුරු සහ පැණිරස කෑම | 3.76 | 3.15 | 3.91 | 3.57 |
| පලතුරු | 3.40 | 3.96 | 3.38 | 1.57 |
| පැණිබීම සහ කෙටි කෑම | 3.53 | 3.83 | 3.54 | 2.32 |
| බීමවර්ග (මධ්‍යසාර) | 3.14 | 3.09 | 3.14 | 3.34 |
| එකතුව | 100 | 100 | 100 | 100 |

මූලාශ්‍රය: ගෘහ ඒකක ආදායම් සහ වියදම් පිළිබඳ සමීක්ෂණය, (2006/2007).

### 3.3.8 කිරිපිටි සහ සීනි මිලෙහි හැසිරීම

මෙම ප්‍රධාන ආහාර වර්ගවලට අතිරේකව කිරිපිටි සහ සීනි මිල ගණන් ජන ජීවිතයට තදින්ම බලපෑම් කරනු ලැබේ. 2006/2007 ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණයට අනුව මාසිකව පරිභෝජනය කරනු ලබන කිරි සහ කිරි ආහාරවල වටිනාකම 9%කි. සීනි සඳහා එහි අගය 3.76%ක් වේ. දේශීය කිරි අවශ්‍යතාවයෙන් 80%ක්ම සපුරාගනු ලබන්නේ ආනයනය කරනු ලබන කිරිපිටි පරිභෝජනයෙනි. දේශීය වෙළෙඳපොළේ කිරිපිටි මිල ගණන් 2007 සහ 2008 වසරවල සීඝ්‍රයෙන් ඉහළගිය අතර 2006 පැවති මිල හා සැසඳීමේදී එය ආසන්න වශයෙන් දෙගුණ වී තිබේ. මෙය විශේෂයෙන්ම කුඩා ළමයින්ගේ පෝෂණය සම්බන්ධයෙන් දැඩිව බලපානු ලැබේ. අනෙකුත් ආහාර ද්‍රව්‍ය මිල ඉහළයාම හා සසඳන විට 2007 සහ 2008 වසරවල සීනි මිල ගණන් ඉහළ ගොස් ඇත්තේ සුළු ප්‍රතිශතයකිනි. 2006ට සාපේක්ෂව 2007දී සීනි මිල ගණන් අඩුවී ඇති අතර 2008 වසරේදී එහි සුළු ඉහළ යාමක් වාර්තා කරයි. එසේ වුවද 2009 වසරේදී සීනි මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ ගියේය. දේශීය සීනි අවශ්‍යතාවයෙන් 80%ක් පමණ ආනයනය මගින් සපුරා ගන්නා අතර ජාත්‍යන්තර වෙළෙඳපොළේ මිල හැසිරීම අනුව දේශීය මිල ගණන් තීරණය වේ.


වගු අංක 3.9 : කිරිපිටි හා සීනිවල සාමාන්‍ය වාර්ෂික මිල (රු.කි.ග්‍රෑ.)

| ආහාර වර්ගය | 2007 | 2008 | 2007,2008 | 2009 | 2007,2009 |
|---|---|---|---|---|---|
| | සාමාන්‍ය මිල | සාමාන්‍ය මිල | සියයට % | සාමාන්‍ය මිල | සියයට % |
| කිරිපිටි* (400 ග්‍රෑම්) | 186 | 270 | 45 | 251 | 35 |
| සීනි (කි.ග්‍රෑම්) | 53 | 63 | 18 | 78 | 47 |

මූලාශ්‍රය : ගෘහ ඒකක ආදායම් සහ වියදම් පිළිබඳ සමීක්ෂණය, (2006/2007).

කිරිපිටි (400 ග්‍රෑම්) ලක්ස්ප්‍රේ සහ ඇන්කර් + 2009 සැප්තැම්බර් දක්වා

ප්‍රස්තාර අංක 3.9 : කිරිපිටි හා සීනිවල සාමාන්‍ය වාර්ෂික මිල (රුපියල්)




මූලාශ්‍රය: ගෘහ ඒකකවල ආදායම් සහ වියදම් පිළිබඳ සමීක්ෂණය, (2006-2007).

### 3.3.9 සාරාංශය

දෛනික ජන ජීවිතයට අත්‍යාවශ්‍ය සෑම ආහාර ද්‍රව්‍යකම (උඩරට සහ පහතරට එළවළු හැර) මිල ගණන් ඉතා ඉහළ ප්‍රතිශතයකින් ඉහළ ගොස් තිබේ. සහල්, තිරිඟු පිටි නිෂ්පාදන සහ කිරිපිටි වැනි අත්‍යාවශ්‍ය නිෂ්පාදනයන්ගේ මිල දෙගුණයකින් පමණ ඉහළ ගොස් තිබේ. ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ගණන් ඉහළ යාම සහ දේශීය නිෂ්පාදනය ඉල්ලුම සපුරාලීමට තරම් ප්‍රමාණවත් නොවීම ඒ සඳහා හේතුවී ඇත. කෘෂි යෙදවුම් ඉහළ යාම සහ දේශගුණයේ ඇති වූ අනපේක්ෂිත විපර්යාසයන් දේශීය නිෂ්පාදනවල මිල ඉහළ යාමට හේතු වී තිබේ.

සිව් වැනි පරිච්ඡේදය

# ආහාර මිල ඉහළ යාම නිසා උද්ගතවන ගැටළු හා ඒ ඒ ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප උපාය මාර්ග

## 4.1 හැඳින්වීම

අත්‍යාවශ්‍ය ආහාර මිල ඉහළ යාම නිසා පාරිභෝගිකයින්ගේ මිලට ගැනීමේ ශක්තිය (ක්‍රය ශක්තිය) පහළ යාමත් සමඟ මූර්ත වශයෙන් ඔවුන් මිලට ගනු ලබන ආහාර ද්‍රව්‍ය ප්‍රමාණය පහළ යයි. එබැවින් ගෘහස්ථ මට්ටමේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරගැනීම සඳහා එයට ප්‍රතිචාර වශයෙන් ඒ ඒ අංශයේ ගෘහ ඒකක විසින් විකල්ප උපායමාර්ගික යාන්ත්‍රණයක් (coping machanism) අනුගමනය කරනු ලැබේ. එම උපායමාර්ග ප්‍රධාන වශයෙන් ස්වරූප දෙකකි.

01. සෘජු උපායමාර්ග

02. වක්‍ර උපායමාර්ග

සෘජු උපාය මාර්ගවලදී ආහාර පරිභෝජනයේ ප්‍රමාණය සහ ප්‍රමිතිය පහළ යන අතර වක්‍ර උපාය මාර්ගවලදී ආහාර පරිභෝජනය වෙනුවෙන් පවතින වෙනත් වත්කම් පහළයාමෙන් ඔවුන්ගේ සමස්ත ජීවන මට්ටම පහළ වැටේ.

## 4.2 ගෘහ ඒකක මුහුණපාන ලද ප්‍රධාන අපහසුතා

පසුගිය වසර දෙකක කාලය තුළ ඒ ඒ ගෘහ ඒකකයන් විසින් මුහුණපාන ලද ප්‍රධාන අපහසුතාවයන් පිළිබඳ තොරතුරුවලට අනුව සමස්ත නියැදියෙන් 73%ක් විවිධ අපහසුතාවයන්ට මුහුණ පා සිටී. එම අපහසුතාවයන්ගේ ප්‍රමුඛතාව සැලකීමේදී ආහාර මිල ඉහළ යාම ප්‍රමුඛතම අපහසුතාවය බව හඳුනා ගැනීමට හැකිවිය. එහි සාමාන්‍ය සංඛ්‍යාතය 29% ක් විය. දෙවෙනි අපහසුතාවය වන්නේ අසනීපවීම සහ සෞඛ්‍ය වියදම් අධික වීමයි (29%).

ගෘහ ඒකකයන් මුහුණපාන ලද අපහසුතාවයන් ආංශික වශයෙන් විශ්ලේෂණය කිරීමේදී ඒ පිළිබඳ සංඛ්‍යාතයන් ඇතැම් අංශ සම්බන්ධයෙන් සමස්ත නියැදියේ සංඛ්‍යාතයට වඩා වැඩි අගයක් ගනු ලැබේ. උදාහරණ වශයෙන් වතු අංශයේ සහ නාගරික පැල්පත් ගෘහ ඒකක සඳහා ආහාර මිල ඉහළ යාම නිසා ඇතිවන අපහසුතාවය පිළිවෙළින් 58% සහ 39% වශයෙන් සාපේක්ෂව ඉහළ අගයක් ගනු ලැබේ. අනෙක් අතට, ඇතැම් අංශවල ගෘහ ඒකක අපහසුතාවයන්ගේ ප්‍රමුඛතාවයද සමස්ත නියැදියේ ප්‍රමුඛතාවයන්ට වඩා වෙනස් වේ. උදාහරණ ලෙස ග්‍රාමීය අංශයේ ගෘහ ඒකක මුහුණපාන ලද ප්‍රමුඛතම අපහසුතාවය අසනීපවීම සහ සෞඛ්‍ය වියදම් අධික වීම වන අතර ධීවර ගෘහ ඒකකවල ප්‍රමුඛතම අපහසුතාවය රැකියාවේ නියුතු දින ගණන අඩුවීම බව හඳුනා ගත හැකි විය. සමීක්ෂණය සිදුකරන ලද කාලයේදී මාළු අස්වනු අවාරය පැවතීම රැකියාවේ නියුතු දින ගණන අඩුවීම සඳහා හේතු වී තිබේ. කෙසේ නමුත්,

වාරිකව (seasonal) මෙම තත්ත්වය වෙනස්වන බව ඔවුන්ගේ තොරතුරු අනුව අනාවරණය විය. එනම් මාළු අස්වනු වාරයේදී වැඩි දින ගණනක් රැකියාවේ නියුතුවීමට අවස්ථාව සැලසෙන බව අනාවරණය වූ අතර ඒ අනුව වාරිකව ඔවුන්ගේ අපහසුතාවයන්ගේ ප්‍රමුඛතාවය මෙන්ම දැඩි බවද (severaty) වෙනස් වේ. ග්‍රාමීය අංශය සම්බන්ධයෙන්ද මෙම ස්වරූපය දක්නට ලැබේ. ප්‍රධාන නිෂ්පාදන වාරයන්හි (මහ සහ යල) අස්වනු නෙළන කාලවලදී ඔවුන්ගේ අපහසුතාවයන්ගේ ප්‍රමුඛතාව මෙන්ම එහි දැඩි බවද වෙනස් වේ.

වගු අංක 4.1 : සමස්ත ගෘහ ඒකක මුහුණපා ඇති අපහසුතාවයන්ගේ සාමාන්‍යය (%)

| අපහසුතාව | නාගරික | ග්‍රාමීය | වතු අංශය | සමස්ත නියැදිය |
|---|---|---|---|---|
| 1. ආහාර මිල ඉහළ යාම | 30 | 24 | 58 | 32.0 |
| 2. අසනීපවීම්/සෞඛ්‍ය වියදම් අධිකවීම | 20 | 34 | 23 | 29.0 |
| 3. ගෘහ ඒකක සාමාජික මරණ/අවමඟුල් උත්සව | 18 | 17 | 13 | 16.0 |
| 4. වැටුප් අඩුවීම/රැකියාවේ යෙදෙන දින ගණන අඩුවීම | 10 | 12 | 6 | 11.0 |
| 5. ණය පියවීම | 18 | 9 | 0 | 5.0 |
| 6. ආරක්ෂාව/සොරබිය | 0 | 3 | 0 | 2.0 |
| 7. අයහපත් කාලගුණය | 0 | 3 | 0 | 2.0 |
| 8. විදුලිය/ගෑස් මිල අධික වීම | 3 | 0 | 0 | 1.0 |
| 9. වෙනත් කම්පන | 5 | 2 | 0 | 2.0 |
| 10. එකතුව | 100 | 100 | 100 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 4.3 ඒ ඒ ගෘහ ඒකක ආහාර මිල ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන් ගනු ලබන විකල්ප ක්‍රියාමාර්ග

මෙම අධ්‍යයනයේ එක් අරමුණක් වන්නේ ආහාර මිල ඉහළ යාම නිසා ඇති වන අපහසුතාවය හමුවේ එයට හැඩගැසීම සඳහා ඒ ඒ අංශයේ ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප වූ උපක්‍රම හඳුනා ගැනීමයි. ඒ සඳහා ගෘහ ඒකක විසින් අනුගමනය කෙරේ යයි උපකල්පනය කරනු ලැබූ විකල්ප උපක්‍රම 19ක් මත මෙම අධ්‍යයනයේදී තොරතුරු එක්රැස් කරන ලදී. එම තොරතුරු ඒ ඒ ගෘහ ඒකක මුහුණපාන අපහසුතාවයේ දැඩි බව අනුව වෙනස්වන අතර එය සනාථ කිරීම සඳහා දිනපතාම, බොහෝවිට, සමහරවිට සහ කලාතුරකින් ආදී වශයෙන් මට්ටම් හතරක් යටතේ එහි දැඩිබව හඳුනාගැනීම සඳහා බර තැබීමක් ලබාදෙන ලදී. ඒ ඒ ගෘහ ඒකක විසින් මුහුණ දෙන අපහසුතාවයේ තීව්‍රතාවය නැත්නම් දැඩි බව හඳුනා ගැනීම සඳහා දර්ශකයක් භාවිතා කරන ලද අතර, මෙම දැඩි බව හඳුනා ගැනීම සඳහා අවම දැඩි බව 1, සහ වැඩිම දැඩි බව 4 ලෙස ගෙන, මධ්‍යස්ථ දැඩිබව සඳහා බොහෝවිට යන දර්ශක අගයන් ලබාදෙන ලදී. ඒ ඒ ගෘහ ඒකක විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිචාර උපක්‍රම විවිධ වේ. බොහොමයක් ගෘහ ඒකක විසින් මිලෙන් අඩු ආහාර වර්ග තෝරා ගැනීමට පෙළෙඹෙති. එමෙන්ම මිලට ගන්නා ආහාර ප්‍රමාණයන් අඩු කිරීමද සිදුවේ. එම සෘජු උපායමාර්ගවලට අතිරේකව, තවත් බොහෝ ගෘහ ඒකක විසින් ණය පදනම මත ආහාර මිලට ගැනීම සිදු කරයි. තවද ඇතැම් ගෘහ ඒකක මිතුරන් හෝ නෑදැයන් මත

යැපේ. ඇතැම් ග්‍රාමීය ප්‍රදේශවල ගෘහ ඒකක පොදු සම්පත් වැඩි වශයෙන් උපයෝජනයට ගැනීමට පෙළඹේ. උදාහරණ වශයෙන් ගංගාවලින් වැලි ගොඩ දැමීම අධික වශයෙන් සිදු කිරීම, ස්වභාවික ජලාශ්‍රවලින් වැඩිපුර මසුන් අල්ලා ගැනීම ආදිය දැකිය හැකිය. සමස්ත නියැදියේ ගෘහ ඒකක විසින් අනුගමනය කරනු ලැබූ විකල්ප ප්‍රතිචාර උපක්‍රම 4.2 වගුව මගින් පැහැදිලි වේ.

වගු අංක 4.2: ගෘහ ඒකකයන් විසින් අනුගමනය කරන ලද ප්‍රතිචාර උපක්‍රමයන්ගේ සාමාන්‍යය (%)

| විකල්ප උපක්‍රම | දිනපතා (1) | බොහෝවිට (2) | සමහරවිට (3) | කලාතුරකින් (4) | ලද එකතුව (5) | නොයෙදුන අය (6) | එකතුව (5+6) |
|---|---|---|---|---|---|---|---|
| 01. අඩු මිල ආහාර ලබාගැනීම/අඩුවෙන් මිලදී ගැනීම | 6.0 | 27.3 | 29.3 | 17.3 | 79.9 | 20.1 | 100 |
| 02. ආහාර ණයට මිලදී ගැනීම | 9.0 | 5.0 | 47.7 | 4.7 | 66.4 | 33.6 | 100 |
| 03. දිනපතා ගන්නා ආහාර අඩුවීම | 3.0 | 16.0 | 34.0 | 12.7 | 65.7 | 34.3 | 100 |
| 04. මිතුරන් අසල්වාසීන්ගෙන් ආහාර ද්‍රව්‍ය ණයට ගැනීම | 2.7 | 10.3 | 24.3 | 19.7 | 57.0 | 43.0 | 100 |
| 05. මව්වරුන්, සහෝදරියන් අනෙක් අය වෙනුවෙන් පරිභෝජනය සීමා කිරීම | 2.0 | 4.7 | 10.7 | 31.7 | 49.1 | 50.9 | 100 |
| 06. කුඩා ළමයින් වෙනුවෙන් වැඩිහිටියන් ආහාර පරිභෝජනය සීමා කිරීම | 1.0 | 6.3 | 13.3 | 22.0 | 42.6 | 57.4 | 100 |
| 07. වැඩි වශයෙන් බෝග වගාකිරීම* | 4.0 | 16.3 | 6.7 | 14.0 | 41.0 | 59.0 | 100 |
| 08. අතිරේක රැකියා සඳහා යොමුවීම | 1.0 | 6.0 | 14.7 | 14.3 | 36.0 | 64.0 | 100 |
| 09. සෞඛ්‍ය වියදම් අඩුකිරීම | 0 | 4.3 | 6.3 | 23.3 | 33.9 | 66.1 | 100 |
| 10. රත්‍රං භාණ්ඩ විකිණීම හා උකස් කිරීම | 0 | 0 | 9.3 | 22.7 | 32.0 | 68.0 | 100 |
| 11. වැඩි වශයෙන් පසු සම්පත් විකිණීම | 0 | 1.7 | 0.7 | 26.3 | 28.7 | 71.3 | 100 |
| 12. තිවසෙහි සාමාජිකයින් ආහාර වෙනුවෙන් වැඩට යොමුවීම | 1.0 | 6.0 | 5.0 | 16.0 | 28.0 | 72.0 | 100 |
| 13. ඊළඟ කන්නයට තබාගත් බීජ පරිභෝජනය කිරීම | 0 | 1.7 | 3.3 | 23.0 | 27.0 | 73.0 | 100 |
| 14. ගෘහයේ ඇති වත්කම් විකිණීම | 0 | 0.7 | 1.3 | 24.7 | 26.7 | 73.3 | 100 |
| 15. ළමුන් පාසැල්වලින් ඉවත් කරගැනීම හෝ පාසල් යැවීම අඩු කිරීම | 0 | 0 | 1.3 | 24.3 | 25.6 | 74.4 | 100 |
| 16. පොහොර කෘමිනාශක සත්ව ආහාර වියදම් අඩු කිරීම | 0 | 0.3 | 1.3 | 23.0 | 24.6 | 75.4 | 100 |
| 17. නිෂ්පාදනයට ඉවහල් වන වත්කම් උකස් කිරීම | 0 | 0.3 | 0.7 | 9.7 | 10.7 | 89.4 | 100 |
| 18. ඉඩම් විකිණීම හෝ උකස් කිරීම | 0 | 0 | 1.3 | 8.0 | 9.3 | 90.7 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

*තම පාරිභෝජනය සඳහා බටු, මිරිස්, ගෝවා යන ආදිය වගා කිරීම (4) කලාතුරකින් දින 2 (3) සමහරවිට දින 10 පමණ (2* බොහෝවිට දින 20 ක් පමණ)

මෙම ප්‍රතිචාර උපක්‍රමයන්ගේ සංඛ්‍යාත ප්‍රතිශත විශ්ලේෂණය කිරීමේදී ඉහළම ප්‍රතිශත අගයක් වාර්තා කර ඇත්තේ මිලෙන් අඩු ආහාර වර්ග තෝරා ගැනීම හෝ ලබාගන්නා ආහාර ප්‍රමාණය අඩු කිරීම සඳහාය. එය සමස්ත නියැදිය සම්බන්ධයෙන් 80%කි. දෙවනුව ණය පදනම මත එදිනෙදා ආහාර ද්‍රව්‍ය මිලට ගැනීම ඔවුනගේ ප්‍රතිචාර උපක්‍රමය විය. එය සම්පූර්ණ නියැදියෙන් 66%ක අගයක් ගනු ලැබිය. පිළිවෙළින් 66%ක් හා 57%ක් දෛනිකව ලබාගන්නා ආහාර ප්‍රමාණය අඩු කිරීම හා මිතුරන්ගෙන් හෝ නෑදෑයන්ගෙන් ණය ගැනීම යන ප්‍රතිචාර උපක්‍රම අනුගමනය කරනු ලැබේ. මෙම ඍජු උපායමාර්ග සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් ගන්නා බව අනාවරණය වේ.

සාහිත්‍ය විමර්ශනයේදී අනාවරණය වූ තොරතුරුවලට අනුව වෙනත් දියුණු වෙමින් පවතින රටවල (උදා:-කාම්බෝජය, බංගලාදේශය) ආහාර මිල ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන් ළමුන් පාසැල්වලින් ඉවත් කර ආදායම් ඉපැයීම සඳහා යොමු කිරීම සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබේ. නමුත් මෙම අධ්‍යයනයේදී සමීක්ෂණය කළ නියැදියට අනුව ආහාර මිල ඉහළ යාම හමුවේ පාසැල්වලින් ළමුන් ඉවත් කර ආදායම් ඉපැයීම සඳහා යොමු කර ඇති ප්‍රතිශතය පහළ අගයක් ගනු ලැබේ. සම්පූර්ණ වශයෙන් පාසැල් යැවීම නවතා දමා ඇති ගෘහ ඒකකයන් දක්නට නොවිය. කලාතුරකින් පාසැල් නොයැවූ සංඛ්‍යාව ඉහළ ප්‍රතිශතයක් ගනී. එය 26%කි.

අධ්‍යාපනය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකීය ජනතාව තුළ ඇති උසස් අපේක්ෂා සහ ඉහළ සාක්ෂරතාවය, පාසැල් අධ්‍යාපනය සම්බන්ධයෙන් රජය මගින් ලබාදෙන පහසුකම් සහ කුඩා ළමුන් අනිවාර්යයෙන්ම පාසැල් යැවීම පිළිබඳව පවතින නීතිරීති මේ සඳහා හේතු වී තිබේ. කෙසේ වෙතත් දිළිඳු ගෘහ ඒකකයන්ගේ ළමයින් පාසැලට පැමිණීම සාපේක්ෂව අඩු බව අනාවරණය විය. දෛනිකව ප්‍රමාණවත් වූ ආහාර වේලක් ලබාගැනීමට නොහැකි වීම ඒ සඳහා හේතු වී තිබේ.

වගු අංක 4.3 : ආහාර මිල ඉහළ යාම හමුවේ ඒ ඒ අංශයේ ගෘහ ඒකක විසින් දක්වන ලද ප්‍රතිචාරයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාතය*

| ප්‍රතිචාර උපක්‍රම | අවම ආ.ප.ම. | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සමස්ත නියැදිය | ආසන්නව වටයන ලද සමස්ත නියැදිය | අනු පිළිවෙළ |
|---|---|---|---|---|---|---|---|
| 01. මිල අඩු ආහාර මිලදී ගැනීම/ප්‍රමාණය අඩුවෙන් ලබාගැනීම | 4.2 | 2.8 | 3.3 | 3.6 | 3.2 | 3 | 1 |
| 02. ආහාර ණයට ගැනීමට සිදු වීම | 3.8 | 1.7 | 2.0 | 3.0 | 2.2 | 2 | 2 |
| 03. මිතුරන්/අසල්වාසීන්ගෙන් ආහාර ණයට ගැනීම | 3.4 | 1.8 | 1.8 | 2.7 | 2.1 | 2 | 2 |
| 04. දිනපතා ගන්නා ආහාර ප්‍රමාණය අඩු කිරීම | 3.4 | 1.9 | 1.2 | 2.3 | 1.8 | 2 | 2 |
| 05. අතිරේක රැකියා සඳහා යොමු වීම | 2.5 | 1.1 | 1.2 | 2.2 | 1.5 | 2 | 2 |
| 06. වැඩි වශයෙන් බෝග වගා කිරීමට යොමුවීම | 2.7 | 0.8 | 1.7 | 1.9 | 1.5 | 2 | 2 |
| 07. රත්‍රං භාණ්ඩ විකිණීම/උකස් කිරීම | 2.8 | 1.5 | 1.0 | 1.9 | 1.5 | 2 | 2 |
| 08. කුඩා ළමයින් වෙනුවෙන් වැඩිහිටියන්ගේ ආහාර පරිභෝජනය සීමා කිරීම | 2.8 | 1.1 | 0.9 | 2.0 | 1.3 | 1 | 3 |
| 09. මව්වරුන්/සහෝදරියන්/අනෙක් අය වෙනුවෙන් පරිභෝජනය සීමා කිරීම. | 2.7 | 1.3 | 0.8 | 1.6 | 1.2 | 1 | 3 |
| 10. නිවසෙ හි සාමාජිකයින් ආහාර වෙනුවෙන් වැඩට යොමුවීම | 2.4 | 0.8 | 1.0 | 2.0 | 1.2 | 1 | 3 |
| 11. සෞඛ්‍ය වියදම් අඩුවීම | 2.2 | 0.9 | 0.8 | 1.6 | 1.1 | 1 | 3 |
| 12. පොදු වත්කම් පරිභෝජනය අඩු කිරීම | 2.2 | 0.9 | 1.1 | 1.7 | 1.1 | 1 | 3 |
| 13. ඉඩම් විකිණීම/උකස් කිරීම | 2.0 | .1.0 | 1.0 | 1.6 | 1.0 | 1 | 3 |
| 14. ඊළඟ කන්නය සඳහා තබාගත් බීජ පරිභෝජනය කිරීම | 1.9 | 0.8 | 0.8 | 1.4 | 0.9 | 1 | 3 |
| 15. නිෂ්පාදනයට ඉවහල් වන වත්කම් (ගොවි උපකරණ) උකස් කිරීම | 2.0 | 0.9 | 0.9 | 1.0 | 0.9 | 1 | 3 |
| 16. පොහොර, කෘමිනාශක, සත්ව ආහාර වියදම් අඩු කිරීම | 1.9 | 0.7 | 0.8 | 1.0 | 0.8 | 1 | 3 |
| 17. ගෘහයේ ඇති වත්කම් විකිණීම (රේඩියෝ, ලීබඩු) | 1.9 | 0.8 | 0.7 | 0.9 | 0.8 | 1 | 3 |
| 18. වැඩි වශයෙන් පශු සම්පත් විකිණීම | 1.8 | 0.9 | 0.8 | 0.9 | 0.8 | 1 | 3 |
| 19. ළමුන් පාසැල්වලින් ඉවත් කරගැනීම | 2.0 | 0.9 | 0.7 | 0.8 | 0.7 | 1 | 3 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

*ඒ ඒ ප්‍රතිචාර උපක්‍රමයන් සඳහා බර තැබීමක් ලබාදී නැත.

ඒ ඒ ගෘහ ඒකක විසින් අනුගමනය කරන ප්‍රතිචාර උපක්‍රමයන්ගේ අනුපිළිවෙළ (rank) මගින් ඔවුන් වැඩි වශයෙන් භාවිතා කරන ප්‍රතිචාර උපක්‍රමයන් හඳුනාගත හැකිය. ඒ අනුව ඉහළම අනුපිළිවෙළ අගයක් දැක්වෙන ප්‍රතිචාර උපක්‍රමය සාපේක්ෂව මිලෙන් අඩු අහාර ද්‍රව්‍ය මිලට ගැනීම සහ පවතින මිල යටතේ ලබාගන්නා ආහාර ප්‍රමාණය අඩු කිරීමයි. දෙවනුව මිතුරන්ගෙන් ණයට ගැනීම, එදිනෙදා ආහාර ද්‍රව්‍ය මිලට ගන්නා අලෙවි සැලෙන් ණය පදනම මත මිලට

ගැනීම සහ දිනපතා පරිභෝජනය කරනු ලබන ආහාර ප්‍රමාණය අඩු කිරීම යන ප්‍රතිචාර උපක්‍රමයන් භාවිතා කර තිබේ. අනෙකුත් ප්‍රතිචාර උපක්‍රමයන් භාවිතා කර ඇත්තේ ඉහත සඳහන් ප්‍රතිචාර උපක්‍රමයන්ට සාපේක්ෂව අඩු සංඛ්‍යාතයකිනි. ආහාර මිල ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන් අවම ආහාර පරිභෝජන මට්ටමේ ගෘහ ඒකක විසින් ගනු ලබන උපක්‍රමයන්ගේ සංඛ්‍යාත අගයන් සමස්ත නියැදියේ සාමාන්‍ය අගයන්ට වඩා ඉහළය. එයින් ගම්‍ය වන්නේ එම ගෘහ ඒකක විසින් ගනු ලබන ප්‍රතිචාර උපක්‍රමයන් සාපේක්ෂව ඉහළ බවය. අනෙක් අතට, ආහාර මිල ඉහළයාම හමුවේ ඔවුන් වඩාත් පීඩාවට ලක්වී ඇති බව අනාවරණය වේ.

## 4.4 අත්‍යාවශ්‍ය වියදම් ඉහළ යාම පිළිබඳ පීඩනයට මුහුණදීම සහ ණය ලබාගැනීම


ආහාර මිල ඉහළ යාම පිළිබඳව වාර්තා කළ සමස්ත නියැදියෙහි (32%) සෑම ගෘහ ඒකකයක් විසින්ම ඔවුන්ගේ දෛනික අත්‍යාවශ්‍ය වියදම් ඉහළ ගොස් ඇති බව සඳහන් කරන ලදී. එම වියදම්වලට මුහුණදීම සඳහා ණය ලබාගැනීමට සිදුවී ඇත. සමස්ත නියැදියෙන් 71%ක් ණය ලබාගෙන ඇති අතර එයින් 53%ක් පසුගිය වසරක කාලය තුළ ලබාගත් අලුත් ණය වේ. වැඩිම ප්‍රතිශතයක් ණය ලබාගෙන ඇත්තේ නාගරික පැල්පත් අංශයේ ගෘහ ඒකක වේ (88%). ඔවුන්ගේ ප්‍රධාන ණය මූලාශ්‍රය මාසික පොළිය 10%-20% පදනම යටතේ පෞද්ගලික ණය දෙන්නන් වේ. දෙවනුව ග්‍රාමීය අංශයේ ගෘහ ඒකක විසින් ණය ලබාගෙන ඇත. (72%). ඔවුන්ගේ ණය මූලාශ්‍රය පෞද්ගලික ණය දෙන්නන් සහ රාජ්‍ය සහ පෞද්ගලික බැංකු ක්ෂේත්‍රයෙන් රත්‍රං භාණ්ඩ උකස් කර ණය ලබාගැනීමයි.

වගු අංක 4.4 : ණය ලබාගෙන ඇති ගෘහ ඒකක සංඛ්‍යාව සහ එහි ප්‍රතිශතය

| අංශය | නියැදිය | ණය ලබාගත් ගෘහ ඒකක | % | පසුගිය වසරක කාලය තුළ ණය ලබාගත් සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|
| නාගරික අංශය | 50 | 39 | 78 | 26 | 66 |
| ග්‍රාමීය අංශය | 150 | 108 | 72 | 47 | 44 |
| වතු අංශය | 50 | 30 | 60 | 17 | 56 |
| එකතුව | 250 | 177 | 61 | 90 | 51 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ප්‍රස්තාර අංක 4.1 : ණය ලබාගෙන ඇති ගෘහ ඒකක සංඛ්‍යාවේ ප්‍රතිශතය




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## ණය ලබාගැනීමේ ප්‍රධාන හේතුව

සෑම ගෘහ ඒකකයකම ජීවන මට්ටම යහපත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය දෛනික වියදම් පියවාගැනීම අපහසුවන බොහෝ අවස්ථාවලදී ඒ සඳහා විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් ණය ලබාගැනීමට පෙළඹෙති.


මෙම අධ්‍යයනයේදී ඒ ඒ ගෘහ ඒකක විසින් ණය ලබාගත් ප්‍රධාන සහ ද්විතීය හේතු පිළිබඳව විමර්ශනය කරන ලදී. ණය ලබාගත් ප්‍රධාන හේතුව ලෙස සඳහන් කර ඇත්තේ නිවාස සෑදීමට හෝ අලුත්වැඩියා කිරීම සඳහා ණය ලබාගැනීම වේ. ණය ලබාගත් දෙවන හේතුව කෘෂි - යෙදවුම් මිලට ගැනීම සඳහා ණය ලබාගැනීමයි. කෙසේ වෙතත්, ආහාර මිලට ගැනීම සඳහා ණය ලබාගැනීම සාපේක්ෂව තෙවෙනි ස්ථානය ගනු ලැබේ (17%). නමුත් ආංශික වශයෙන් ණය ලබාගත් හේතු අධ්‍යයනය කිරීමේදී ණය ලබාගත් හේතුන්ගේ ප්‍රමුඛතාව වෙනස් වේ. නාගරික අංශයේ ගෘහ ඒකක වැඩි සංඛ්‍යාවක් ණය ලබාගෙන ඇත්තේ ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහාය. ග්‍රාමීය අංශයේදී එය කෘෂි යෙදවුම් මිලට ගැනීම සඳහා වන අතර වතු අංශයේදී ඔවුන් ජීවත්වන නිවාස සෑදීම සහ අළුත්වැඩියාව සඳහා ණය ලබාගෙන තිබේ. නාගරික සහ වතු අංශයේ ගෘහ ඒකක විසින් ආහාර මිලට ගැනීම සඳහා ණය ලබාගත් ගෘහ ඒකක ප්‍රතිශතය සමස්ත නියැදියේ අගයට වඩා ඉහළය. එය පිළිවෙලින් 22% සහ 32%ක අගයක් ගනු ලැබේ. එයින් ගම්‍ය වන්නේ ග්‍රාමීය අංශයේ ගෘහ ඒකකවලට සාපේක්ෂව වතු සහ නාගරික අංශයේ ගෘහ ඒකක ආහාර මිල ඉහළ යාම හේතුවෙන් වඩාත් පීඩාවට පත්වී ඇති බවයි.

වගු අංක 4.5: ණය ලබාගැනීමේ ප්‍රධාන හේතුව (අංශ වශයෙන්)

| අනු අංකය | ණය ලබාගැනීමේ හේතුව | නාගරික අංශය % | ග්‍රාමීය අංශය % | වතු අංශය % | සමස්ත නියැදිය % |
|---|---|---|---|---|---|
| 1. | නිවාස සෑදීම/අළුත්වැඩියාව සඳහා | 22.2 | 23.8 | 36.0 | 26.1 |
| 2. | කෘෂි යෙදවුම් මිලට ගැනීම සඳහා | 0.0 | 34.5 | 4.0 | 21.5 |
| 3. | ආහාර මිලට ගැනීම සඳහා | 22.2 | 10.7 | 32.0 | 17.5 |
| 4. | ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා | 25.9 | 6.0 | 4.0 | 9.8 |
| 5. | සෞඛ්‍ය වියදම් සඳහා | 7.4 | 7.1 | 12.0 | 8.1 |
| 6. | සාමාජීය වියදම් සඳහා | 3.7 | 9.5 | 4.0 | 7.2 |
| 7. | ණය පියවීම සඳහා | 3.7 | 3.6 | 4.0 | 3.7 |
| 8. | අධ්‍යාපන වියදම් සඳහා | 7.4 | 2.4 | 0 | 2.9 |
| 9. | වෙනත් | 7.4 | 2.4 | 4.0 | 3.6 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ප්‍රස්තාර අංක 4.2 : ණය ලබාගැනීමේ ප්‍රධාන හේතුව (අංශ වශයෙන්)





මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

වගු අංක 4.6 : ණය ලබාගැනීමේ දෙවන හේතුව (අංශ වශයෙන්)

| අනු අංකය | ණය ලබාගැනීමේ හේතුව | ඒකකය % | | | |
|---|---|---|---|---|---|
| | | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සමස්ත නියැදිය |
| 1 | ආහාර මිලට ගැනීම සඳහා | 38.9 | 46.9 | 25.0 | 41.0 |
| 2 | කෘෂි යෙදවුම් සඳහා | | 18.8 | 12.5 | 14.0 |
| 3 | අධ්‍යාපන වියදම් සඳහා | 33.3 | 9.4 | | 12.0 |
| 4 | සෞඛ්‍ය වියදම් සඳහා | 11.1 | 3.1 | | 12.0 |
| 5 | ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා | 5.6 | 6.3 | 12.5 | 10.0 |
| 6 | නිවාස සෑදීම/අළුත්වැඩියාව සඳහා | | | 25.0 | 7.0 |
| 7 | ඇඳුම් ගැනීම සඳහා | 11.1 | 15.7 | 25.0 | 4.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009)

ප්‍රස්තාර අංක 4.3 : ණය ලබාගැනීමේ දෙවන හේතුව (අංශ වශයෙන්)




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

### ණය ලබාගත් දෙවන හේතුව


සමස්ත නියැදියෙන් 41%ක් වූ ඉහළම ප්‍රතිශතය වාර්තා කර ඇත්තේ ආහාර මිලට ගැනීම සඳහා ණය ලබාගත් බවය. අනුපිළිවෙළින් දෙවන හේතුව කෘෂි යෙදවුම් මිලට ගැනීම සඳහා ණය ලබා

ගැනීමයි (14%). අනෙකුත් හේතූන් අතර අධ්‍යාපන වියදම් සහ සෞඛ්‍ය සඳහා ණය ලබාගැනීම වඩාත් වැදගත් වේ.

## 4.5 රජය සහ රාජ්‍ය නොවන අංශයේ සංවිධාන මගින් සැපයෙන ආධාර

රජය සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන මගින් සමස්ත ජනතාව සඳහා මෙන්ම ඉලක්කගත ජන කොට්ඨාස සඳහා විවිධ ආධාර සපයා දෙනු ලැබේ. ඉලක්කගත ජන කොට්ඨාස සඳහා විවිධ ආධාර සපයාදීමේ අරමුණ වන්නේ වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය මගින් තීරණය වන මිල ගණන් යටතේ ඔවුන්ගේ අත්‍යාවශ්‍ය වියදම් පියවා ගැනීමට නොහැකිවීම නිසා ඇතිවන පීඩනය ලිහිල් කිරීම වේ. මෙම ආධාර මගින් ඔවුන් සඳහා "ආරක්ෂක දැලක්" එලීම සිදු කරනු ලබයි. අධ්‍යයනයේ සමස්ත නියැදිය සඳහා ලබාදී ඇති ආධාර අතර ප්‍රමුඛතාවය ගනු ලබන්නේ රජය විසින් නොමිලේ ලබාදෙන සෞඛ්‍ය පහසුකම් වේ. පසුගිය මාස 06ක කාලය තුළ සමස්ත නියැදියෙන් 52%ක් රජය විසින් නොමිලේ ලබාදෙන සෞඛ්‍ය පහසුකම් ලබාගෙන ඇත. දෙවනුව වැදගත් වනුයේ රජය මගින් ලබාදෙන පොහොර සහනාධාරයයි. එය ග්‍රාමීය ගෘහ ඒකක සම්බන්ධයෙන් ප්‍රමුඛතම ආධාරය වන අතර ග්‍රාමීය අංශයේ ගෘහ ඒකකයන්ගෙන් 76%ක් මෙම ආධාරය ලබාගෙන ඇත. එය ඔවුන්ගේ නිෂ්පාදනය දිරිගැන්වීමට සහ නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා හේතු වේ. සමස්ත නියැදියෙන් 24%ක් සමෘද්ධිලාභීන් වන අතර ග්‍රාමීය අංශයේදී මෙම අගය 35%ක් වේ.

ප්‍රස්තාර අංක 4.4: රජය සහ රාජ්‍ය නොවන අංශයෙන් සැපයෙන ආධාර (ප්‍රතිශතය)




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 4.6 කාන්තා ගෘහ මූලික ගෘහ ඒකක සම්බන්ධයෙන් දක්වන බලපෑම


සමස්ත නියැදියෙන් 14%ක් කාන්තා ගෘහමූලික ගෘහ ඒකක වේ. කාන්තාවන් ගෘහ මූලිකත්වය දරන ගෘහ ඒකකයන්ගේ ඉහළම ප්‍රතිශතයක් නාගරික අංශයෙන් වාර්තා වන අතර දෙවනුව එය ධීවර ගෘහ ඒකකයන් සම්බන්ධයෙන් වාර්තා වේ. කාන්තා ගෘහ මූලික ගෘහ ඒකකයන්ගේ ආහාර සුරක්ෂිතතාවය සාපේක්ෂව පහළ අගයක් ගනු ලැබේ.

වගු අංක 4.7 : ස්ත්‍රී/පුරුෂභාවය අනුව ගෘහ මූලිකත්වයේ ව්‍යාප්තිය

| අංශය | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | |
| නාගරික අංශය | 41 | 82 | 9 | 18 | 50 |
| ග්‍රාමීය අංශය | 131 | 87 | 19 | 13 | 150 |
| වතු අංශය | 43 | 86 | 7 | 14 | 50 |
| එකතුව | 215 | 86 | 35 | 14 | 250 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ප්‍රස්තාර අංක 4.5: ඒ ඒ අංශ සම්බන්ධයෙන් කාන්තා ගෘහ මූලිකත්වයේ ව්‍යාප්තිය (%)




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 4.7 යැපෙන්නන් සංඛ්‍යාව


සෑම අංශයකදීම යැපෙන්නන් සංඛ්‍යාව සාපේක්ෂව ඉහළ අගයක් ගනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජනගහන පිරමීඩය අනුව වැඩි වයස් කාණ්ඩයන්ගේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පැවතීම මේ සඳහා හේතු වී ඇත. යහපත් සෞඛ්‍ය සේවය ජනතාවගේ සාමාන්‍ය ආයු කාලය දීර්ඝවීම සඳහා හේතුවී තිබේ. සමස්ත නියැදියෙන් 36%ක් යැපෙන්නන් ලෙස වාර්තා වේ. එහි ඉහළම අගය වාර්තා වන්නේ වතු අංශයෙනි. එය 51%කි. අවම මට්ටමේ ආහාර පරිභෝජන මට්ටමක් පවත්වාගෙන යන ගෘහ ඒකකයන් සම්බන්ධයෙන් එම අගය 50%කි. අවම ආහාර පරිභෝජන මට්ටමේ ගෘහ ඒකක සහ වතු අංශයේ ගෘහ ඒකකවල යැපෙන්නන් සංඛ්‍යාවේ ප්‍රතිශතය බොහෝ දුරට සමාන වේ. එබැවින් ආහාර මිල ඉහළ යාම නිසා ඇතිවන පීඩනයේ තීව්‍රතාවය එම ගෘහ ඒකක සඳහා සාපේක්ෂව ඉහළය.

වගු අංක 4.8 : ඒ ඒ අංශයෙහි යැපෙන්නන් සංඛ්‍යාව (%)

| වයස් කාණ්ඩය | අවම ආහාර පරිභෝජන මට්ටම | නාගරික ගෘහ ඒකක | ග්‍රාමීය ගෘහ ඒකක | වතු ගෘහ ඒකක | නාගරික පැල්පත් ගෘහ ඒකක | ධීවර ගෘහ ඒකක | සම්පූර්ණ නියැදිය |
|---|---|---|---|---|---|---|---|
| යැපෙන්නන් සංඛ්‍යාව | 36 | 67 | 181 | 107 | 42 | 37 | 434 |
| ශ්‍රම බලකාය | 72 | 157 | 491 | 199 | 85 | 72 | 1004 |
| යැපෙන්නන් සංඛ්‍යාව (%) | 50 | 42.7 | 36.9 | 53.8 | 49.4 | 51.4 | 43.2 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ප්‍රස්තාර අංක 4.6 : ඒ ඒ අංශයෙහි යැපෙන්නන් සංඛ්‍යාව (%)




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 4.8 සාරාංශය

ආහාර මිල ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන් ඒ ඒ අංශයේ ගෘහ ඒකක විසින් විවිධ ප්‍රතිචාර උපක්‍රම අනුගමනය කෙරේ. සාපේක්ෂව මිලෙන් අඩු ආහාර ද්‍රව්‍ය මිලට ගැනීම සහ පවතින මිල යටතේ මිලට ගන්නා ප්‍රමාණය අඩු කිරීම ප්‍රමුඛතම ප්‍රතිචාර උපක්‍රමය ලෙස භාවිතා කෙරේ (80%). ණය පදනම මත ආහාර මිලට ගැනීම (66%), දෛනිකව ලබාගන්නා ආහාර ප්‍රමාණය අඩු කිරීම (66%), මිතුරන් සහ අසල්වාසීන්ගෙන් ඉල්ලා ගැනීම (57%) යන ප්‍රතිචාර උපක්‍රමයන්ද ඊළඟට වැදගත් වේ. තමා සතු රත්‍රං භාණ්ඩ උකස් කිරීම හෝ විකිණීමද (51%) ඔවුන්ගේ තවත් ප්‍රතිචාර උපක්‍රමයකි. අවම ආහාර පරිභෝජන මට්ටමේ ගෘහ ඒකකවල ප්‍රතිචාර උපක්‍රමයන්ගේ තීව්‍රතාවය සමස්ත නියැදියේ සාමාන්‍යයට වඩා ඉහළ අගයක් ගනු ලැබේ. ණය ලබාගැනීම ප්‍රධාන ප්‍රතිචාර උපක්‍රමයක් වන අතර ණය ලබාගැනීමේ ප්‍රධාන හේතූන් අතර ආහාර මිලට ගැනීම සඳහා ණය ලබාගැනීමේ ප්‍රතිශතය (17%) දෙවෙනි වන්නේ නිවාස සෑදීම සහ කෘෂි යෙදවුම් මිලට ගැනීම සඳහා ණය ලබාගැනීමට පමණි.

පස් වන පරිච්ඡේදය

# ගෘහ ඒකකවල පරිභෝජනයේ විවිධත්වය සහ ආහාර සුරක්ෂිතතාව තක්සේරු කිරීම

## 5.1 හැඳින්වීම

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණක් වන්නේ ආහාර මිල ඉහළ යාම ගෘහ ඒකකයන්ගේ ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් දක්වන බලපෑම අධ්‍යයනය කිරීමයි. ගෘහ ඒකකයන්ගේ පරිභෝජන මට්ටම තක්සේරු කිරීම සඳහා සමීක්ෂණ දිනට පෙර දින 7දී ගෘහ ඒකක විසින් පරිභෝජනය කරනලද අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ ඒවා ලබාගත් මූලාශ්‍ර පිළිබඳ තොරතුරු එක්රැස් කරන ලදී. එම තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා ලෝක ආහාර වැඩසටහන (WFP) මගින් ගොඩනගා ඇති ආහාර පරිභෝජන මට්ටම පිළිබඳ ආකෘතිය පදනම් කරගනු ලැබීය. ඒ අනුව ආහාර පරිභෝජනය සම්බන්ධයෙන් පීඩාවට පත්වී ඇති සහ පීඩාවට පත්වී නැති ගෘහ ඒකකයන් හඳුනාගන්නා ලදී.

## 5.2 ආහාර පරිභෝජනයේ විවිධත්වය : ආහාර පරිභෝජන මට්ටම - න්‍යායාත්මක පසුබිම

පරිභෝජනය කරන ආහාර වර්ගයන්ගේ විවිධත්වය සහ එහි ඇති පෝෂණ වටිනාකම අතර සහසම්බන්ධතාවය ඉහළ මට්ටමක පවතින බව විද්‍යාත්මක පරීක්ෂණවලින් අනාවරණය කර තිබේ. ලෝක ආහාර වැඩසටහන (WFP) මගින් ආහාර ද්‍රව්‍යයන්ගේ පෝෂණ වටිනාකම පදනම් කරගනිමින් පරිභෝජනය කරනු ලබන විවිධ ආහාර කාණ්ඩ සඳහා බර තැබීමක් ලබා දී ඇත. ඒ අනුව ආහාර පරිභෝජනයේ මට්ටම සංඛ්‍යාත්මකව තක්සේරු කර තිබේ. ආහාර පරිභෝජන මට්ටම (Food Consumption Score) මගින් ඒ ඒ ගෘහ ඒකකයේ ආහාර පරිභෝජන මට්ටම පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය. ඒ සඳහා සමීක්ෂණ දිනට පෙර දින 7ක කාලය තුළදී අදාළ ගෘහ ඒකකය විසින් විවිධ ආහාර කාණ්ඩයන් පරිභෝජනයට ගනු ලැබූ දින ගණන සහ පරිභෝජනය කළ ආහාර වර්ගයන්ගේ විවිධත්වය පදනම් කරගෙන ඇත. මෙහිදී පරිභෝජනයට ගන්නා ආහාර වර්ග ප්‍රධාන කාණ්ඩ අටක් යටතේ ගොනු කරනු ලැබේ. ඒ අනුව පහත සමීකරණයෙන් දැක්වෙන පරිදි ආහාර පරිභෝජන මට්ටම තක්සේරු කරනු ලබයි.

$$FCS = a_{staple} \times x_{staple} + a_{pulse} \times x_{pulse} + a_{veg} \times x_{veg} + a_{fruit} \times x_{fruit} + a_{animal} \times x_{animal} + a_{sugar} \times x_{sugar} + a_{oil} \times x_{oil}$$

සංකේත හඳුනා ගැනීම

FCS = ආහාර පරිභෝජන මට්ටම

$a_i$ = ඒ ඒ ආහාර කාණ්ඩයන් සඳහා ලබාදී ඇති බර තැබ්මේ වටිනාකම

$x_i$ = දින 7ක කාලය තුළ ඒ ඒ ආහාර කාණ්ඩයන් පරිභෝජනය කළ දින ගණන

ඒ ඒ ආහාර කාණ්ඩය සඳහා ලබාදී ඇති බර තැබීම් වටිනාකම පහත වගුව (5.1) මගින් දැක්වේ. බර තැබීම සඳහා පාදක කරගත්තා ලද නිර්නායක වගු අංක 5.2 මගින් පැහැදිලි කෙරේ

වගු අංක 5.1 : ඒ ඒ ආහාර කාණ්ඩය සඳහා ලබාදී ඇති බර තැබීම් වටිනාකම

| අනු අංකය | ආහාර වර්ගය | ආහාර කාණ්ඩය | බර තැබීම |
|---|---|---|---|
| 1 | සහල්, පාන් සහ පාන්පිටි ආශ්‍රිත ආහාර සහ බඩඉරිඟු, බතල, මඤ්ඤොක්කා සහ වෙනත් අල වර්ග | ධාන්‍ය සහ අල වර්ග | 2 |
| 2 | මාංශ බෝග (කව්පි, මුංඇට, පරිප්පු) | මාංශ බෝග | 3 |
| 3 | එළවළු (කොළ එළවළු ඇතුළු) | එළවළු | 1 |
| 4 | පලතුරු | පලතුරු | 1 |
| 5 | සත්ව ආහාර (මස්, මාළු, බිත්තර සහ කරවල) | මස් සහ මාළු | 4 |
| 6 | කිරි (කිරි සහ කිරි ආහාර) | කිරි | 4 |
| 7 | සීනි (සීනි සහ පැණිරස කෑම) | සීනි | 0.5 |
| 8 | තෙල් සහ මේද (පොල්, පොල්තෙල්) | තෙල් | 0.5 |

මූලාශ්‍රයः ලෝක ආහාර වැඩසටහන, (2008).

තක්සේරු කරනු ලැබූ ආහාර පරිභෝජනයේ මට්ටම අනුව ලෝක ආහාර වැඩසටහන මගින් ප්‍රමිතීන් තුනක් හඳුන්වාදී ඇත. ආහාර පරිභෝජන මට්ටම 0-21 දක්වා අගයක් ගන්නා විට ඔවුන් ස්වල්ප වශයෙන් නැත්නම් අවම මට්ටමේ ආහාර පරිභෝජනය කරන්නන් ලෙසද එම අගය 21.5-35 අතර අගයක් ගන්නා විට ඔවුන් අවම මට්ටම් සීමාවේ ආහාර පරිභෝජනය කරන්නන් ලෙසද හඳුනාගෙන ඇත. මෙම පාරිභෝගික කාණ්ඩ දෙකම ආහාර ලබාගැනීම සම්බන්ධයෙන් පීඩාවට පත්වී ඇති ගෘහ ඒකක වේ. තක්සේරු කරන ලද ආහාර පරිභෝජන මට්ටමේ අගය 35.5ට වැඩි අගයක් ගන්නා විට එම ගෘහ ඒකක සතුටුදායක පරිභෝජන මට්ටමක (acecptable food consumption score) සිටින්නන් ලෙස හඳුනාගෙන තිබේ. ස්වල්ප වශයෙන් නැත්නම් අවම ආහාර ලබාගැනීමේ මට්ටම ලෙස තක්සේරු කර ඇත්තේ දෛනිකව ප්‍රධාන ආහාරය සමඟ එළවළු පමණක් පරිභෝජනය කළ හැකි විමයි. (7x2+7x1=21). දෙවනුව පීඩනයට පත්වී ඇති අවම ආහාර ලබාගැනීමේ සීමාවේ සිටින ගෘහ ඒකකයන්ගේ ආහාර පරිභෝජන මට්ටම තක්සේරු කර ඇත්තේ දින හතේදීම ප්‍රධාන ආහාරය සමඟ එළවළු සහ දින හතරක් මාංශ බෝග සහ තෙල් සහ මේද පරිභෝජනයට ගනී යන උපකල්පනය පදනම් කරගෙනය (7x2+7x1+4x3+4x0.5=35).

වගු අංක 5.2 : ඒ ඒ ආහාර කාණ්ඩය සඳහා බර තැබීමට පාදක කරගන්නා ලද නිර්ණායක

| ආහාර කාණ්ඩය | බර තැබීම | නිර්ණායකයන්ගේ අදාළත්වය |
|---|---|---|
| ප්‍රධාන ආහාරය | 2 | ශක්තිජනක පදාර්ථ බහුල වූ ප්‍රෝටීන් සංයුතිය අඩු සහ මාංශ බෝගවලට සාපේක්ෂව ප්‍රෝටීන් කාර්යක්ෂමතා දර්ශකය (protein efficiency ratio) අඩු, සූක්ෂම පෝෂ්‍ය පදාර්ථ බැදී ඇති |
| මාංශ බෝග | 3 | ශක්තිජනක පදාර්ථ බහුල වූ, ප්‍රෝටීන් සංයුතිය ඉහළ මට්ටමක ඇති නමුත් මස් වර්ගවලට සාපේක්ෂව ප්‍රෝටීන් කාර්යක්ෂමතා දර්ශකය අඩු, සූක්ෂම පෝෂ්‍ය පදාර්ථ ලිහිල් වූ සහ අඩු මේද සහිතවීම |
| එළවළු | 1 | ශක්තිජනක පදාර්ථ අඩු, ප්‍රෝටීන් අඩු, මේද රහිත සහ සූක්ෂම පෝෂ්‍ය පදාර්ථ අඩංගුවීම. |
| පලතුරු | 1 | ශක්තිජනක පදාර්ථ අඩු, ප්‍රෝටීන් අඩු, මේද රහිත සහ සූක්ෂම පෝෂ්‍ය පදාර්ථ අඩංගුවීම. |
| මස් සහ මාළු | 4 | ඉහළ ප්‍රමිතියෙන් යුතු ප්‍රෝටීන් අඩංගු, පහසුවෙන් අවශෝෂණය වන පෝෂ්‍ය පදාර්ථ අඩංගු, ශක්තිය බහුල වූ මේද සහිත කුඩා ප්‍රමාණ වශයෙන් වුවද පරිභෝජනය කළ හැකි, ලබාගන්නා ආහාර වේලෙහි ප්‍රමිතිය වර්ධනය කළ හැකි වීම. |
| කිරි ආහාර | 4 | ඉහළ ප්‍රමිතියෙන් යුතු ප්‍රෝටීන් අඩංගු, සූක්ෂම පෝෂ්‍ය පදාර්ථ අඩංගු, විටමින් ඒ සහිත ශක්තිජනක සහ සුළු ප්‍රමාණ වශයෙන් වුවද පරිභෝජනය කළහැකි සහ රසකාරක ලෙස භාවිතා කළ හැකි වීම. |
| සීනි | 0.5 | කැලරි රහිත, බොහෝ විට සුළු ප්‍රමාණ වශයෙන් පරිභෝජනය කළ හැකි වීම. |
| තෙල් සහ මේද | 0.5 | ශක්තිය බහුල නමුත් අනෙකුත් සූක්ෂම පෝෂ්‍ය පදාර්ථ අඩංගු සහ සාමාන්‍යයෙන් සුළු ප්‍රමාණ වශයෙන් පරිභෝජනය කළ හැකි වීම. |

මූලාශ්‍රය : Intarageucey Workshop Report WFP-FAO, (2008).

## 5.3 ආහාර පරිභෝජනයේ විවිධත්වය සහ තුලනාත්මක ආහාර පරිභෝජන මට්ටම

අධ්‍යනයට අදාළ සමස්ත නියැදියෙහි ඒ ඒ අංශයන්ගේ ආහාර පරිභෝජන රටාව ඔවුන්ගේ සමාජ ආර්ථික සංස්කෘතික පරිසරය අනුව වෙනස් වේ. එසේ වුවද, සෑම අංශයකම ප්‍රධාන ආහාරය වන්නේ බත්ය. සමීක්ෂණ දිනට පෙර දින හතක කාලය තුළ ඒ ඒ අංශයේ ගෘහ ඒකක විසින් පරිභෝජනය කළ ආහාර වර්ගවල විවිධත්වය සහ එම ආහාර පරිභෝජනය කළ දින ගණන වගු අංක 5.3 මගින් පැහැදිලි වේ. ඉහත ආකෘතිය අනුව විශ්ලේෂණය කිරීම සඳහා සතියේ ආහාර පරිභෝජන රටාව දැක්වෙන වගුව තැවන ප්‍රධාන ආහාර කාණ්ඩ අටකට ගොනු කරනු ලැබිය. එම ආහාර කාණ්ඩ ධාන්‍ය සහ අල වර්ග, මාංශ බෝග, සත්ව ආහාර, එළවළු, පලතුරු, කිරි ආහාර, සීනි, තෙල් සහ මේද වශයෙන් දැක්වේ (වගු අංක 5.4).

වගු අංක 5.3 : ඒ ඒ ආහාර කාණ්ඩය සඳහා බර තැබීමට පාදක කරගන්නා ලද නිර්ණායක (දින ගණන් වලින්)

| ආහාර වර්ගය | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සාමාන්‍යය |
|---|---|---|---|---|
| 01. සහල් | 7.00 | 7.00 | 7.00 | 7.00 |
| 02. බඩඉරිඟු | 0.42 | 0.75 | 0.00 | 0.39 |
| 03. පාන්/තිරිඟු පිටි නිෂ්පාදන | 2.28 | 1.45 | 3.12 | 2.28 |
| 04. මඤ්ඤොක්කා | 0.45 | 0.32 | 0.60 | 0.45 |
| 05. බතල සහ වෙනත් අල | 0.79 | 0.99 | 1.20 | .99 |
| 06. පරිප්පු, මුංඇට, කව්පි, රටකජු/වෙනත් මාංශ බෝග | 3.90 | 3.29 | 2.78 | 3.32 |
| 07. මාළු | 2.25 | 0.52 | 0.35 | 1.04 |
| 08. මස් (හරක් මස්/ඌරුමස්/කුකුල් මස්) | 1.00 | 0.32 | 0.17 | 0.50 |
| 09. බිත්තර | 1.17 | 0.55 | .037 | 0.70 |
| 10. කරවල | 0.55 | 1.05 | 0.45 | 0.68 |
| 11. එළවළු (කොළ එළවළු ඇතුළුව) | 6.90 | 6.70 | 7.00 | 6.87 |
| 12. පලතුරු | 4.20 | 3.25 | 1.50 | 2.98 |
| 13. සීනි සහ පැණිරස කෑම | 4.90 | 5.80 | 6.90 | 5.87 |
| 14. පොල් | 6.90 | 6.90 | 4.00 | 5.93 |
| 15. පොල්තෙල්/එළවළු තෙල් | 6.60 | 6.70 | 7.00 | 6.77 |
| 16. කිරිපිටි | 4.25 | 3.45 | 2.25 | 3.32 |
| 17. කුළුබඩු | 6.90 | 7.00 | 6.70 | 6.87 |
| 18. රතුළූනු/ලොකු ළූනු | 6.90 | 6.90 | 4.00 | 5.93 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

වගු අංක 5.4 : සතියේ ආහාර පරිභෝජන රටාව (දින ගණන් වලින්)

| අනු අංකය | ආහාර වර්ගය | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සම්පූර්ණ නියැදිය |
|---|---|---|---|---|---|
| 01 | ධාන්‍ය සහ අල වර්ග | 7.00 | 7.00 | 7.00 | 7.00 |
| 02 | මාංශ බෝග | 3.90 | 3.29 | 2.78 | 3.32 |
| 03 | සත්ව ආහාර | 4.97 | 2.44 | 1.34 | 2.92 |
| 04 | එළවළු | 6.90 | 6.70 | 7.00 | 6.87 |
| 05 | පලතුරු | 4.20 | 3.25 | 1.50 | 2.98 |
| 06 | සීනි සහ පැණිරස කෑම | 4.90 | 5.80 | 6.90 | 5.87 |
| 07 | තෙල් සහ මේද | 6.75 | 6.80 | 5.50 | 7.00 |
| 08 | කිරි ආහාර | 4.25 | 3.45 | 2.25 | 3.32 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ඉහත වගුවට අනුව නාගරික අංශයේ ගෘහ ඒකක විසින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පරිභෝජනය කරන සාමාන්‍ය දින ගණනට සාපේක්ෂව ග්‍රාමීය සහ වතු අංශයේ ගෘහ ඒකක විසින් පරිභෝජනය කරනු ලබන සාමාන්‍ය දින ගණන අඩුය. ඒ අනුව ඔවුන් ලබන පෝෂණ මට්ටමද සාපේක්ෂව පහළ මට්ටමක පවතී. ඒ ඒ අංශයේ ගෘහ ඒකක විසින් සපුරා ගන්නා පෝෂණ තත්ත්වය තුලනාත්මක ආහාර පරිභෝජන මට්ටම (food consumption score) වගුව 5.5 මඟින් පැහැදිලි වේ (ලෝක ආහාර වැඩසටහන මඟින් ගොඩනගා ඇති ආකෘතිය අනුව තක්සේරු කර තිබේ).

වගු අංක 5.5 : ඒ ඒ අංශයේ තුලනාත්මක ආහාර පරිභෝජන මට්ටම

| විස්තරය | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සම්පූර්ණ නියැදිය |
|---|---|---|---|---|
| ආහාර පරිභෝජන මට්ටම (සාමාන්‍යය) | 73.6 | 66.5 | 47.0 | 64.2 |
| සම්පූර්ණ නියැදිය=100 | 117.9 | 103.6 | 73.2 | 100.0 |
| නාගරික=100 | 100.0 | 90.4 | 63.9 | 87.2 |
| ග්‍රාමීය=100 | 110.7 | 100.0 | 70.7 | 96.5 |
| වතු අංශය=100 | 156.6 | 139.1 | 100.0 | 136.6 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

සම්පූර්ණ නියැදියේ ආහාර පරිභෝජන මට්ටම පිළිබඳ අගයට සාපේක්ෂව වතු අංශයේ ගෘහ ඒකකවල ආහාර පරිභෝජන මට්ටම සැලකිය යුතු ලෙස පහළ අගයක පවතී.

### 5.3.1 ධාන්‍ය සහ අල වර්ග පරිභෝජනය

මෙහිදී ධාන්‍ය සහ අල වර්ග යටතට ගැනෙන ප්‍රධාන ආහාර ද්‍රව්‍ය වනුයේ සහල්, පාන්, තිරිඟු පිටි නිෂ්පාදන, බඩඉරිඟු, මඤ්ඤොක්කා, බතල සහ වෙනත් අල වර්ග වේ. සහල් පරිභෝජනය ප්‍රධාන ආහාරය වන අතර එය දින 07දීම සෑම අංශයකම ගෘහ ඒකක විසින් පරිභෝජනයට ගැනේ. ග්‍රාමීය අංශයේදී දින හතේදීම සහල් පරිභෝජනයට ගනු ලබන අතරම වෙනත් ධාන්‍ය වර්ගයක් ලෙස තිරිඟු පිටි නිෂ්පාදන පරිභෝජනයට ගැනීම (පාන් හෝ තිරිඟු පිටි නිෂ්පාදන) දින එකකි. අනෙකුත් ධාන්‍ය වර්ග පරිභෝජනයට ගැනෙනුයේ අල්ප වශයෙනි. මඤ්ඤොක්කා, බතල වැනි වෙනත් සාම්ප්‍රදායික අල වර්ග පරිභෝජනය ඉතා සීමිතය (එය දින එකක් හෝ ඊට අඩු අගයක් ගනු ලැබේ). නාගරික අංශයේ සහ වතු අංශයේ පාන් සහ තිරිඟු පිටි නිෂ්පාදන පරිභෝජනය සාපේක්ෂව ඉහළය. එය පිළිවෙළින් සතියට දින දෙකක් සහ තුනක් පමණ වේ. වතු අංශයේදී සෑම දිනකම එක් වේලක් අනිවාර්යයෙන්ම තිරිඟු පිටිවලින් සැකසූ ආහාර පරිභෝජනය කරයි. ලෝක ආහාර සංවිධානය මගින් ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය තක්සේරු කිරීම පිළිබඳව සිදුකර ඇති අධ්‍යයනයකට අනුව, "දේශීය ශුද්ධ අලවර්ග ආදියෙහි නිෂ්පාදනය අඩුවෙමින් පවතී. අතිරේක ඉල්ලුම සපුරාලනු ලබන්නේ තිරිඟු ආනයනය මගිනි" (WFP) Sri Lanka Food Security Assessment, based on the intergrated Food Security and Humanitarian Phase Classification Approach, 2007).

### 5.3.2 මාංශ බෝග පරිභෝජනය

මාංශ බෝග පරිභෝජනය අතර ප්‍රධාන වනුයේ පරිප්පු පරිභෝජනයයි. සෑම අංශයක් විසින්ම පරිප්පු පරිභෝජනය කරන අතර එහි මිල ඉහළ යාමත් සමඟ වතු අංශයේ ගෘහ ඒකකවල පරිප්පු පරිභෝජනය සාපේක්ෂව පහළ ගොස් තිබේ. එය දින දෙකක් හෝ තුනක් පමණ වේ.

අනෙකුත් මාංශ භෝග වර්ග (මුංඇට, කව්පි) පරිභෝජනය ඉතා සීමිතය. ඒවායේ මිල ඉහළ මට්ටමක පැවතීම සහ එම වර්ගයන්ගේ දේශීය නිෂ්පාදනය පහළ මට්ටමක පැවතීම ඒ සඳහා හේතු වී තිබේ. මාංශ භෝග පරිභෝජනය සාපේක්ෂව පහළ මට්ටමක පැවතීම පිළිබඳ තොරතුරු වගු අංක 5.6 මගින් පැහැදිලි වේ.

වගු අංක 5.6 : සතිය තුළ මාංශ භෝග පරිභෝජනය නොකළ ගෘහ ඒකක ප්‍රතිශතය

| විස්තරය | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | *සම්පූර්ණ නියැදිය* |
|---|---|---|---|---|
| මාංශ භෝග පරිභෝජනය නොකළ ගෘහ ඒකක | 44.3 | 53.0 | 60.3 | *47.2* |
| සම්පූර්ණ නියැදිය=100 | 93.8 | 112.3 | 127.8 | *100.0* |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009)

## 5.3.3 සත්ව ආහාර පරිභෝජනය

පෝෂණ වටිනාකම අනුව සත්ව ආහාර පරිභෝජනය ඉතා වැදගත් වේ. මෙම අධ්‍යයනයේදී සත්ව ආහාර යටතේ මස්, මාළු, බිත්තර සහ කරවල පරිභෝජනය සැලකිල්ලට ගනු ලැබිය. නාගරික ගෘහ ඒකකවලට සාපේක්ෂව අනෙකුත් අංශයන්හි ගෘහ ඒකකවල මස් පරිභෝජනය සීමිතය. එය නාගරික අංශයේදී එක් දිනක් පමණ වන අතර අනෙකුත් අංශයන්හිදී එක් දිනකට වඩා අඩුවේ. මාළු පරිභෝජනය ඉහළම අගයක් ගනු ලබන්නේ ධීවර ගෘහ ඒකකවලය. එය දින පහක් හෝ හයක් වේ. නාගරික අංශයේ මාළු පරිභෝජනයද සාපේක්ෂව ඉහළ අගයක් ගනු ලබන අතර එය සතියකට දින දෙකක් හෝ තුනක් පමණ වේ. අනෙකුත් අංශයන්ගේ මාළු පරිභෝජනය සාපේක්ෂව පහළ අගයක් ගනු ලැබේ. එය දින එකකට පහළය. බිත්තර පරිභෝජනය සෑම අංශයකදීම පහළ අගයක් ගනු ලබන අතර නාගරික අංශයේදී එය එක් දිනක් පමණ වේ. කරවල පරිභෝජනය ග්‍රාමීය අංශයේදී සාපේක්ෂව ඉහළ අගයක් ගනු ලබන අතර එය දින එකකට වඩා ඉහළය. අනෙකුත් අංශවලදී එය දින එකකට වඩා පහළ අගයක් ගනී. මස්, මාළු, බිත්තර සහ කරවල පරිභෝජනය පහළ මට්ටමක පැවතීම පිළිබඳව තොරතුරු වගු අංක 5.7 මගින් පැහැදිලි වේ.

වගු අංක 5.7 : මස්, මාළු, බිත්තර සහ කරවල පරිභෝජනය නොකළ ගෘහ ඒකක ප්‍රතිශතය

| විස්තරය | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සම්පූර්ණ නියැදිය |
|---|---|---|---|---|
| මස්, මාළු, බිත්තර සහ කරවල පරිභෝජනය නොකළ ගෘහ ඒකක | 42.6 | 44.3 | 78.6 | 49.2 |
| සම්පූර්ණ නියැදිය=100 | 86.6 | 90.0 | 159.8 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

### 5.3.4 එළවළු සහ පලතුරු පරිභෝජනය

එළවළු සහ කොළ එළවළු මේ යටතට ගැනේ. බත් හැරුණු විට දින 7 තුළම පරිභෝජනයට ගන්නා ආහාර ද්‍රව්‍යය ලෙස එළවළු සැලකිය හැකිය. එළවළු පරිභෝජනයේ සාමාන්‍ය දින ගණන හයක් හෝ හතක් වේ. පලතුරු පරිභෝජනයේ සාමාන්‍ය දින ගණන දෙකකි. එය සාපේක්ෂව නාගරික සහ ග්‍රාමීය අංශයේදී ඉහළ අගයක් ගනු ලැබේ. එය දින තුනේ සිට හතර අතර අගයක් ගන්නා අතර වඩාත් පහසුවෙන් ලබාගන්නා පලතුරු වර්ගය කෙසෙල් වේ. දෙවනුව පැපොල් පරිභෝජනයට ගනී.

### 5.3.5 තෙල් සහ මේද පරිභෝජනය

තෙල් සහ මේද පරිභෝජනය යටතට ගැනෙන ප්‍රධාන ආහාර වන්නේ පොල් සහ පොල්තෙල් පරිභෝජනයයි. සෑම අංශයකම ගෘහ ඒකක විසින් තම ආහාර සැකසීම සඳහා දින 7 තුළදීම පොල් හෝ පොල්තෙල් භාවිතයට ගැනේ. වතු අංශයේදී පොල් පරිභෝජනයට වඩා පොල්තෙල් පරිභෝජනය ඉහළ මට්ටමක පවතී. ශීත අධික වතු ආශ්‍රිත පරිසරයේ පොල් කිරි ලබාගැනීම දුෂ්කරවීම ඒ සඳහා හේතු වී තිබේ. වෙනත් තෙල් වර්ග භාවිතය ඉතා සීමිතය.

### 5.3.6 සීනි පරිභෝජනය

සීනි සහ පැණිරස කෑම මේ යටතට ගැනේ. සීනි පරිභෝජනයද සෑම අංශයකදීම ඉහළ අගයක් ගනු ලබන අතර එය දින හයක් පමණ වේ. වතු අංශයේ සීනි පරිභෝජනය අනෙකුත් අංශවලට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බව අනාවරණය විය. වතු ආශ්‍රිත ජනතාවගේ ශරීර නිතරම උණුසුම්ව තබාගැනීම සඳහා නිතරම තේ කහට සමග සීනි පරිභෝජනය කිරීම වතු අංශයේ සීනි පරිභෝජනය ඉහළ මට්ටමක පැවතීමට හේතු වී ඇත. නාගරික අංශයේ සීනි පරිභෝජනය සාපේක්ෂව පහළ අගයක් ගනී.

### 5.3.7 කිරි පිටි පරිභෝජනය

කිරිපිටි පරිභෝජනය නාගරික අංශයේදී සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා අතර එහි සාමාන්‍යය දින හතරක් පමණ වේ. ග්‍රාමීය අංශයේදී එය දින තුනක් වන අතර අනෙකුත් අංශවලදී එහි අගය සාපේක්ෂව පහළය. සමස්ත නියැදිය සම්බන්ධයෙන් එහි අගය දින 3කි. කිරි පිටි මිල ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් නාගරික පැල්පත් සහ වතු අංශයේ දිළිඳු ජනතාව තම ගෘහයන්ගේ ළමයින් සඳහා පමණක් කිරි පිටි ලබාදෙන අතර සුළු ප්‍රමාණයේ වූ කිරි පිටි පැකට් (ග්‍රෑම් 50) දින දෙක තුනකට වරක් මිලදී ගනී. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මගින් සිදුකරන ලද 2006/2007 ජනගහනය සහ සෞඛ්‍ය සමීක්ෂණයට අනුව, කිරි පිටි පරිභෝජනය මව්වරුන්ගේ අධ්‍යාපනය සහ ආදායම මත පදනම්ව ඇත. වතු අංශයේ පරිභෝජනය තුළ සියළුම ප්‍රෝටීන් මූලාශ්‍රයන් එනම් කිරි, මස්, මාංශ බෝග සහ මාංශ බෝග ආශ්‍රිත නිෂ්පාදන සහ චීස්, යෝගට් පරිභෝජනය ග්‍රාමීය සහ නාගරික අංශයන්ට වඩා පහළ අගයක් ගනී.

## 5.4 ප්‍රධාන ආහාරය සපයාදෙන මූලාශ්‍ර

ප්‍රධාන ආහාරය සඳහා සහල් ලබාගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙකකි. එනම් තමාගේම නිෂ්පාදන ප්‍රයෝජනයට ගැනීම සහ වෙළෙඳපොළෙන් මිලට ගැනීමයි. ග්‍රාමීය අංශයේදී තමාගේම නිෂ්පාදන පරිභෝජනයට ගැනීම එම අංශයේ ගෘහ ඒකක සංඛ්‍යාවෙන් අඩක් ඉක්මවා (53%) තිබේ. වතු අංශයේ ගෘහ ඒකක තම ප්‍රධාන ආහාරය සපයාගනු ලබන්නේ සම්පූර්ණයෙන්ම (100%) වෙළඳපොළෙන් මිලට ගැනීමෙනි. සහල් වෙළඳපොළෙන් මිලට ගැනීමේ අවම ප්‍රතිශතය ග්‍රාමීය අංශය (47%) වාර්තා කරයි. සමස්ත නියැදියෙන් 87%ක් තම ප්‍රධාන ආහාරය වන සහල් ලබාගන්නේ වෙළෙඳපොළින් මිලට ගැනීමෙනි. අත්‍යාවශ්‍ය වෙනත් ආහාර ද්‍රව්‍ය බොහොමයක් ලබාගන්නා මූලාශ්‍රය වන්නේද වෙළෙඳපොළයි. සම්පූර්ණ නියැදියම එළවළු පරිභෝජනය කරන අතර එයින් 14%ක් තමාගේ නිෂ්පාදන පරිභෝජනයට ගනු ලැබේ. ඉතිරිය (86%) වෙළෙඳපොළින් මිලට ගැනීමෙන් පරිභෝජනය කරයි. තමා විසින්ම නිෂ්පාදනය කළ මාංශ බෝග පරිභෝජන ප්‍රතිශතය 8%ක් වන අතර 92%ක් මිලට ගැනීමෙන් පරිභෝජනය කරයි (ඇමුණුම 2).

වගු අංක 5.8 : ප්‍රධාන ආහාරය වන සහල් ලබාගන්නා ප්‍රධාන මූලාශ්‍ර

| අංශය | ස්වයං නිෂ්පාදන | | මිලට ගැනීමෙන් | | එකතුව සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | |
| නාගරික | 1 | 2.00 | 49 | 98.00 | 50 |
| ග්‍රාමීය | 80 | 53.33 | 70 | 46.67 | 150 |
| වතු | - | - | 50 | 100.00 | 50 |
| එකතුව | 81 | 32.40 | 169 | 67.60 | 250 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 5.5 ආහාර පරිභෝජනයේ මට්ටම අධ්‍යයන නියැදිය සඳහා අදාළ කරගැනීම

නියැදියට අදාළ සෑම ගෘහ ඒකකයකම ආහාර පරිභෝජන රටාව අධ්‍යයනය කරන විට තම දෛනික ආහාර වේල සැකසීමේදී දින හතේදීම පොල් හෝ පොල්තෙල් භාවිතා කරයි. ඒ අනුව දින හතේදීම පොල් හෝ පොල්තෙල් පරිභෝජනයට ගැනේ. එමෙන්ම සීනි පරිභෝජනයද ඉහළ මට්ටමක පවතී. එහි සාමාන්‍ය 6.7ක් පමණ වේ. එබැවින් ලෝක ආහාර වැඩසටහන මගින්

හඳුන්වාදී ඇති ආකෘතිය අනුව ආහාර පරිභෝජනයේ මට්ටම තක්සේරු කිරීමේදී පරිභෝජන මට්ටම පිළිබඳ ප්‍රමිතීන් අධ්‍යයන නියැදියට අදාළ පරිභෝජන රටාව අනුව සකස් කරගත් අතර නව ප්‍රමිතියක් ගොඩනගා ගත්තා ලදී. එහිදී අවම ආහාර පරිභෝජන මට්ටමේදී දින හතේදීම බත් සමඟ එළවළුද තෙල් සහ මේද සහ සීනි පරිභෝජනය කළේයයි උපකල්පනය කරන ලදී (7x2+7x1+7x0.5+7x0.5=28). දින හතේදීම ප්‍රධාන ආහාරය සමඟ එළවළු සහ දින හතරක් මාංශ බෝග, දින හත සඳහාම තෙල් සහ මේද සහ සීනි පරිභෝජනය කළේයයි උපකල්පනය කොට අවම ආහාර පරිභෝජන මට්ටම සීමාවේ ආහාර පරිභෝජනය තක්සේරු කරන ලදී (7x2x7x1+4x3+7x0.5+7x0.5=40).

වගු අංක 5.9 : ආහාර පරිභෝජනයේ මට්ටම (අධ්‍යයන නියැදිය සඳහා අදාළ කරගත් නව ප්‍රමිතිය අනුව)

| ආහාර පරිභෝජන කාණ්ඩය | ප්‍රමිතිය (WFP) | නව ප්‍රමිතිය (අධ්‍යයන නියැදිය) | සම්පූර්ණ නියැදියෙන් % වශයෙන් |
|---|---|---|---|
| අවම මට්ටමේ පරිභෝජනය | 0-21 | 0-28 | 4.4 |
| අවම මට්ටම සීමාවේ පරිභෝජනය | 21.5-3.5 | 28.5-40 | 9.6 |
| පිළිගත හැකි මට්ටමේ පරිභෝජනය | >35 | >40 | 86.0 |

මූලාශ්‍රය: ලෝක ආහාර වැඩසටහන, (2008).

## අවම මට්ටමේ ආහාර පරිභෝජනය

සම්පූර්ණ නියැදිය සම්බන්ධයෙන් සලකා බලනවිට අවම මට්ටමේ ආහාර පරිභෝජනය නැත්නම් ස්වල්ප වශයෙන් ආහාර පරිභෝජනය කරන ගෘහ ඒකක සංඛ්‍යාව 4.4%කි. එම ගෘහ ඒකක වඩාත්ම ආහාර අනාරක්ෂිතභාවයට පත්වූ ගෘහ ඒකක ප්‍රතිශතය ලෙස සැලකේ. මෙම ගෘහ ඒකක පෝෂණ වටිනාකමින් ඉහළ මාංශ බෝග හෝ සත්ව ආහාර කලාතුරකින් පරිභෝජනය කරන්නෝ වෙති. එම ගෘහ ඒකකයන්ගේ ඉහළ ව්‍යාප්තියක් දක්නට ඇත්තේ වතු අංශයේ ගෘහ ඒකකයන් සම්බන්ධයෙනි. එය 16%ක් වූ ප්‍රතිශතයක් ගනු ලැබේ.

වගු අංක 5.10 : ඒ ඒ අංශයෙහි අවම මට්ටමේ ආහාර පරිභෝජනය කරන ගෘහ ඒකක ප්‍රතිශතය

| ආහාර පරිභෝජන කාණ්ඩය | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සම්පූර්ණ නියැදිය |
|---|---|---|---|---|
| අවම මට්ටමේ ආහාර පරිභෝජනය | 2.00 | 2.00 | 16.00 | 4.4 |
| සම්පූර්ණ නියැදිය=100 | 45.45 | 45.45 | 363.6 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

### අවම මට්ටම් සීමාවේ ආහාර පරිභෝජනය

සමස්ත නියැදිය සම්බන්ධයෙන් අවම මට්ටම් සීමාවේ ආහාර පරිභෝජනය කරන ගෘහ ඒකක සංඛ්‍යාව 9.6%කි. මෙම ගෘහ ඒකකද ආහාර අනාරක්ෂිතභාවයට පත්වී සිටී. මෙම ගෘහ ඒකකයන්ගේ ආංශික සංයුතිය අනුව වැඩිම ව්‍යාප්තිය දක්නට ඇත්තේ නැවතත් වතු අංශයේය. එය 26%කි.

වගු අංක 5.11 : ඒ ඒ අංශයෙ හි අවම මට්ටම් සීමාවේ ආහාර පරිභෝජනය කරන ගෘහ ඒකක ප්‍රතිශතය

| ආහාර පරිභෝජන කාණ්ඩය | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සම්පූර්ණ නියැදිය |
|---|---|---|---|---|
| අවම මට්ටමේ සීමාවේ ආහාර පරිභෝජනය | 4.00 | 2.67 | 26.00 | 9.6 |
| සම්පූර්ණ නියැදිය=100 | 41.66 | 27.81 | 270.83 | 100.00 |

මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

### පිළිගත හැකි මට්ටමේ ආහාර පරිභෝජනය

සම්පූර්ණ නියැදිය සම්බන්ධයෙන් පිළිගත හැකි මට්ටමේ ආහාර පරිභෝජන ප්‍රතිශතය 86%කි. ඔවුන්ගේ ආහාර පරිභෝජනය යහපත් සෞඛ්‍ය මට්ටමක් පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් වේ යයි සැලකේ. මෙම කාණ්ඩයෙහි ඉහළම ප්‍රතිශතයක් වාර්තා වන්නේ පිළිවෙළින් ග්‍රාමීය සහ නාගරික අංශයෙහිය. වතු අංශයේ, ගෘහ ඒකකයන්ගේ පිළිගත හැකි මට්ටමේ ආහාර පරිභෝජන ප්‍රතිශතය සමස්ත නියැදි අගයට වඩා පහළ අගයක් ගනු ලැබේ (වගු අංක 5.12).

වගු අංක 5.12 : ඒ ඒ අංශයන්හි පිළිගත හැකි ආහාර පරිභෝජන මට්ටමක සිටින ගෘහ ඒකකයන්ගේ ප්‍රතිශතය

| ආහාර පරිභෝජන කාණ්ඩය | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සම්පූර්ණ නියැදිය |
|---|---|---|---|---|
| පිළිගත හැකි ආහාර පරිභෝජන මට්ටම | 94.00 | 95.33 | 58.00 | 86.00 |
| සම්පූර්ණ නියැදිය=100 | 109.30 | 110.84 | 67.44 | 100.00 |

මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 5.6 ඒ ඒ අංශයේ ආහාර අනාරක්ෂිතභාවය

ඇස්තමේන්තු කරන ලද ආහාර පරිභෝජන මට්ටම අනුව අවම මට්ටමේ සහ අවම මට්ටම් සීමාවේ ආහාර පරිභෝජන මට්ටමක සිටින ගෘහ ඒකක ආහාර අනාරක්ෂිතභාවයට පත්ව සිටී.

ඇස්තමේන්තු කරන ලද දත්ත අනුව අතිශයින්ම පීඩාවන්ට ගොදුරු වූ (vulnerable) ගෘහ ඒකක සංඛ්‍යාව සමස්ත නියැදිය සම්බන්ධයෙන් 4.4%කි. එසේ වුවද, ආංශික වශයෙන් එය විවිධත්වයක් ගනු ලැබේ. එහි ඉහළම අගය වාර්තා වන්නේ වතු අංශයේ ගෘහ ඒකක සඳහාය. එය 16%ක් අගයක් ගනු ලැබේ.

ආහාර අනාරක්ෂිතභාවයට පත්ව සිටින ඊළඟ ගෘහ ඒකක වන්නේ අවම මට්ටම් සීමාවේ ආහාර පරිභෝජන මට්ටමක් පවත්වාගෙන යන ගෘහ ඒකක වේ. එහි ප්‍රතිශතය සමස්ත නියැදිය සම්බන්ධයෙන් 9.6%කි. ආංශික විශ්ලේෂණයේදී එහි ඉහළම අගය (26%) වාර්තා වන්නේ වතු අංශයේය. වතු අංශයේ ගෘහ ඒකක ලබන ආදායම සාපේක්ෂව පහළ අගයක් ගැනීම මේ සඳහා ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැකිය.

වගු අංක 5.13 : ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකක සංඛ්‍යාව (%)

| ආහාර පරිභෝජන කාණ්ඩය | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සම්පූර්ණ නියදිය |
|---|---|---|---|---|
| අවම මට්ටමේ ආහාර පරිභෝජනය | 2.00 | 2.00 | 16.00 | 4.4 |
| අවම මට්ටම සීමාවේ ආහාර පරිභෝජනය | 4.00 | 2.67 | 26.00 | 9.6 |
| ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකක සංඛ්‍යාව (%) | 6.00 | 4.67 | 42.00 | 14.00 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකක සංඛ්‍යාව 14%කි. එසේ වුවද, අංශ වශයෙන් සැලකීමේදී වඩාත් ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇත්තේ වතු අංශයේ ගෘහ ඒකක වේ. එම අංශයේ ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකක සංඛ්‍යාව 42%කි. එය සමස්ත නියැදි ව්‍යාප්තියේ අගයන්ට සාපේක්ෂව සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු (significantly) ලෙස වෙනස් වන්නේද යන්න පරීක්ෂා කළ අතර එය ($P < 0.05$) වෙසෙසියා මට්ටමේදී 5.702ක අගයක් ගනී. එම නිසා වතු අංශයේ ආහාර අනාරක්ෂිතභාවය සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතින බව නිගමනය කළ හැකි වේ.

වගු අංක 5.14 : දෛනිකව කම්කරුවෙකු ලබන සාමාන්‍ය වැටුප රු. (අංශ වශයෙන්)

| අංශය | 2007 | 2008 |
|---|---|---|
| නාගරික අංශය | 372.00 | 406.00 |
| ග්‍රාමීය අංශය | 448.00 | 557.00 |
| වතු අංශය | 251.00 | 291.00 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

වතු අංශයේ කම්කරුවකු දෛනිකව ලබන වැටුප නාගරික සහ ග්‍රාමීය අංශයේ කම්කරුවකු දෛනිකව ලබන වැටුප හා සැසදීමේදී ඉතා පහළ අගයක් ගනු ලැබේ.

වගු අංකය 5.15 : ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකක සංඛ්‍යාව සහ පුද්ගලයන් සංඛ්‍යාව (අංශ වශයෙන්)

| ආහාර පරිභෝජන මට්ටම | | නාගරික අංශය | ග්‍රාමීය අංශය | වතු අංශය | සම්පූර්ණ නියැදිය |
|---|---|---|---|---|---|
| අවම ආහාර පරිභෝජන මට්ටම | ගෘහ ඒකක සංඛ්‍යාව | 1 | 3 | 8 | 12 |
| | % වශයෙන් | 5.88 | 17.65 | 47.06 | 100 |
| | ජනගහනය | 4 | 13 | 49 | 66 |
| අවම ආහාර පරිභෝජන මට්ටම සීමාවේ | ගෘහ ඒකක සංඛ්‍යාව | 2 | 4 | 13 | 19 |
| | % වශයෙන් | 6.45 | 12.90 | 41.94 | 100 |
| | ජනගහනය | 9 | 18 | 80 | 107 |
| එකතුව | ගෘහ ඒකක සංඛ්‍යාව | 3 | 7 | 21 | 31 |
| | ජනගහනය | 13 | 31 | 129 | 173 |
| ගෘහ ඒකකයේ සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව | | 4.48 | 4.48 | 6.12 | 5.02 |
| ආහාර අනාරක්ෂිතභාවය (%) | | 6 | 5 | 42 | 14 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

සමස්ත ජනගහනයෙන් 14%ක් ආහාර අනාරක්ෂිතභාවයට පත්වී සිටී. ආංශික විශ්ලේෂණය අනුව වඩාත්ම ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇත්තේ වතු අංශයේ ගෘහ ඒකක වේ. වතු අංශයේ සමස්ත ජනගහනයෙන් 42%ක් ආහාර අනාරක්ෂිතභාවයට පත්වී සිටී. ආහාර මිල ඉහළයාම නිසා මෙම ජන කොට්ඨාස ආහාර අනාරක්ෂිතභාවය සම්බන්ධයෙන් වඩාත් අවධානමට ලක්වී සිටී. ප්‍රතිපත්ති සකස් කරන්නන් විසින් පීඩාවට පත්වී ඇති ජනතාව එයින් මුදවා ගැනීම සඳහා වැඩසටහන් සැකසීමේදී වඩාත් පීඩාවට ලක්වී ඇති ජන කොට්ඨාස කෙරෙහි ප්‍රමුඛතාවය දී කටයුතු කළ යුතු වේ. සීමිත සම්පත් ප්‍රමුඛතාවයෙන් යුතුව වෙන් කිරීමේදී වඩාත් දිළිඳු ජන කණ්ඩායම් ඉලක්ක කළ යුතුය. නොඑසේ නම්, ඔවුන් පහසුවෙන් "දුගී බවේ විෂම චක්‍රයට" හසුවී සමාජීය වශයෙන් ආන්තික සමාජ කණ්ඩායම් බවට පත්වීමට ඇති ඉඩප්‍රස්ථා ඉහළය. එය වළකාලීම සඳහා ප්‍රතිපත්ති සකස් කරන්නන්ගේ අවධානය යොමු කළ යුතු වේ.

ආහාර අනාරක්ෂිතභාවය සහ නිෂ්පාදනයේ කාලීන වෙනස්වීම් (seasonal fluctuation) අතර සෘජු සම්බන්ධතාවයක් පවතී. අවම මට්ටම සීමාවේ ආහාර පරිභෝජන මට්ටමක් පවත්වාගෙන යන ගෘහ ඒකක හා පිළිගත හැකි මට්ටමක ආහාර පරිභෝජන මට්ටමක් පවත්වාගෙන යන ගෘහ ඒකක සම්බන්ධයෙන් මෙය සෘජුව බලපානු ලැබේ. නිෂ්පාදන වාරයේදී අවම සීමාවේ ආහාර පරිභෝජන මට්ටමක් පවත්වාගෙන යන ගෘහ ඒකකවලින් කොටසක් වඩා යහපත් පරිභෝජන මට්ටමක් (පිළිගත හැකි ආහාර පරිභෝජන මට්ටමක්) දක්වා ඔහුගේ පරිභෝජන මට්ටම ඉහළට විතැන්විය හැකිය. ඒ අතර නිෂ්පාදනය අවාරයේදී යහපත් නැත්නම් පිළිගත හැකි ආහාර

පරිභෝජන මට්ටමක් පවත්වාගෙන යන ගෘහ ඒකකවලින් කොටසකගේ ආහාර පරිභෝජන මට්ටම එයින් පහළට විතැන් වීමේ හැකියාවක් පවතී. ඒ අනුව ඔවුන් අවම සීමාවේ ආහාර පරිභෝජනය කරන්නන්ගේ කාණ්ඩයට තල්ලුවේ. විශේෂයෙන්ම අවාරයේ (වාරකන් සමයේ) මත්ස්‍ය නිෂ්පාදනයේදී මෙම තත්ත්වය ධීවර ජනතාව සම්බන්ධයෙන් දක්නට ලැබේ.

## 5.7 සාරාංශය

සෑම අංශයකම ගෘහ ඒකක විසින් බොහෝවිට දින හතේදීම වේල් දෙකක් ප්‍රධාන ආහාරය වශයෙන් බත් පරිභෝජනය කරන අතර ග්‍රාමීය අංශයේ ගෘහ ඒකක විසින් බොහෝවිට තුන් වේලම බත් පරිභෝජනය කරනු ලැබේ. සහල් පරිභෝජනයට අතිරේකව පරිභෝජනය කරන ප්‍රධාන ආහාරය වන්නේ තිරිඟු පිටිවලින් සැකසූ ආහාර (පාන්, ඉදිආප්ප, රොටි) වේ. වතු අංශයේ ගෘහ ඒකක විසින් සෑම දිනකම එක් වේලක් තිරිඟු පිටිවලින් සැකසූ රොටි පරිභෝජනයට ගනු ලැබීම සාමාන්‍ය ලක්ෂණයකි. ඇතැම් විට ඔවුන් දහවල් වේල සඳහාද තිරිඟු පිටි නිෂ්පාදන පරිභෝජනයට ගනී. සාම්ප්‍රදායික අල වර්ග හෝ මුංඇට, කව්පි, කුරක්කන් යන වෙනත් ආහාර පරිභෝජනයට ගැනීම සැලකිය යුතු ලෙස පහළ වැටී තිබේ. සෑම අංශයකම ගෘහ ඒකක විසින් එළවළු පරිභෝජනය කරනු ලබයි. නාගරික ගෘහ ඒකක හැර අනෙකුත් අංශයන්ගේ ගෘහ ඒකකවල සත්ව ආහාර පරිභෝජනය සාපේක්ෂව පහළ අගයක් ගනී. කරවල පරිභෝජනය ග්‍රාමීය ගෘහ ඒකක සම්බන්ධයෙන් සාපේක්ෂව ඉහළ අගයක් ගනු ලැබේ. බිත්තර පරිභෝජනය සෑම අංශයකම පහළ මට්ටමක පවතී. නාගරික අංශයේදී එය අනෙකුත් අංශවලට සාපේක්ෂව ඉහළ අගයකි. කිරි පිටි පරිභෝජනය පහළ ගොස් ඇති අතර දිළිඳු ජනතාව විසින් ඔවුන්ගේ ළමුන් සඳහා පමණක් කිරි පිටි ලබාදීම සිදු කෙරේ. වතු අංශයේ සීනි පරිභෝජනය සාපේක්ෂව ඉහළය. තේ පානය ඉහළ මට්ටමක පැවතීම ඔවුන්ගේ ආහාර පුරුදු අතර වැදගත් වීම එයට හේතු වේ.

ඇස්තමේන්තු කරන ලද තුලනාත්මක ආහාර පරිභෝජන මට්ටම අනුව, සමස්ත නියැදියේ සාමාන්‍යයට සාපේක්ෂව වතු අංශයේ ආහාර පරිභෝජන මට්ටම සැලකිය යුතු මට්ටමක පහළ අගයක් ගනී. සමස්ත නියැදියේ ගෘහ ඒකකවලින් 14%ක් ආහාර අනාරක්ෂිතභාවයට පත්වී සිටි. එසේ වුවද, වතු අංශයේ ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකක සංඛ්‍යාව 42%ක අගයක් ගන්නා අතර එය සමස්ත නියැදියේ අගය මෙන් තුන්ගුණයකි.

හය වැනි පරිච්ඡේදය

# ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමේ විභවතා සහ සීමාවන්

## 6.1 හැඳින්වීම

ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමේදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන නිර්නායක තුනක් පිළිබඳව අධ්‍යයනය ආරම්භයේදී සඳහන් කරන ලදී. ඒ අනුව ප්‍රමාණවත් ආහාර සැපයුමක් තහවුරු කිරීම, සෑම ස්ථානයකදීම සෑම විටක සියළුම ජන කොට්ඨාසයට අත්‍යාවශ්‍ය ආහාර ලබාගැනීමේ පහසුව සැලසීම සහ සෑම ජන කොට්ඨාසයකටම දැරිය හැකි මිලකට ආහාර මිලට ගැනීමේ හැකියාව තහවුරු කිරීම වැදගත්වේ. ප්‍රමාණවත් ආහාර සැපයුමක් සහතික කිරීමේදී දේශීය නිෂ්පාදනය ඉහළ දැමීම සහ ආනයනය ප්‍රධාන ස්ථානයක් ගනී. සෑම ස්ථානයකදීම හා සෑම විටකදීම සියළුම ජනතාවට අත්‍යාවශ්‍ය ආහාර ලබාගැනීමේ පහසුව සහතික කිරීම සඳහා කාර්යක්ෂම වෙළෙඳපොළක් මෙන්ම යහපත් බෙදාහැරීමේ ජාලයක් තහවුරු කළයුතු වේ. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය අත්‍යාවශ්‍ය කටයුත්තකි. දැරිය හැකි මිලකට ආහාර මිලට ගැනීමේ හැකියාව තහවුරු කිරීම සඳහා සමස්ත ආහාර සැපයුම ඉහළ දැමීම සහ ගෘහ ඒකක ආදායම ඉහළ දැමීම අත්‍යාවශ්‍ය වේ.

## 6.2 ප්‍රමාණවත් ආහාර සැපයුමක් තහවුරු කිරීම

ප්‍රමාණවත් ආහාර සැපයුමක් තහවුරු කිරීමේදී දේශීය නිෂ්පාදන සැපයුම මෙන්ම ආනයනය කරන ලද ආහාර තොග පිළිබඳවද අවධානය යොමු කළ යුතු වේ. දේශීයව වගා කළ නොහැකි ආහාර ද්‍රව්‍ය සහ අවාරයේදී ප්‍රමාණවත් නිෂ්පාදනයක් නොමැතිවිට ආනයනය මගින් පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට කටයුතු කළ යුතු වේ. දේශීය ආහාර සැපයුම ඉහළ දැමීම සඳහා වගා කළ හැකි ඉඩම් උපරිම ලෙස ඵලදායීතාවයකින් යුතුව භාවිතයට ගැනීම අත්‍යාවශ්‍ය වේ. මෙම අධ්‍යයනයේදී අවධානය යොමු වන්නේ දේශීය නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා ඇති විභවතාවන් සහ සීමාවන් පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහාය. එබැවින් මෙම අධ්‍යයනයේදී ගෘහ ඒකක සතු ඉඩම් පරිහරණය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබීය.

### 6.2.1 වගා කර ඇති ඉඩම්

ගෘහ ඒකක සතු ඉඩම් පරිහරණය පිළිබඳ තොරතුරුවලට අනුව, නාගරික සහ වතු අංශයේ ගෘහ ඒකක සතුව ඇත්තේ පර්චස් 20ට වඩා අඩු, වගා කිරීම සඳහා ප්‍රමාණවත් නොවූ ඉඩම් කැබලි වේ. එබැවින් මෙම අධ්‍යයනයේදී අවධානය යොමු වන්නේ ග්‍රාමීය අංශයේ ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් පමණි.


ග්‍රාමීය අංශයේ බොහෝ ගෘහ ඒකක සතුව වගා කළ හැකි ඉඩම් කට්ටි එකක් හෝ පවතී. කෙසේ වෙතත්, ඔවුන්ගෙන් 20% ක් වූ ගෘහ ඒකක සඳහා වගා කිරීමට ප්‍රමාණවත් ඉඩම් නොමැත. ග්‍රාමීය අංශයේ ඉඩම්වලින් 82%ක් වගා කර ඇත. ජලය නොමැති වීම, වන සතුන්ගේ හානි, යෙදවුම් මිල ගණන් ඉහළයාම, ඉඩම් වගා කිරීම සඳහා යොමුවීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම සහ වගා කිරීම සඳහා පවුලේ ශ්‍රමය නොමැති වීම වැනි සාධක ඉඩම් වගා නොකර අතහැර දැමීම සඳහා හේතු වී ඇත. වගා කර ඇති ඉඩම් ප්‍රමාණයෙන් 36%ක් වී නිෂ්පාදනය සඳහා වෙන්වී ඇති අතර වැඩිම බිම් ප්‍රමාණය වෙන්වී ඇත්තේ බහු වාර්ෂික බෝග නිෂ්පාදනය සඳහා වේ (52%). එම බහුවාර්ෂික බෝග බොහෝ විට තම ගෙවත්තෙහි වගා කර ඇති කොස්, පොල්, කෙසෙල් සහ දෛනික ජන ජීවිතයට අවශ්‍ය වෙනත් වගාවන්ගෙන් යුක්ත වේ. රත්නපුර දිස්ත්‍රික්කයේදී තේ වගාව ප්‍රධාන බහු වාර්ෂික බෝගය වේ. එළවළු වගා කර ඇති බිම් ප්‍රමාණය 12%ක් වන අතර, එහි ප්‍රධාන අරමුණ වෙළෙඳපොළට සැපයීමයි.

වගු අංක 6.1 : ග්‍රාමීය අංශයේ ගෘහ ඒකක සතු වගා කර ඇති බිම් කැබලි සංඛ්‍යාව

| ඉඩම් කැබලි ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 1 | 67 | 44.7 |
| 2 | 41 | 27.3 |
| 3 | 9 | 6.0 |
| 4 | 2 | 1.3 |
| 5 | 1 | 0.7 |
| ඉඩම් නොමැති | 30 | 20.0 |
| එකතුව | 150 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ප්‍රස්තාර අංක 6.1 : ග්‍රාමීය අංශයේ ගෘහ ඒකක සතු වගා කර ඇති බිම් කැබලි සංඛ්‍යාව (%)




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

### 6.2.2 ග්‍රාමීය අංශයේ ඉඩම් කැබලිවල සංයුතිය

ඉඩම් කට්ටිවල ප්‍රමාණය අනුව 34%ක්වූ බිම් ප්‍රමාණයක් අක්කර 1ට අඩුය. ඉඩම් කට්ටිවලින් 32%ක් අක්කර 1 – 2 අතර අගයක් ගනී. ඉතිරි 34%ක ප්‍රමාණය අක්කර 2ට වඩා වැඩිවේ.

### 6.2.3 ග්‍රාමීය අංශයේ ඉඩම් අයිතිය

වගා කරනු ලබන ඉඩම්වලින් 52%ක් ඔවුන්ට උරුමයෙන් නැත්නම් තෑගි වශයෙන් ලැබී ඇති ඉඩම් වේ. රජය මගින් ලබාදී ඇති ඉඩම්වල ප්‍රතිශතය 26%කි. මිලට ගත් ඉඩම් ප්‍රමාණය 12%ක් වේ. වගා කරනු ලබන ඉඩම්වලින් 17%ක් සඳහා අයිතිය පිළිබඳව කිසිදු හිමිකම්පතක් නොමැත.

### 6.2.4 ඉඩම් පිළිබඳ ගැටළු

වගා කරන ඉඩම් සම්බන්ධව වෙනත් පාර්ශවයන් හා ගැටළු ඇත්තේ 6%ක් වැනි සුළු ප්‍රතිශතයකටය. මෙම ගැටළු බොහෝවිට පවුලේ ඥාතීන් අතර ඉඩම් මායිම් සම්බන්ධයෙන් පැනනැගුණු ඒවා බව හඳුනාගත හැකි විය. එය ඔවුන්ගේ නිෂ්පාදනය අධෛර්යමත් වීම සම්බන්ධයෙන් කිසියම් බලපෑමක් ඇති කරයි.

## 6.3 ගෙවත්ත වගා කිරීම

### 6.3.1 ගෙවත්තේ ප්‍රමාණය

සමස්ත නියැදියේ ගෘහ ඒකකවලින් 42%ක් සඳහාම ඇත්තේ පර්චස් 20ට වඩා අඩු ප්‍රමාණයේ ගෙවත්තකි. ගෙවත්තේ ප්‍රමාණය පර්චස් 10ට අඩු ගෘහ ඒකක ප්‍රමාණය 30% ක් වන අතර එය වතු අංශයේ දී 92%ක් සහ නාගරික අංශයේදී 48%ක් (ආසන්න වශයෙන් එම අංශයේ ගෘහ ඒකක සංඛ්‍යාවෙන් අඩක්) වැනි ඉහළ අගයක් ගනී. වතු අංශයේ ගෘහ ඒකක එකිනෙකට යාබදව පිහිටි වතු නිවාස බැවින් ඔවුන් සඳහා වෙන්වූ ගෙවත්තේ ප්‍රමාණය ඉතාමත් සීමිතය. නාගරික අංශයේදී ගෘහ ඒකකවලින් 76%ක් සඳහාම පර්චස් 20ට අඩු ගෙවත්තක් ඇති අතර ග්‍රාමීය අංශයේදී ගෙවත්තේ ප්‍රමාණය අනෙකුත් සියළුම අංශවලට වඩා ඉහළය. ග්‍රාමීය අංශයේ 81%ක් සඳහා පර්චස් 40ට වඩා වැඩි ගෙවත්තක් තිබේ.

වගු අංක 6.2 : ගෘහ ඒකක සතු ගෙවත්තේ ප්‍රමාණය (%)

| ප්‍රමාණය | නාගරික | ග්‍රාමීය | වතු | එකතුව |
|---|---|---|---|---|
| පර්චස් 10 ට අඩු | 48.00 | 4.00 | 92.00 | 30.40 |
| 10-19 | 28.00 | 7.33 | 8.00 | 11.60 |
| 20-39 | 20.00 | 7.33 | | 8.40 |
| 40-79 | 4.00 | 20.00 | | 12.80 |
| 80-159 | | 28.00 | | 16.80 |
| 159 ට වැඩි | | 33.34 | | 20.00 |
| එකතුව | 10000 | 100.00 | 100.00 | 100.00 |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ගෙවත්ත වගාකර ඇති ප්‍රතිශතය සමස්ත නියැදියෙන් 55%කි. ග්‍රාමීය අංශයේ සහ වතු අංශයේ ගෙවතු වගා කර ඇති ගෘහ ඒකක ප්‍රතිශතය පිළිවෙළින් 69%ක් සහ 60%ක් වශයෙන් වාර්තා විය. ගෙවත්ත වගා කර ඇති ගෘහ ඒකකවලින් අඩුම ප්‍රතිශතය වාර්තා වන්නේ නාගරික අංශයේ ගෘහ ඒකක සම්බන්ධයෙනි. එය සාපේක්ෂව පහළ අගයක් ගනු ලැබිය (12%).

### 6.3.2 ගෙවත්ත වගා කිරීමේ ප්‍රධාන අරමුණ

ගෙවත්ත වගා කිරීමේ ප්‍රධාන අරමුණ ගෘහ පරිභෝජනය සඳහා ආහාර ද්‍රව්‍ය සපයා ගැනීමයි. එය සමස්ත නියැදියෙන් 67%ක ප්‍රතිශතයක් ගනු ලබන අතර එය ඔවුන්ගේ ආහාර සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් වැදගත් වේ. ග්‍රාමීය අංශයේදී 77%ක් පරිභෝජනය සඳහා ගෙවත්ත වගා කරන අතර ඉතිරිය (23%) අලෙවිය සඳහා වගා කරනු ලැබේ. වතු අංශයේදී තම ගෙවත්ත වගා කිරීමේ ප්‍රධාන අරමුණ අලෙවිය සඳහාය. එය 73%ක අගයක් ගන්නා අතර අතිරේක ආදායම් මාර්ගයක් ලෙස වතු අංශය සඳහා එය වැදගත් වේ.

## 6.4 කෘෂිකාර්මික නිෂ්පාදනයේ විභවතා

ඉහළ ආර්ථික ඵලදායිතාවයක් සහිතව වගා කළ හැකි අතිරේක ඉඩම් ඇත්තේ ග්‍රාමීය අංශයේ ගෘහ ඒකක සඳහා පමණි. ග්‍රාමීය අංශයේ ගෘහ ඒකකවලින් 17%ක් සඳහා වගා කළ හැකි අතිරේක ඉඩම් කිසිවක් නොමැති අතර වගා කළ හැකි අතිරේක ඉඩම්වලින් 17%ක් වගා කර නොමැත. ඒ අනුව වගා කර ඇති බිම් ප්‍රමාණය ගෘහ ඒකක සතු අතිරේක ඉඩම් ප්‍රමාණයෙන් 2/3ක් පමණ වේ. වගා කර ඇති බිම් ප්‍රමාණයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් ආර්ථිකමය වශයෙන් ඵලදායීව වගාවන් සඳහා වෙන්වී ඇත. එය සමස්ත වගාබිම් ප්‍රමාණයෙන් 36%ක් වී වගාව සහ 12%ක් එළවළු වගාවෙන් යුක්ත වේ. වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් අඩක්ම වගා කර ඇත්තේ බහු වාර්ෂික බෝග වේ. ක්‍රමානුකූලව වගා කර ඇති තේ (රත්නපුරය දිස්ත්‍රික්කය) හැර අනෙකුත් බොහොමයක් බහුවාර්ෂික බෝග මහින් කාලීනව (seasonal)

උපයාගනු ලබන නිශ්චිත ආදායමක් නැත. එය ආහාර සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් තම ඉඩම් පරිහරණයේ ඇති ප්‍රධාන සීමාව ලෙස හඳුනාගත හැකිවිය. ඉඩම් කට්ටිවල සංයුතිය අනුවද ආර්ථිකමය ඵලදායීතාවක් සහිත වගාබිම් ප්‍රමාණය මුළු වගා බිම් ප්‍රමාණයෙන් 2/3ක් පමණ වේ (ප්‍රමාණවත් ආහාර සැපයුමක් සඳහා අවම වශයෙන් අක්කර 1ක ඉඩම් කැබැල්ලක් අවශ්‍යයයි උපකල්පනය කරන ලදී).

## 6.5 ආහාර නිෂ්පාදනය පිළිබඳ සීමාවන්

ගෙවත්ත වගා කිරීම සඳහා ප්‍රධාන සීමාව ප්‍රමාණවත් ඉඩම් ප්‍රමාණයක් නොමැතිවීම ලෙස දැක්විය හැකිය. ඒ බව ග්‍රාමීය අංශයේ ගෙවතු වගා ප්‍රතිශතය ඉහළ මට්ටමක පැවතීම මඟින් තහවුරු වේ. ගෙවත්ත වගා කිරීම සඳහා ස්වයං පෙළඹවීම ඉතාමත් වැදගත් සාධකයකි. ගෘහ ඒකකවල ආර්ථික-සමාජීය තත්ත්වය අනුව ස්වයං පෙළඹවීම තීරණය වේ. තවද, ස්වයං පෙළඹවීම සඳහා ආකල්පමය වෙනස්කම් ඇති කළ යුතු වේ. එසේ නොමැතිවිට ඔවුන් වෙළෙඳපොළ මතම යැපේ. අඩු ආදායම්ලාභී ගෘහ ඒකක තමන්ගේ පරිභෝජනය සඳහා ගෙවත්තෙන් හෝ පරිසරයෙන් එළවළු සපයා ගැනීම කෙරෙහි උනන්දු වෙති. නමුත් ඉහළ ආදායම්ලාභී ගෘහ ඒකක විශේෂයෙන්ම නාගරික ගෘහ ඒකක වෙළෙඳපොළ මතම යැපීම කෙරෙහි අවධානය යොමු කරති.

තවද තාක්ෂණික ප්‍රචාරණයේ දුර්වලතා සහ පරිසර සාධක ගෙවත්ත වගා කිරීම සඳහා සීමාවන් පනවා තිබේ. ගෙවත්ත වගා කිරීමේදී ප්‍රධාන අරමුණ වන්නේ ගෘහ පරිභෝජනය සඳහා එදිනෙදා අවශ්‍ය ආහාර වර්ග නිපදවීමයි. එහිදී පළිබෝධ හානි සහ දිලීර හානි මඟහරවා ගැනීම සඳහා සරල තාක්ෂණික ක්‍රම පිළිබඳව ගෙවතු හිමියන් විශේෂයෙන්ම ගෘහයේ කාන්තාවන්ගේ දැනුවත් බව අල්පවීම ප්‍රධාන සීමාවකි. එම නිසා පළිබෝධ හානි සහ දිලීර හානි ගෙවතු වගා කිරීම සම්බන්ධයෙන් සීමාවන් පනවා ඇත. අනෙක් අතට මහ කන්නයේ මාස කීපයක් හැර වැඩි කාලයක් ජල හිඟයට මුහුණ දීමට වියළි කලාපයට සිදුවීමද ගෙවතු වගාව අධෛර්යමත් කිරීමට හේතු වී තිබේ.

## 6.6 ආහාර ලබාගැනීමේ ප්‍රවේශයන් (accessibility) තහවුරු කිරීම

කෙටි කාලයේදී කාර්යක්ෂම වෙළෙඳපොළක් තුළින් ආහාර සැපයුම පාරිභෝගිකයා වෙත ළඟා කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වේ. එසේ නොමැති විට අලෙවි පිරිවැය (marketing cost) ඉහළයාම තුළින් අසාමාන්‍ය ලෙස මිල ඉහළ යාම නිසා සෑම ජන කොට්ඨාසයකම ගෘහ ඒකක සඳහා ආහාර ලබාගැනීමේ පහසුව හා හැකියාව සම්බන්ධයෙන් ගැටළු මතුවේ. ආහාර ද්‍රව්‍ය අලෙවිය සඳහා ප්‍රවේශ වීමේ භෞතික සීමාවන් සහ වෙළෙඳපොළ සඳහා ප්‍රවේශ වීමේ බාධක පිටුදැකීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම වෙළෙඳපොළ කාර්යක්ෂම කිරීම සඳහා ගත යුතු අත්‍යාවශ්‍ය ක්‍රියාමාර්ගයකි. මෙහිදී ප්‍රාදේශීය ආහාර වෙළඳපොළ කරා ළඟාවීමට ඇති යටිතල පහසුකම් පුළුල් කිරීම තුළින් අතිරික්ත තොග හුවමාරුව සඳහා පහසුකම් සලසයි.

ශ්‍රී ලංකාවේ නාගරීකරණයට ලක්වූ ප්‍රදේශවලින් දුරස් වන විට ආහාර ලබාගැනීමේ අපහසුතාවය ඉහළ යන බව හඳුනාගෙන ඇත. ඒ අනුව මොණරාගල, අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වෙළඳපොළ සඳහා ප්‍රවේශ වීමේ අපහසුතා ඉහළම දිස්ත්‍රික්ක ලෙස හඳුනාගෙන තිබේ (FIVIMS, 2008). ආහාර බෙදාහැරීම සඳහා යහපත් මාර්ග පද්ධතියක් තිබිය යුතුවේ. ශ්‍රී ලංකාවේ ආහාර බෙදා හැරීම සම්පූර්ණයෙන්ම ලොරි රථ මඟින් සිදුවන අතර ප්‍රධාන මාර්ග පද්ධතියේ දුර්වලතා ඒ ඒ ප්‍රදේශවල ගෘහ ඒකක සඳහා පහසුවෙන් ආහාර ලබාගැනීම කෙරෙහි සීමාවන් ඇති කරයි.

දිගු කාලයේදී ප්‍රාදේශීය වශයෙන් ආහාර නිෂ්පාදනයේ ඇති අසමානතා පිටු දැකීම ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. ඒ සඳහා සමස්ත ආහාර නිෂ්පාදනය ඉහළ දැමීමට ඉලක්කගත ඒකාබද්ධ ජාතික වැඩසටහනක් ආරම්භ කළ යුතු වේ. එම වැඩසටහන ප්‍රධාන ආහාර බෝග නිෂ්පාදන වැඩසටහනට අතිරේකව එහෙත් ඒ හා බැඳුණු ගෘහස්ථ මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා නිවාස, පාසැල, පන්සල, දේවස්ථානය, කාර්යාලය හා වැඩපොළ යන සෑම ස්ථානයකම ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදනය දිරිගන්වන ගෙවතු ආරම්භ කිරීම, පවත්වාගෙන යාම, අනුබලදීම, තෑගි ප්‍රදානය, ඒ සඳහා පුහුණුව ලබාදීම, විදේශ චාරිකා ලබාදීම ආදී පුළුල් වැඩපිළිවෙලක් මත දියත් කළ යුතු වේ. එහිදී කාර්යක්ෂම ලෙස ඉඩම් පරිහරණය හා ඉහළ ඵලදායීතාවයකින් යුතුව ආහාර බෝග නිෂ්පාදනය සිදු විය යුතුය. එහි ප්‍රගතිය පිළිබඳව නිරන්තරව අධීක්ෂණය කළයුතු අතර එහි වගකීම ග්‍රාමීය මට්ටමේ සිට අමාත්‍යාංශ මට්ටම දක්වා සුදුසු අදාල නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවට ඇතුළත් කළ යුතු වේ.

දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වූ ප්‍රවර්ධන වැඩසටහන් අතීතයේ විවිධ කාලපරිච්ඡේදවලදී ආරම්භ කරන ලදී. ඒවායින් උගත යුතු පාඩම් බොහෝය. එම වැඩසටහන් බොහොමයක් හුදෙක් ප්‍රචාරාත්මක ඒවා වූ අතර ඒවායේ ප්‍රගතිය සංඛ්‍යාලේඛනවලට පමණක් සීමාවිය. ඇතැම් ඒවා දේශපාලන මුහුණුවරක් ගනු ලැබිය. ඒ නිසාම දේශපාලන බලය හුවමාරු වීමත් සමඟ එම වැඩසටහන් අහෝසි වී ගියේය. කෙසේ වෙතත් විවිධ කාලපරිච්ඡේදවලදී දියත් කළ ආහාර නිෂ්පාදන වැඩසටහන් අතර සාර්ථක වූ වැඩසටහන් කීපයකි. ඒ සඳහා උත්තේජනය ලැබුණේ වෙළෙඳපොළ තුළිනි. උදාහරණ ලෙස ආනයන ආදේශන ප්‍රතිපත්තියක් අනුගමනය කළ 1970 දශකයේ මුල් භාගයේ දේශීය නිෂ්පාදනයේ විශාල පිබිදීමක් ඇතිවීම වෙළෙඳපොළ ඉල්ලුම ඉහළ යාම තුළින් ජනිත වූ දිරිගැන්වීම නිසා සිදු වූවකි. එමෙන්ම 1989 – 1993 කාලපරිච්ඡේදය තුළ පාසැල් පද්ධතිය තුළ දේශීය ආහාර ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. හතළිස් ලක්ෂයකට අධික ළමා ගහනයක් ඇති පාසැල් පද්ධතිය තුළින් ජනිත වූ දේශීය ආහාර සඳහා වූ ඉල්ලුම දේශීය ආහාර නිෂ්පාදනය පුළුල්වීමට හේතු විය.

දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ දැමීමේ නිශ්චිත වැඩසටහනක් හා සමගාමීව පාරිභෝගිකයාගේ ආකල්ප වෙනසක් සඳහා අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන්ද ආරම්භ කළ යුතු වේ. ඒ සඳහා සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශයේ හා විශ්වවිද්‍යාල පර්යේෂකයන්ගේ දායකත්වය ලබාගත යුතු වේ. එහිදී අදාළ අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණයක් පැවතිය යුතුය. අතීතයේ අත්දැකීම් මඟින් පෙන්නුම් කරනු ලබන්නේ ඒ ඒ අමාත්‍යාංශයේ දැක්ම මත තනි තනිව ඉලක්ක පිහිටුවා ගනිමින් ඔවුනොවුන්ගේ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර සමාන අරමුණු ළඟා කරගැනීම සඳහා හෝ

සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කිරීමක් දක්නට නැති බවයි. දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ දැමීමේ ඉදිරි වැඩසටහනකදී එම දුර්වලතා මගහරවා ගත යුතු වේ.

## 6.7 දැරිය හැකි මිලක් යටතේ ආහාර ලබාගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම

ආහාර මිලදී ගැනීමේ හැකියාව තීරණය කරන ප්‍රධාන සාධකය ගෘහ ඒකකයේ ආදායමයි. ව්‍යුහගත ආදායම් මට්ටම් අනුව ඒ ඒ ගෘහයේ ආහාර මිලදී ගැනීමේ හැකියාව තීරණය වේ. එබැවින් ඒ ඒ ගෘහයේ ආදායම් මට්ටම් ඉහළ නැංවීම දිගුකාලීන අරමුණ විය යුතුය. ඒ සඳහා දිගුකාලීනව නිෂ්පාදනය ඉහළ දැමිය යුතු වේ. අනෙක් අතට ප්‍රාදේශීය වශයෙන් ආහාර සුලබ කිරීම තුළින් ආහාර මිල පහළ දැමිය හැකි අතර ඒ තුළින් පහළ ආදායම් ලබන ජන කොට්ඨාස සඳහා ආහාර ලබාගැනීමේ හැකියාව පුළුල් කළ හැකි වේ. ආහාර මිලදී ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් වඩාත් පීඩනයට පත්වී ඇති දිස්ත්‍රික්කය මොණරාගල වේ. මේ අතර මාතලේ, බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ගෘහ ඒකක සඳහාද ආහාර මිලදී ගැනීම සම්බන්ධයෙන් ඉහළ පීඩනයක් ඇති බව වාර්තා වේ (FIVIMS, 2008).

## 6.8 සාරාංශය

ඒ ඒ අංශයේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සම්බන්ධයෙන් විවිධ සීමා පවතී. දේශීය නිෂ්පාදනය ඉහළ දැමීමේදී ඉඩම් හා සම්බන්ධ ගැටළු එයින් ප්‍රධාන වේ. මනා කළමනාකරණයකින් හා ඉහළ ඵලදායීතාවයකින් තොරව කෙරෙන ගොඩ ඉඩම් පරිහරණය සහ ව්‍යාප්තිකරණයේ දුර්වලතා ආහාර නිෂ්පාදනය ඉහළ දැමීම සම්බන්ධයෙන් සීමා ඇති කර තිබේ. ගෙවතු වගා සංවර්ධනය සඳහා අවශ්‍ය සරල තාක්ෂණ ප්‍රචාරණය සහ දැනුවත් කිරීමේ දුර්වලතා පවතී. ආහාර ලබාගැනීමේ ප්‍රවේශයන් දුර්වල, නාගරීකරණය නොවූ ඈත පිටිසර ප්‍රාදේශීය වෙළෙඳපොළ සඳහා ප්‍රවේශවීමේ අපහසුතා ඇත. ආහාර මිලදී ගැනීම සඳහා සීමා පනවා ඇති ප්‍රධාන සාධකය සාපේක්ෂව පහළ ආදායම් මට්ටම වේ. එය ආදායම් ව්‍යාප්ති ව්‍යුහයේ අසමානතා මත පදනම්ව ඇත.

හත් වැනි පරිච්ඡේදය

# අධ්‍යයනයේ සොයාගැනීම්, නිගමන සහ නිර්දේශ

## 7.1 අධ්‍යයනයේ සොයාගැනීම්

ආහාර මිල ඉහළ යාම පිළිබඳ විශ්ලේෂණය අනුව, 2007 සිට 2009 දක්වා කාලය තුළ සහල් මිල 60%කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම තිරිඟු පිටි 37%කින් ද, පාන් 40%කින් ද, මාංශ භෝග 38%කින් ද, අර්තාපල් 22%කින් ද වශයෙන් ඉහළ ගොස් ඇත. එමෙන්ම කිරිපිටි මිල 35%කින් හා සීනි මිල 47%කින් වැඩි වී ඇති බැව් හඳුනාගත හැකිය. සෑම ගෘහ ඒකකයකම ආහාර සුරක්ෂිතතාවය සඳහා එය බලපා ඇති අතර විශේෂයෙන්ම වතු, නාගරික, පැල්පත් සහ ධීවර ගෘහ ඒකකයන් සඳහා බලපෑම ඉහළ අගයක් ගනී. ඇස්තමේන්තු කරන ලද ආහාර පරිභෝජන මට්ටම පිළිබඳ ආකෘතියට අනුව සමස්ත නියැදියෙන් 14%ක් ආහාර අනාරක්ෂිතතාවයට පත්ව සිටී. ආහාර මිලදී ගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය විවෘත වෙළෙඳපොළින් මිලදී ගැනීමයි. එම ප්‍රමාණය 73%ක් වශයෙන් පෙන්නුම් කරයි. ග්‍රාමීය අංශය හැර අනෙකුත් අංශයන් සඳහා එය ආසන්න වශයෙන් 100%කි. මෙම අධ්‍යයනයේදී ආහාර මිල ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන් ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප උපාය මාර්ග පිළිබඳව තවදුරටත් විශ්ලේෂණය කරනු ලැබිය. ඒ අනුව සාපේක්ෂව අඩු මිල ආහාර මිලදී ගැනීම සහ මිලට ගනු ලබන ප්‍රමාණය අඩු කිරීම (80%), ණය පදනම මත මිලට ගැනීම (66%), දෛනිකව පරිභෝජනය කරනු ලබන ආහාර ප්‍රමාණය අඩු කිරීම (66%) සහ මිතුරන් සහ අසල්වැසියන්ගෙන් ඉල්ලා ගැනීම (57%) ප්‍රධාන විකල්ප උපාය මාර්ගයන් වශයෙන් හඳුනා ගන්නා ලදී. එසේම ආහාර මිලදී ගැනීම සඳහා ණය ලබා ගැනීම (17%) තවත් විකල්ප උපාය මාර්ගයක් ලෙස හඳුනාගන්නා ලදී.

## 7.2 නිගමන

ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන්ද 2007 සහ 2008 යන වසරවලදී ආහාර මිල සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් නාගරික ග්‍රාමීය සහ වතු යන සෑම අංශයකම ගෘහ ඒකක සඳහා පීඩනයක් ඇති කරනු ලැබිය. එහි තීව්‍රතාවය අංශ වශයෙන් විවිධත්වයක් ගනු ලබයි. වතු අංශයේ ගෘහ ඒකක සඳහා එහි පීඩනය සාපේක්ෂව ඉහළ අගයක් ගනී. එම පීඩනයට මුහුණදීම සඳහා සෑම අංශයකම ගෘහ ඒකක විසින් ඔවුනොවුන්ගේ ආහාර වියදම් පියවා ගැනීම සඳහා විකල්ප උපායමාර්ග අනුගමනය කරනු ලැබේ. එම උපායමාර්ග ගෘහ ඒකකවල ආහාර පරිභෝජනය හා සෘජුව සහ වක්‍ර ලෙස බැඳී ඇත. ගෘහ ඒකකවල ආහාර පරිභෝජන මට්ටම ඇස්තමේන්තු කිරීම සඳහා ලෝක ආහාර වැඩසටහන (WFP) විසින් ගොඩනඟන ලද ආහාර පරිභෝජන මට්ටම (Food Consumption Score) ඇස්තමේන්තු කිරීමේ ආකෘතිය භාවිතයට ගනු ලැබිය. එහිදී ශ්‍රී ලංකාවේ ආහාර පරිභෝජන රටාවට අනුකූල වන පරිදි නව ප්‍රමිතියක් ගොඩනගා ගන්නා ලද අතර ආහාර පරිභෝජන මට්ටම සංඛ්‍යාත්මකව ඒකක 40ට පහළ පරිභෝජන මට්ටමක් නිරූපණය වන ගෘහ ඒකක ආහාර අනාරක්ෂිතභාවයට පත්වී යයි නිගමනය කරනු ලැබිය. සමස්ත නියැදියෙන් 14%ක් ආහාර අනාරක්ෂිතභාවයට ගොදුරු වී

ඇත. එබැවින් ආහාර මිල ඉහළ යාම අඩු ආදායම්ලාභී ජන කොට්ඨාස සඳහා වැඩි පීඩනයක් ඇති කර තිබෙන බව නිගමනය කෙරේ. සිද්ධි අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව ඒ සඳහා තෝරාගන්නා ලද විශේෂ නියැදි දෙකෙහි එනම් නාගරික පැල්පත් ගෘහ ඒකක සහ ධීවර ගෘහ ඒකකවල ආහාර පරිභෝජන මට්ටම් පිළිවෙළින් 40%, 28%ක වැනි සාපේක්ෂව ඉහළ අගයන් ගනු ලැබීම මඟින් ස්ථිර නොවූ රැකියාවන්හි නියුතු අඩු ආදායම්ලාභී ගෘහ ඒකක සඳහා ආහාර මිල ඉහළ යාම වැඩි පීඩනයක් ඇති කර තිබෙන බව තවදුරටත් නිගමනය කළ හැකිය'

## 7.3 නිර්දේශ

### කෙටිකාලීනව ක්‍රියාත්මක කළ යුතු නිර්දේශ

01. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා දිළිඳු ගෘහ ඒකකවල සාමාජිකයන්ගේ සහභාගීත්වය ලබා ගනිමින් ඔවුන්ට ආදායම් ඉපයීමේ අවස්ථා ඇති කිරීම මඟින් මිලට ගැනීමේ හැකියාව ඉහළ දැමීම සහ ඔවුන් ණය බරින් මුදවා ගැනීමට අවස්ථාව සැලසීම (ඇතැම් වැඩසටහන්වලදී ආහාර වෙනුවෙන් දිළිඳු ජනතාවගේ සහභාගීත්වය ලබාගත්තද එය ප්‍රතිපත්තියක් වශයෙන් සෑම ව්‍යාපෘතියකදීම ක්‍රියාත්මක නොවේ).

02. කාලීනව එක් එක් තේමා පාඨයන් යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ගෙවතු වගා වැඩසටහන්වල ප්‍රගතිය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකිය. එබැවින් සියළුම අංශ ආවරණය වන පරිදි විශේෂ ගෙවතු සංවර්ධන වැඩසටහනක් ආරම්භ කිරීම හා එය අධීක්ෂණය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම, ඒ සඳහා සුදුසු ව්‍යාප්තීකරණ යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ ඒ පිළිබඳව ගෘහණියන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් ආරම්භ කිරීම (2011 වසර සඳහා අයවැය යෝජනා මඟින් ගෙවතු දශ ලක්ෂයක් ස්ථාපිත කිරීමට යෝජනා කොට ඇත).

### දිගු කාලීනව ක්‍රියාත්මක කළ යුතු නිර්දේශ

01. වතු අංශයේ නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල වඩා දිළිඳු ගෘහ ඒක ඉලක්ක කරගනිමින් දැනට ක්‍රියාත්මක වන ආහාර ආධාර වැඩසටහන් නැවත සංවිධානය කිරීම.

02. ප්‍රාදේශීය වශයෙන් ආහාර නිෂ්පාදනය ඉහළ දැමීම මඟින් ආහාර මිල අඩු කිරීමට කටයුතු කිරීම හා එය දිළිඳු ජනතාවගේ ආහාර මිලදී ගැනීමේ හැකියාව ඉහළ දැමීම සඳහා ඉවහල් කරගැනීම.

03. නාගරීකරණය නොවූ ප්‍රාදේශීය ආහාර වෙළෙඳපොළ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් ආහාර වෙළෙඳපොළ අලෙවි පිරිවැය අඩු කිරීමට කටයුතු කිරීම සහ කාර්යක්ෂම ආහාර බෙදාහැරීමේ ජාලයක් නිර්මාණය කිරීම.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, *ගෘහ ඒකක ආදායම් සහ වියදම් පිළිබඳ සමීක්ෂණය 2006/2007.*

2. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, *ජනගහනය සහ සෞඛ්‍ය පිළිබඳ සමීක්ෂණය 2006/2007.*

3. Asian Development Bank ( 2008), "Living With High Prices- A Policy Brief, Avaliable: http://www.com.edu/research/rmigovernment/ADB/living%20with %20rices.pdf

4. CDRI (2008), "Impact of High Food Price in CambodiaA valiable: http: www.cdri.org. kh

5. Central Bank of Sri Lanka, (2006, 2007, 2008), *Annual Reports.*

6. Central Bank of Sri Lanka (March, 2009), *Economic and Social Statistics of Sri Lanka.*

7. Daniel Maxwell, Richard Caldwell (January, 2008), "The Coping Strategies Index" Field Methods Manual, Second Edition, Avaliable: http://www. ennonline/ine/pool/files/ife/coping-strategies – index-manual-second-edition (final)

8. FAO/UNDP/UNESCO/UNICEF/WFP/WHO (July. 2008), "High Food Prices in Pakistan-Impact Assessment an the Way Forward" Avaliable: http://www.fao.org/gviews/english/other pub/pakistanimpact Assessment.pdf

9. FAO.(Jun2008), Avaliablehttp://www.bing.com/search?q=International+cereal+FAO& FROM = MSNH

10. Selim Raihan, (March, 2009), "Impact of Price Rise on School Enrolment in the Poor and vulnerable Households in Selected Areas of Bangladesh, Avaliable: http://www.bracresearch. Org/publications/monograph-dfidl.pdf

11. Valdes, A. (Ed). (1981), *Food Security for Developing Countries,* Boulder, Colorado: Westview Press.

12. WFP/UNICEF "Report, Pilot Monitoring of High Food Price Impact at Household Level in Selected Vulnerable Areas". valiable:

http://www.documents.wfp.org/stellent/goups/public/documents/ena/efp 199568.pdf

13. Wikramasinghe, E. (May, 2008), *Sub-National Food Insecurity and Vulnerability Assessment for Policy Interventions in Sri Lanka, HARTI, Colombo 7.*

14. World Food Programme (WFP), "Sri Lanka Food Security Assessement, based on the Integrated Food Security and Humanitarian Phase Clasification Approach (1530 April, 2007) Avaliable:http://documents.wfp.org/stellen/groups/public/documents/ena/wfpl 35041.pdf.

15. World Food Programme (EFP), "Market and Price Impact Assessment", Avaliable: http://documents.wfp.org./stellent/public/documents/ena/efp 185782.pdf

# ආහාර මිල ඉහළ යාම නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල ආහාර සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් දක්වන බලපෑම

## 1. හැඳින්වීම

සිද්ධි අධ්‍යයනය සඳහා නියැදි දෙකක් තෝරාගන්නා ලද අතර එම නියැදි දෙක විශේෂ ජන කොට්ඨාස දෙකක් නියෝජනය කරනු ලබයි. නාගරික පැල්පත්වාසීන් සහ ධීවර ප්‍රජාව ඒ මඟින් නියෝජනය වේ. ආහාර මිල ඉහළ යාම හමුවේ මෙම ජන කොට්ඨාසවල ගෘහ ඒකක මුහුණපා ඇති අපහසුතා සහ පීඩනය හඳුනාගැනීම සහ එයට ප්‍රතිචාර වශයෙන් ඔවුන් අනුගමනය කරනු ලබන උපක්‍රම හඳුනාගැනීම සහ එය ප්‍රධාන නියැදියේ සොයාගැනීම්වලින් කොතෙක්දුරට වෙනස් වන්නේද යන්න පරීක්ෂා කිරීම සිද්ධි අධ්‍යයනයේ අරමුණ වේ. ඔවුන්ගේ ආහාර පරිභෝජන රටාව එමෙන්ම සහ පරිභෝජන මට්ටම විශ්ලේෂණය කිරීම සහ එය ප්‍රධාන නියැදි සමීක්ෂණයේ ප්‍රතිඵල හා සැසඳීමේදී වෙනස්වන ප්‍රමාණය තක්සේරු කිරීමද මෙහි අරමුණ වේ.

## 2. නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක මුහුණපා ඇති අපහසුතා

නාගරික පැල්පත් ගෘහ ඒකක පසුගිය වසර දෙකක කාලය තුළ මුහුණ පා ඇති අපහසුතා අතර වඩාත් පීඩනයට ලක්වී ඇත්තේ ආහාර මිල ඉහළ යාම සම්බන්ධයෙනි. එසේ වුවද, ධීවර ගෘහ ඒකක වඩාත් අපහසුවට පත්වී ඇත්තේ වැටුප් අඩුවීම නැත්නම් රැකියාවේ යෙදෙන දින ගණන අඩුවීම සම්බන්ධයෙනි. නාගරික පැල්පත් ගෘහ ඒකක සාමාජිකයින් බොහොමයක් ස්ථිර නොවූ එමෙන්ම දෛනිකව වේතන ලබන රැකියාවල නියුක්ත වූවෝ වෙති. බොහෝවිට හෝටල්වල සේවකයින්, වෙනත් කඩ සාප්පුවල සේවකයින්, ගෙවල් පිරිසිදු කරන්නන්, වෙනත් නිවාසවල ගෘහ සේවකයින් ආදී නුපුහුණු ශ්‍රමය සපයන්නන් ලෙස දැක්විය හැකිය. ඔවුන්ගේ රැකියාවේ අස්ථිරභාවය සහ මසකට වැඩ කරන දින ගණන අඩුවීම ඔවුන්ගේ ජීවන මට්ටම යහපත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගැටළු මතුකරයි. ධීවර ගෘහ ඒකක සාමාජිකයින් බොහොමයක් ධීවර රැකියාවේ නියුක්තව ඇති අතර "වාරකන් " කාලයේ දී රැකියාවේ යෙදෙන දින ගණන අඩුවීම ප්‍රධානම අපහසුව ලෙස හඳුනාගත හැකි විය. ආහාර මිල ඉහළ යාමේ පීඩනය ධීවර ගෘහ ඒකක සම්බන්ධයෙන් අනෙකුත් අපහසුතා අතර දෙවෙනි ස්ථානය ගනු ලබයි.

වගු අංක 1 : නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක මුහුණපා ඇති අපහසුතාවයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාතය (%)

| අපහසුතාවය | නාගරික පැල්පත් ගෘහ ඒකක | ධීවර ගෘහ ඒකක |
|---|---|---|
| 1. ආහාර මිල ඉහළයාම | 39 | 21 |
| 2. වැටුප අඩුවීම/රැකියාවේ යෙදෙන දින ගණන අඩුවීම | 28 | 43 |
| 3. අසනීප වීම/සෞඛ්‍ය වියදම් අධිකවීම | 22 | 19 |
| 4. ගෘහ ඒකක සාමාජික මරණය/අවමඟුල් උත්සව | 6 | 5 |
| 5. ණය පියවීම | 6 | 8 |
| 6. විදුලිය/ගෑස් මිල අධිකවීම | 0 | 0 |
| 7. ආරක්ෂාව/කාලගුණය | 0 | 0 |
| 8. අයහපත් කාලගුණය | 0 | 0 |
| 9. වෙනත් කම්පන | 0 | 5 |
| 10. එකතුව | 100 | 100 |

මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 3. ආහාර මිල ඉහළ යාමේ ගැටළුව හමුවේ නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක විසින් දක්වන ලද ප්‍රතිචාර

ආහාර මිල ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන් නාගරික පැල්පත් ගෘහ ඒකක විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිචාර උපක්‍රම අතර වඩාත් භාවිතා වන්නේ අඩු මිල ආහාර මිලට ගැනීම සහ මිලට ගනු ලබන ප්‍රමාණය අඩු කිරීමයි. ආහාර ණයට ගැනීම, මිතුරන්ගෙන් සහ අසල්වැසියන්ගෙන් ඉල්ලා ගැනීම සහ දිනපතා පරිභෝජනය කරන ආහාර ප්‍රමාණය අඩු කිරීම පිළිවෙලින් වැඩි වශයෙන් භාවිතා කරන විකල්ප උපක්‍රම වෙයි. ධීවර ගෘහ ඒකක සම්බන්ධයෙන් සැලකුවිට වඩාත් භාවිතා වන උපක්‍රම වන්නේ අඩු මිල ආහාර මිලට ගැනීම සහ මිලට ගනු ලබන ප්‍රමාණය අඩු කිරීමයි. ආහාර ණයට ගැනීම, දිනපතා පරිභෝජනය කරන ආහාර ප්‍රමාණය අඩු කිරීම මිතුරන්ගෙන් සහ අසල්වැසියන්ගෙන් ඉල්ලා ගැනීම පිළිවෙලින් ඊළඟට භාවිතා කරන උපක්‍රම වේ. මෙම උපක්‍රමයන් සෘජුවම ඔවුනගේ ආහාර පරිභෝජනය අඩුවීම සඳහා බලපානු ලබන අතර ඔවුන් විසින් අනුගමනය කරනු ලබන අනෙකුත් උපක්‍රමයන් හේතුවෙන් ඔවුන්ගේ ජීවන මට්ටම පහළ යයි (වගු අංක 02).

වගු අංක 2: ආහාර මිල ඉහළයාමේ ගැටළුව හමුවේ ඒ ඒ ගෘහ ඒකක විසින් දක්වන ලද ප්‍රතිචාරයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාතය*

| ප්‍රතිචාර උපක්‍රම | නාගරික පැල්පත් ගෘහ ඒකක | ධීවර ගෘහ ඒකක |
|---|---|---|
| 01. අඩු මිල ආහාර මිලට ගැනීම/ප්‍රමාණය අඩුවෙන් මිලදී ගැනීම | 3.7 | 2.7 |
| 02. ආහාර ණයට ගැනීමට සිදුවීම | 2.4 | 2.4 |
| 03. මිතුරන්/අසල්වාසීන්ගෙන් ආහාර ණයට ගැනීම | 2.2 | 1.9 |
| 04. දිනපතා ගන්නා ආහාර අඩු කිරීම | 1.7 | 2.2 |
| 05. රත්‍රන් භාණ්ඩ විකිණීම/උකස් කිරීම | 1.6 | 2.0 |
| 06. කුඩා ළමයින් වෙනුවෙන් වැඩිහිටියන්ගේ ආහාර පරිභෝජනය සීමා කිරීම | 1.4 | 1.4 |
| 07. මව්වරුන්/සහෝදරියන් අනෙක් අය වෙනුවෙන් පරිභෝජනය සීමා කිරීම | 1.0 | 1.2 |
| 08. ඊළඟ කන්නය සඳහා තබාගත් බීජ පරිභෝජනය කිරීම | 1.0 | 0.9 |
| 09. පොහොර, කෘමිනාශක, සත්ව ආහාර වියදම් අඩු කිරීම | 0.8 | 0.9 |
| 10. ගෘහයේ ඇති වත්කම් (රේඩියෝ, ලීබඩු) විකිණීම | 0.8 | 1.1 |
| 11. නිෂ්පාදනයට ඉවහල්වන වත්කම් (ගොවි උපකරණ) | 1.0 | 1.0 |
| 12. ඉඩම් විකිණීම/උකස් කිරීම | 1.1 | 1.0 |
| 13. වැඩි වශයෙන් පශු සම්පත් විකිණීම | 0.8 | 0.8 |
| 14. සෞඛ්‍ය වියදම් අඩු කිරීම | 1.0 | 1.2 |
| 15. ළමුන් පාසැල්වලින් ඉවත් කරගැනීම / පාසැල් නොයවා සිටීම | 1.1 | 1.1 |
| 16. අතිරේක රැකියා සඳහා යොමුවීම | 0.8 | 1.2 |
| 17. නිවසෙහි සාමාජිකයින් ආහාර වෙනුවෙන් වැඩට යොමුවීම | 0.8 | 1.1 |
| 18. පොදු වත්කම් පරිභෝජනය වැඩි කිරීම | 0.9 | 0.9 |
| 19. වැඩි වශයෙන් බෝග වගා කිරීමට යොමුවීම | 1.1 | 0.8 |

මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

* ඒ ඒ ප්‍රතිචාර උපක්‍රමයන් සඳහා බර තැබීමක් ලබාදී නැත.

## 4. නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක විසින් ණය ලබාගැනීම

නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක මුහුණපා ඇති අපහසුතා හමුවේ දෛනික අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා බොහෝවිට ණය ලබාගැනීම සිදුවේ. නාගරික පැල්පත් ගෘහ ඒකකවලින් 88%ක් සහ ධීවර ගෘහ ඒකකවලින් 60%ක් ණය ලබාගෙන තිබේ. එසේ නමුත් නාගරික පැල්පත් ගෘහ ඒකකවලින් 68%ක් හා ධීවර ගෘහ ඒකකවලින් 53%ක් ණය ලබාගෙන ඇත්තේ පසුගිය වසර දෙක තුළදීය. නාගරික පැල්පත් ගෘහ ඒකක වැඩි වශයෙන් ණය ලබාගෙන ඇත්තේ මාසික පොළිය 10% - 20% පරාසයක් යටතේ මුදල් ණයට දෙන්නන්ගෙනි.

වගු අංක 3: නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක විසින් ණය ලබාගැනීම

| විශේෂ නියැදිය | නියැදි ප්‍රමාණය | ණය ලබාගත් සංඛ්‍යාව | ප්‍රතිශතය | පසුගිය වසර දෙක තුළ ණය ලබාගත් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 01. නාගරික පැල්පත් ගෘහ ඒකක | 25 | 22 | 88 | 15 | 68 |
| 02. ධීවර ගෘහ ඒකක | 25 | 15 | 60 | 08 | 53 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 5. නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක විසින් ණය ලබාගැනීමේ ප්‍රධාන හේතුව

නාගරික පැල්පත් ගෘහ ඒකක විසින් ආහාර මිලට ගැනීම සඳහා (47%) ණය ලබාගෙන ඇති අතර දෙවනුව නිවාස සෑදීම හෝ අළුත්වැඩියාව (29%) සඳහා ණය ලබාගෙන තිබේ. ධීවර ගෘහ ඒකක විසින් ලබාගෙන ඇති ණය අතර ප්‍රධාන වන්නේද ආහාර මිලට ගැනීම සඳහා ණය ලබාගැනීමයි. එම ගෘහ ඒකකවලින් 22%ක් ආහාර මිලදී ගැනීම සඳහා ණය ලබාගෙන ඇත.

වගු අංක 4: නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක විසින් ණය ලබාගැනීමේ ප්‍රධාන හේතුව (ප්‍රතිශතවලින්)

| අනු අංකය | ණය ලබාගැනීමේ හේතුව | නාගරික පැල්පත් ගෘහ ඒකක | ධීවර ගෘහ ඒකක |
|---|---|---|---|
| 01 | ආහාර මිලට ගැනීම සඳහා | 47.1 | 21.6 |
| 02 | නිවාස සෑදීම/අළුත්වැඩියාව සඳහා | 29.4 | 18.3 |
| 03 | සෞඛ්‍ය වියදම් සඳහා | 11.8 | 14.3 |
| 04 | අධ්‍යාපන වියදම් සඳහා | 0.0 | 7.1 |
| 05 | කෘෂි යෙදවුම් සඳහා | 0.0 | 0.0 |
| 06 | ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා | 5.9 | 14.3 |
| 07 | සාමාජීය වියදම් | 0.00 | 3.0 |
| 08 | ණය පියවීම සඳහා | 5.9 | 7.1 |
| 09 | වෙනත් | 0.0 | 14.3 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 6. නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල යැපෙන්නන් සංඛ්‍යාව

නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල යැපෙන්නන් සංඛ්‍යාවේ සැලකිය යුතු වෙනසක් දැකිය හැකි නොවේ.

වගු අංක 5 : නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල යැපෙන්නන් සංඛ්‍යාව (%)

| වයස් කාණ්ඩය | නාගරික පැල්පත් ගෘහ ඒකක | ධීවර ගෘහ ඒකක |
|---|---|---|
| යැපෙන්නන් සංඛ්‍යාව | 35 | 31 |
| ශ්‍රම බලකාය | 92 | 77 |
| යැපෙන්නන් සංඛ්‍යාව (ශ්‍රම බලකායේ % වශයෙන්) | 38 | 40 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 7. නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල ආහාර පරිභෝජන රටාව

නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල ප්‍රධාන ආහාරය බත් වන අතර දිනපතාම අවම වශයෙන් වේල් දෙකක් හෝ බත් පරිභෝජනය කරයි. අතිරේක ආහාර ද්‍රව්‍ය වන අල බෝග පරිභෝජනය නාගරික පැල්පත් ගෘහ ඒකකවලදී ධීවර ගෘහ ඒකකවල අගයට වඩා ඉහළ අගයක් ගන්නා අතර එය දින දෙකක් පමණ වන අතර ධීවර ගෘහ ඒකකවලදී දින එකකි. මාංශ බෝග පරිභෝජනය නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල සමාන අගයක් ගන්නා අතර එය දින 2 – 3 පමණ වේ. මාංශ බෝග අතර ප්‍රධාන වන්නේ පරිප්පු පරිභෝජනයයි. ධීවර ගෘහ ඒකකවල සත්ව ආහාර පරිභෝජනය ඉහළ අගයක් ගනී. ඒ සඳහා මාළු පරිභෝජනය ඉහළ මට්ටමක පැවතීම හේතු වී තිබේ. නමුත් අනෙකුත් මස් වර්ග හෝ බිත්තර පරිභෝජනය පහළ මට්ටමක පවතී. නාගරික පැල්පත් අංශයේ සත්ව ආහාර පරිභෝජනය පහළ මට්ටමක පවතින අතර කරවල පරිභෝජනය ධීවර ගෘහ ඒකකවලට සාපේක්ෂව ඉහළය. එළවළු පරිභෝජනය නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක යන කොට්ඨාස දෙකෙහිම ඉහළ අගයක් ගන්නා අතර එය නාගරික පැල්පත් ගෘහ ඒකකවලදී දින හතක් වන අතර ධීවර ගෘහ ඒකකවලදී දින හයකි. පලතුරු පරිභෝජනය නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක යන කොට්ඨාස දෙකෙහිම සාපේක්ෂව පහළ අගයක් ගන්නා අතර එය නාගරික පැල්පත් ගෘහ ඒකකවල දින දෙකක් සහ ධීවර ගෘහ ඒකකවලදී දින එකකි. ගෘහ ඒකක දෙවර්ගයේම දින හතේදීම සීනි පරිභෝජනය කෙරේ. පොල් හෝ පොල්තෙල් දින හතේදීම ගෘහ ඒකක දෙවර්ගය විසින්ම පරිභෝජනය කරන අතර වෙනත් තෙල් වර්ග එතම් එළවළු තෙල් භාවිතයක් නැත. කිරිපිටි පරිභෝජනය ගෘහ ඒකක දෙවර්ගය සඳහාම පහළ අගයක් ගනී. එය නාගරික පැල්පත් ගෘහ ඒකකවලදී දින තුනක් වන අතර ධීවර ගෘහ ඒකකවලදී දින දෙකකි. නාගරික පැල්පත් ගෘහ ඒකකවලදී බොහෝවිට කුඩා ළමුන් සඳහා පමණක් කිරිපිටි ලබාදෙන අතර බොහෝ ගෘහ ඒකක ග්‍රෑම් 50ක කුඩා කිරිපිටි පැකට් දින දෙක තුනකට වරක් මිලදී ගනු ලැබේ.

වගු අංක 6 : නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක විසින් ලබාගත් ආහාරවල විවිධත්වය සහ දින ගණන

| ආහාර වර්ගය | නාගරික පැල්පත් | ධීවර ගෘහ ඒකක |
|---|---|---|
| 01. සහල් | 7.00 | 7.00 |
| 02. බඩඉරිඟු | 0.00 | 0.28 |
| 03. පාන්/තිරිඟු පිටි නිෂ්පාදන | 2.40 | 1.45 |
| 04. මඤ්ඤොක්කා | 0.89 | 0.75 |
| 05. බතල සහ වෙනත් අල | 1.10 | 1.28 |
| 06. පරිප්පු, මුංඇට, කව්පි, රටකජු/වෙනත් මාංශ බෝග | 2.36 | 2.64 |
| 07. මාළු | 0.72 | 5.40 |
| 08. මස් (හරක් මස්/ඌරු මස්/කුකුල් මස්) | 0.30 | 0.25 |
| 09. බිත්තර | 0.52 | 0.45 |
| 10. කරවල | 1.15 | 0.75 |
| 11. එළවළු (කොළ එළවළු ඇතුළුව) | 7.00 | 6.40 |
| 12. පලතුරු | 2.00 | 1.20 |
| 13. සීනි සහ පැණිරස කෑම | 6.70 | 6.70 |
| 14. පොල් | 6.70 | 7.00 |
| 15. පොල්තෙල්/එළවළු තෙල් | 6.40 | 7.00 |
| 16. කිරිපිටි | 2.90 | 2.25 |
| 17. කුළුබඩු | 6.70 | 7.00 |
| 18. රතුළූණු/ලොකු ළූණු | 6.70 | 6.70 |

මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ප්‍රධාන නියැදියට අදාළ දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයම සිද්ධි අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලද විශේෂ නියැදි දෙකෙහි දත්ත විශ්ලේෂණය සඳහාද භාවිතා කරන ලදී. ඒ සඳහා සමීක්ෂණ දිනට පෙර දින හත තුළ නාගරික පැල්පත් ගෘහ ඒකක සහ ධීවර ගෘහ ඒකක විසින් පරිභෝජනය කරන ලද ඉහත වගුවෙහි දැක්වෙන ආහාර වර්ග පදනම් කරගනු ලැබීය. එම ආහාර කාණ්ඩ විශ්ලේෂණය සඳහා ප්‍රධාන ආහාර කාණ්ඩ අටක් යටතේ නැවත ගොනු කරනු ලැබීය. එය පහත වගුවෙන් දැක්වේ. ඒ අනුව ලෝක ආහාර වැඩසටහන මඟින් ගොඩනගා ඇති විශ්ලේෂණ ආකෘතිය භාවිතයට ගෙන නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල ආහාර පරිභෝජන මට්ටම තක්සේරු කරන ලදී.

වගු අංක 7: සතියේ ආහාර පරිභෝජන රටාව (දින ගණන)

| අනු අංකය | ආහාර වර්ගය | නාගරික පැල්පත් ගෘහ ඒකක | ධීවර අංශය |
|---|---|---|---|
| 1 | ධාන්‍ය සහ අල වර්ග | 7.00 | 7.00 |
| 2 | මාංශ භෝග | 2.36 | 2.64 |
| 3 | සත්ව ආහාර | 2.69 | 6.85 |
| 4 | එළවළු | 7.00 | 6.40 |
| 5 | පලතුරු | 2.00 | 1.20 |
| 6 | සීනි සහ පැණිරස කෑම | 6.70 | 6.70 |
| 7 | තෙල් සහ මේද | 7.00 | 7.00 |
| 8 | කිරි ආහාර | 2.90 | 2.25 |

මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ලෝක ආහාර වැඩසටහන මගින් ගොඩනගා ඇති විශ්ලේෂණ ආකෘතිය

$$FCS = {}^{a}staple^{x}staple + {}^{a}pulse^{x}pulse + {}^{a}veg^{x}veg + {}^{a}fruit^{x}fruit + {}^{a}animal^{x}animal + {}^{a}sugar^{x}sugar + {}^{a}oil^{x}oil$$

සංකේත හඳුනා ගැනීම

FCS = ආහාර පරිභෝජන මට්ටම

$a_i$ = ඒ ඒ ආහාර කාණ්ඩයන් සඳහා ලබාදී ඇති බර තැබීමේ වටිනාකම

$x_i$ = දින 7 ක කාලය තුළ ඒ ඒ ආහාර කාණ්ඩයන් පරිභෝජනය කළ දින ගණන

වගු අංක 8 : ඒ ඒ ආහාර කාණ්ඩය සඳහා ලබාදී ඇති බර තැබීම් වටිනාකම

| අනු අංකය | ආහාර වර්ගය | ආහාර කාණ්ඩය | බර තැබීම |
|---|---|---|---|
| 01 | සහල්, පාන් සහ පාන් පිටි ආශ්‍රිත ආහාර සහ බඩඉරිඟු, බතල, මඤ්ඤොක්කා සහ වෙනත් අල වර්ග | ධාන්‍ය සහ අල වර්ග | 2 |
| 02 | මාංශ බෝග (කව්පි, මුංඇට, පරිප්පු) | මාංශ බෝග | 3 |
| 03 | එළවළු (කොළ එළවළු ඇතුළුව) | එළවළු | 1 |
| 04 | පලතුරු | පලතුරු | 1 |
| 05 | සත්ව ආහාර (මස්, මාළු, බිත්තර සහ කරවල) | මස් සහ මාළු | 4 |
| 06 | කිරි (කිරි සහ කිරි ආහාර) | කිරි | 4 |
| 07 | සීනි (සීනි සහ පැණිරස කෑම) | සීනි | 0.5 |
| 08 | තෙල් සහ මේද (පොල්, පොල්තෙල්) | තෙල් | 0.5 |

මූලාශ්‍රය: ලෝක ආහාර වැඩසටහන, (2008).

ඉහත සමීකරණය අනුව ඇස්තමේන්තු කරන ලද සාමාන්‍ය ආහාර පරිභෝජන මට්ටම නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක යන විශේෂ ජන කොට්ඨාස දෙකෙහිදීම බොහෝදුරට සමාන වේ.

වගු අංක 9 : නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල සාමාන්‍ය ආහාර පරිභෝජන මට්ටම

| විස්තරය | නාගරික පැල්පත් ගෘහ ඒකක | ධීවර ගෘහ ඒකක |
|---|---|---|
| ආහාර පරිභෝජන මට්ටම (සාමාන්‍ය) | 56.3 | 55.9 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 8. ආහාර පරිභෝජනයේ මට්ටම (අධ්‍යයන නියැදිය සඳහා අදාළ කරගැනීම)

ලෝක ආහාර වැඩසටහන මගින් ගොඩනගා ඇති ආකෘතිය අනුව ආහාර පරිභෝජනයේ මට්ටම තක්සේරු කිරීමේදී පරිභෝජන මට්ටම පිළිබඳ ප්‍රමිතීන් අධ්‍යයන නියැදියට අදාළ පරිභෝජන

රටාව අනුව සකස් කරගත් අතර නව ප්‍රමිතියක් ගොඩනගා ගන්නා ලදී. නව ප්‍රමිතිය සඳහා අවම ආහාර පරිභෝජන මට්ටමේදී දින හතේදීම බත් සමඟ එළවළු තෙල් සහ මේද සහ සීනි පරිභෝජනය කලේ යයි උපකල්පනය කරන ලදී (7x2+7x1+7x0.5+7x0.5=28). දින හතේදීම ප්‍රධාන ආහාරය සමඟ එළවළු සහ දින හතරක් මාංශ භෝග, දිනහත සඳහාම තෙල් සහ මේද සහ සීනි පරිභෝජනය කලේ යයි උපකල්පනය කොට අවම ආහාර පරිභෝජන මට්ටම් සීමාවේ ආහාර පරිභෝජනය තක්සේරු කරන ලදී (7x2x7x1+4x3+7x0.5+7x0.5=40).

වගු අංක 10 : ආහාර පරිභෝජනයේ මට්ටම (අධ්‍යයන නියැදිය සඳහා අදාළ කරගත් නව ප්‍රමිතිය අනුව)

| ආහාර පරිභෝජන කාණ්ඩය | ප්‍රමිතිය (WFP) | නව ප්‍රමිතිය (අධ්‍යයන නියැදිය) |
|---|---|---|
| අවම මට්ටමේ පරිභෝජනය | 0-21 | 0-28 |
| අවම මට්ටම් සීමාවේ පරිභෝජනය | 21.5-3.5 | 28.5-40 |
| පිළිගත හැකි මට්ටමේ පරිභෝජනය | >35 | >40 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

ඉහත ඇස්තමේන්තු කිරීමෙන් අනතුරුව ඒ ඒ පරිභෝජන මට්ටම් යටතේ ඇති නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක ප්‍රතිශත හඳුනාගනු ලැබිය. එම අගයන් පහත වගුවෙන් අනාවරණය වේ. ඒ අනුව වඩාත් දිළිඳු ගෘහ ඒකක ප්‍රතිශතය නාගරික පැල්පත් ගෘහ ඒකක සම්බන්ධයෙන් 16%ක් වන අතර ධීවර ගෘහ ඒකක සම්බන්ධයෙන් 4%කි. එසේ වුවද, ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකක ප්‍රතිශතය පිළිවෙළින් නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකක සඳහා 40%ක් සහ 28%ක් වේ.

වගු අංක 11 : නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල ඒ ඒ කාණ්ඩය යටතේ ආහාර පරිභෝජනය කරන ගෘහ ඒකක ප්‍රතිශතය

| ආහාර පරිභෝජන කාණ්ඩය | නාගරික පැල්පත් ගෘහ ඒකක | ධීවර ගෘහ ඒකක |
|---|---|---|
| අවම මට්ටමේ ආහාර පරිභෝජනය | 16.00 | 4.00 |
| අවම මට්ටම සීමාවේ ආහාර පරිභෝජනය | 24.00 | 24.00 |
| පිළිගත හැකි ආහාර පරිභෝජන මට්ටම | 60.00 | 72.00 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

වගු අංක 12 : නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල ආහාර අනාරක්ෂිතභාවයට පත්වී ඇති ගෘහ ඒකක සංඛ්‍යාව සහ පුද්ගලයන් සංඛ්‍යාව

| ආහාර පරිභෝජන මට්ටම | | නාගරික පැල්පත් ගෘහ ඒකක | ධීවර ගෘහ ඒකක |
|---|---|---|---|
| අවම ආහාර පරිභෝජන මට්ටම | ගෘහ ඒකක සංඛ්‍යාව | 4 | 1 |
| | % වශයෙන් | 23.53 | 5.88 |
| | ජනගහනය | 20 | 4 |
| අවම ආහාර පරිභෝජන මට්ටම් සීමාව | ගෘහ ඒකක සංඛ්‍යාව | 6 | 6 |
| | % වශයෙන් | 19.35 | 19.35 |
| | ජනගහනය | 30 | 26 |
| එකතුව | ගෘහ ඒකක සංඛ්‍යාව | 10 | 7 |
| | ජනගහනය | 50 | 3. |
| ගෘහ ඒකකයේ සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව | | 5.00 | 4.36 |
| ආහාර අනාරක්ෂිතභාවය (%) | | 40 | 28 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

## 9. නිගමනය

නාගරික පැල්පත් ගෘහ ඒකක සහ ධීවර ගෘහ ඒකකවල ආහාර අනාරක්ෂිතභාවය සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා අතර එය පිළිවෙළින් 40% සහ 28% අගයක් ගනු ලැබේ. එබැවින් ආහාර මිල ඉහළ යාම හමුවේ මෙම ගෘහ ඒකක දැඩි පීඩනයට මුහුණපා ඇති බව නිගමනය කළ හැකිය.

ඇමුණුම 02

වගු අංක 1 : සහල් සඳහා මාසික සිල්ලර මිල රුපියල් – කිලෝ ග්‍රෑම් (2007 – 2009)

| වර්ෂය | මාසය | තැම්බූ සහල් සිල්ලර මිල | කැකුළු සහල් සිල්ලර මිල |
|---|---|---|---|
| 2007 | ජනවාරි | 31.16 | 36.20 |
| | පෙබරවාරි | 39.7 | 39.3 |
| | මාර්තු | 37.6 | 36.8 |
| | අප්‍රේල් | 36.5 | 35.3 |
| | මැයි | 38.5 | 35.9 |
| | ජූනි | 39.2 | 38.0 |
| | ජූලි | 39.2 | 39.4 |
| | අගෝස්තු | 40.9 | 39.2 |
| | සැප්තැම්බර් | 43.4 | 39.8 |
| | ඔක්තෝබර් | 47.9 | 41.7 |
| | නොවැම්බර් | 57.4 | 52.2 |
| | දෙසැම්බර් | 6.9 | 55.9 |
| සාමාන්‍යය | | 43.42 | 40.8 |
| 2008 | ජනවාරි | 71.7 | 66.3 |
| | පෙබරවාරි | 69.8 | 64.1 |
| | මාර්තු | 71.9 | 63.8 |
| | අප්‍රේල් | 80.2 | 69.1 |
| | මැයි | 57.4 | 65.0 |
| | ජූනි | 57.5 | 65.0 |
| | ජූලි | 69.9 | 63.5 |
| | අගෝස්තු | 68.8 | 62.4 |
| | සැප්තැම්බර් | 69.2 | 62.2 |
| | ඔක්තෝබර් | 69.0 | 62.7 |
| | නොවැම්බර් | 70.6 | 63.6 |
| | දෙසැම්බර් | 71.7 | 65.0 |
| සාමාන්‍යය | | 68.9 | 64.4 |
| 2009 | ජනවාරි | 72.6 | 65.8 |
| | පෙබරවාරි | 72.4 | 65.5 |
| | මාර්තු | 69.0 | 61.2 |
| | අප්‍රේල් | 66.2 | 58.3 |
| | මැයි | 67.4 | 59.8 |
| | ජූනි | 68.8 | 62.2 |
| | ජූලි | 68.2 | 61.3 |
| | අගෝස්තු | 68.3 | 60.4 |
| | සැප්තැම්බර් | 68.8 | 61.0 |
| සාමාන්‍යය | | 69 | 61.7 |

වගු අංක 2 : තිරිඟු පිටි සහ පාන් පිටි සඳහා මාසික සිල්ලර මිල රුපියල් (2007 – 2009)

| වර්ෂය | මාසය | තිරිඟු පිටි (රු.කි.ග්‍රෑ.) සිල්ලර මිල | පාන් (ග්‍රෑම් 450) සිල්ලර මිල රු. |
|---|---|---|---|
| 2007 | ජනවාරි | 40.18 | 22.29 |
| | පෙබරවාරි | 42.18 | 23.07 |
| | මාර්තු | 43.54 | 23.83 |
| | අප්‍රේල් | 43.64 | 23.71 |
| | මැයි | 46.57 | 24.57 |
| | ජූනි | 47.24 | 25.64 |
| | ජූලි | 47.93 | 26.68 |
| | අගෝස්තු | 51.44 | 27.27 |
| | සැප්තැම්බර් | 51.43 | 27.95 |
| | ඔක්තෝබර් | 64.84 | 33.29 |
| | නොවැම්බර් | 65.07 | 33.75 |
| | දෙසැම්බර් | 67.35 | 33.50 |
| සාමාන්‍යය | | 60.9 | 27.1 |
| 2008 | ජනවාරි | 75.95 | 33.64 |
| | පෙබරවාරි | 74.88 | 36.79 |
| | මාර්තු | 74.88 | 36.79 |
| | අප්‍රේල් | 75.12 | 36.79 |
| | මැයි | 75.17 | 36.79 |
| | ජූනි | 75.02 | 37.31 |
| | ජූලි | 74.68 | 38.01 |
| | අගෝස්තු | 72.61 | 37.60 |
| | සැප්තැම්බර් | 71.28 | 37.49 |
| | ඔක්තෝබර් | 7.58 | 37.37 |
| | නොවැම්බර් | 69.79 | 37.39 |
| | දෙසැම්බර් | 69.67 | 37.72 |
| සාමාන්‍යය | | 73.3 | 39.9 |
| 2009 | ජනවාරි | 69.58 | 36.96 |
| | පෙබරවාරි | 69.88 | 36.96 |
| | මාර්තු | 69.12 | 36.78 |
| | අප්‍රේල් | 69.54 | 38.00 |
| | මැයි | 70.32 | 38.00 |
| | ජූනි | 69.96 | 37.50 |
| | ජූලි | 69.74 | 38.18 |
| | අගෝස්තු | 71.93 | 37.63 |
| | සැප්තැම්බර් | 72.38 | 38.13 |
| සාමාන්‍යය | | 70.2 | 37.5 |

වගු අංක 3 : මාංශ භෝග, අර්තාපල් සහ කුළුබඩු සඳහා මාසික සිල්ලර මිල රුපියල් (2007 – 2009)

| වර්ෂය | මාසය | මාංශ භෝග සිල්ලර මිල | අර්තාපල් සිල්ලර මිල | කුළුබඩු සිල්ලර මිල |
|---|---|---|---|---|
| 2007 | ජනවාරි | 115.77 | - | 122.24 |
| | පෙබරවාරි | 118.9 | 67.8 | 117.5 |
| | මාර්තු | 109.9 | 73.1 | 105.3 |
| | අප්‍රේල් | 109.0 | 80.4 | 104.6 |
| | මැයි | 110.9 | 78.3 | 101.3 |
| | ජූනි | 112.5 | 91.6 | 108.4 |
| | ජූලි | 115.2 | 98.5 | 116.1 |
| | අගෝස්තු | 116.3 | 86.6 | 106.8 |
| | සැප්තැම්බර් | 115.7 | 82.0 | 103.9 |
| | ඔක්තෝබර් | 119.1 | 77.6 | 103.9 |
| | නොවැම්බර් | 123.2 | 79.2 | 131.2 |
| | දෙසැම්බර් | 126.8 | 90.4 | 136.9 |
| සාමාන්‍යය | | 116.1 | 75.4 | 104.7 |
| 2008 | ජනවාරි | 132.2 | 91.2 | 123.6 |
| | පෙබරවාරි | 136.3 | 78.5 | 114.0 |
| | මාර්තු | 143.4 | 80.4 | 128.9 |
| | අප්‍රේල් | 143.6 | 82.4 | 130.6 |
| | මැයි | 152.4 | 81.1 | 140.1 |
| | ජූනි | 157.4 | 87.3 | 124.7 |
| | ජූලි | 160.8 | 83.7 | 126.2 |
| | අගෝස්තු | 162.8 | 79.8 | 124.7 |
| | සැප්තැම්බර් | 162.3 | 79.6 | 125.6 |
| | ඔක්තෝබර් | 159.8 | 78.2 | 128.4 |
| | නොවැම්බර් | 157.4 | 91.0 | 125.6 |
| | දෙසැම්බර් | 158.1 | 99.3 | 137.8 |
| සාමාන්‍යය | | 152.2 | 84.3 | 127.5 |
| 2009 | ජනවාරි | 157.1 | 94.9 | 142.7 |
| | පෙබරවාරි | 152.8 | 82.2 | 132.8 |
| | මාර්තු | 146.8 | 82.4 | 131.4 |
| | අප්‍රේල් | 145.7 | 96.4 | 133.1 |
| | මැයි | 152.9 | 104.2 | 134.6 |
| | ජූනි | 160.6 | 116.5 | 127.9 |
| | ජූලි | 168.6 | 125.5 | 126.8 |
| | අගෝස්තු | 177.9 | 109.5 | 123.8 |
| | සැප්තැම්බර් | 185.2 | 82.2 | 123.9 |
| සාමාන්‍යය | | 160.8 | 99.3 | 130.8 |

වගුව අංක 4 : එළවළු සඳහා මාසික සිල්ලර මිල රුපියල් (2007 – 2009)

| වර්ෂය | මාසය | උඩරට එළවළු සිල්ලර මිල | පහතරට එළවළු සිල්ලර මිල | අල බෝග සිල්ලර මිල | කොළ එළවළු සිල්ලර මිල |
|---|---|---|---|---|---|
| 2007 | ජනවාරි | 119.9 | 129.06 | 46.10 | 14.83 |
| | පෙබරවාරි | 88.46 | 82.37 | 41.20 | 14.78 |
| | මාර්තු | 70.50 | 51.30 | 39.01 | 15.18 |
| | අප්‍රේල් | 61.90 | 69.07 | 39.76 | 14.56 |
| | මැයි | 61.81 | 73.15 | 39.98 | 15.49 |
| | ජූනි | 76.20 | 77.67 | 44.13 | 14.67 |
| | ජූලි | 74.63 | 74.43 | 42.62 | 15.40 |
| | අගෝස්තු | 63.46 | 65.47 | 39.95 | 16.27 |
| | සැප්තැම්බර් | 67.23 | 64.32 | 38.52 | 16.80 |
| | ඔක්තෝබර් | 71.30 | 71.36 | 39.93 | 17.45 |
| | නොවැම්බර් | 79.94 | 84.67 | 40.99 | 18.84 |
| | දෙසැම්බර් | 74.97 | 120.38 | 41.24 | 19.25 |
| සාමාන්‍යය | | 75.1 | 80.2 | 41.1 | 16.2 |
| 2008 | ජනවාරි | 75.12 | 80.27 | 41.12 | 16.12 |
| | පෙබරවාරි | 82.47 | 112.83 | 43.63 | 18.56 |
| | මාර්තු | 83.80 | 68.10 | 46.35 | 19.56 |
| | අප්‍රේල් | 111.73 | 89.48 | 54.00 | 19.46 |
| | මැයි | 134.05 | 97.52 | 54.84 | 20.05 |
| | ජූනි | 114.47 | 104.23 | 53.39 | 19.95 |
| | ජූලි | 83.20 | 79.77 | 52.61 | 21.11 |
| | අගෝස්තු | 70.48 | 74.61 | 52.46 | 19.94 |
| | සැප්තැම්බර් | 69.32 | 73.99 | 50.66 | 19.80 |
| | ඔක්තෝබර් | 78.15 | 76.20 | 50.35 | 19.06 |
| | නොවැම්බර් | 9.05 | 94.16 | 49.10 | 20.47 |
| | දෙසැම්බර් | 99.91 | 129.43 | 50.19 | 20.90 |
| සාමාන්‍යය | | 91 | 90 | 49.9 | 19.6 |
| 2009 | ජනවාරි | 95.72 | 84.55 | 52.28 | 20.72 |
| | පෙබරවාරි | 84.77 | 80.24 | 51.90 | 20.35 |
| | මාර්තු | 73.92 | 82.61 | 50.44 | 20.06 |
| | අප්‍රේල් | 78.96 | 87.23 | 51.01 | 19.95 |
| | මැයි | 90.12 | 87.72 | 51.08 | 19.06 |
| | ජූනි | 101.90 | 88.97 | 55.63 | 19.67 |
| | ජූලි | 90.09 | 79.77 | 54.42 | 19.76 |
| | අගෝස්තු | 80.18 | 70.50 | 53.11 | 19.44 |
| | සැප්තැම්බර් | 71.47 | 67.60 | 50.38 | 19.50 |
| සාමාන්‍යය | | 85.2 | 81 | 52.2 | 19.8 |

වගු අංක 5 : පලතුරු සඳහා මාසික සාමාන්‍ය සිල්ලර මිල එකක් සඳහා රුපියල් (2007 – 2009)

| වර්ෂය | මාසය | දිවුල් සිල්ලර මිල | දොඩම් සිල්ලර මිල | අලිපේර සිල්ලර මිල | බෙලි සිල්ලර මිල |
|---|---|---|---|---|---|
| 2007 | ජනවාරි | 17.78 | 33.66 | 32.73 | 26.89 |
| | පෙබරවාරි | 18.81 | 24.52 | 25.99 | 19.99 |
| | මාර්තු | 18.82 | 22.87 | 28.02 | 19.53 |
| | අප්‍රේල් | 20.40 | 21.56 | 26.24 | 21.68 |
| | මැයි | 80.82 | 22.32 | 21.93 | 19.01 |
| | ජූනි | 23.50 | 29.68 | 22.63 | 19.87 |
| | ජූලි | 26.13 | 39.44 | 24.87 | 18.83 |
| | අගෝස්තු | 21.15 | 32.16 | 25.90 | 18.04 |
| | සැප්තැම්බර් | 17.18 | 32.09 | 23.51 | 24.77 |
| | ඔක්තෝබර් | 14.47 | 32.12 | 21.54 | 34.06 |
| | නොවැම්බර් | 12.83 | 32.05 | 24.63 | 36.36 |
| | දෙසැම්බර් | 16.22 | 33.15 | 24.00 | 33.12 |
| සාමාන්‍යය | | 19 | 29.6 | 27.1 | 24.3 |
| 2008 | ජනවාරි | 20.74 | 34.97 | 30.07 | 30.12 |
| | පෙබරවාරි | 23.11 | 33.37 | 36.14 | 26.46 |
| | මාර්තු | 25.71 | 31.78 | 33.47 | 25.26 |
| | අප්‍රේල් | 30.40 | 30.79 | 32.66 | 27.68 |
| | මැයි | 33.39 | 28.75 | 29.09 | 27.16 |
| | ජූනි | 34.87 | 28.71 | 28.38 | 26.22 |
| | ජූලි | 36.92 | 33.89 | 29.17 | 26.84 |
| | අගෝස්තු | 29.53 | 29.31 | 25.87 | 26.49 |
| | සැප්තැම්බර් | 27.26 | 33.62 | 26.61 | 36.05 |
| | ඔක්තෝබර් | 25.33 | 37.55 | 27.42 | 38.84 |
| | නොවැම්බර් | 24.42 | 36.61 | 29.48 | 35.58 |
| | දෙසැම්බර් | 27.96 | 37.90 | 35.49 | 32.70 |
| සාමාන්‍යය | | 28.3 | 33.1 | 30.3 | 29.1 |
| 2009 | ජනවාරි | 28.47 | 29.69 | 40.93 | 30.30 |
| | පෙබරවාරි | 31.71 | 27.56 | 44.14 | 30.86 |
| | මාර්තු | 33.76 | 31.13 | 36.47 | 33.17 |
| | අප්‍රේල් | 31.19 | 32.44 | 28.56 | 32.45 |
| | මැයි | 32.63 | 36.03 | 27.21 | 30.81 |
| | ජූනි | 31.13 | 44.27 | 23.82 | 26.11 |
| | ජූලි | 38.75 | 41.67 | 29.92 | 29.56 |
| | අගෝස්තු | 33.81 | 35.82 | 31.16 | 32.38 |
| | සැප්තැම්බර් | 26.95 | 31.75 | 25.88 | 39.27 |
| සාමාන්‍යය | | 32 | 34.5 | 32 | 31.6 |

වගු අංක 6 : මාළු, මස් සහ බිත්තර සඳහා මාසික සාමාන්‍ය සිල්ලර මිල (රු.කි.ග්‍රෑ.එකක්) (2007– 2009)

| වර්ෂය | මාසය | කුඩා මාළු සිල්ලර මිල | ලොකු මාළු සිල්ලර මිල | හරක් මස් සිල්ලර මිල | කුකුල් මස් සිල්ලර මිල | බිත්තර සිල්ලර මිල |
|---|---|---|---|---|---|---|
| 2007 | ජනවාරි | 145.53 | 400.19 | 292.07 | 270.00 | 8.33 |
| | පෙබරවාරි | 152.51 | 407.19 | 300.17 | 295.21 | 7.60 |
| | මාර්තු | 160.84 | 417.38 | 304.17 | 317.64 | 7.68 |
| | අප්‍රේල් | 166.21 | 428.92 | 308.77 | 312.80 | 8.00 |
| | මැයි | 177.38 | 446.85 | 289.63 | 305.68 | 6.94 |
| | ජූනි | 164.20 | 434.02 | 299.44 | 297.11 | 6.82 |
| | ජූලි | 185.40 | 464.82 | 300.17 | 283.55 | 7.56 |
| | අගෝස්තු | 184.54 | 454.38 | 288.30 | 274.14 | 8.08 |
| | සැප්තැම්බර් | 181.80 | 460.52 | 287.01 | 272.65 | 7.98 |
| | ඔක්තෝබර් | 165.20 | 458.48 | 309.07 | 286.75 | 7.99 |
| | නොවැම්බර් | 150.79 | 440.50 | 305.00 | 275.16 | 8.55 |
| | දෙසැම්බර් | 155.06 | 451.71 | 318.55 | 297.96 | 8.63 |
| සාමාන්‍යය | | 165.8 | 438.7 | 516 | 290.7 | 7.8 |
| 2008 | ජනවාරි | 168.86 | 427.88 | 322.60 | 310.21 | 8.64 |
| | පෙබරවාරි | 157.62 | 459.27 | 318.30 | 304.59 | 7.82 |
| | මාර්තු | 179.27 | 479.91 | 320.09 | 313.54 | 7.66 |
| | අප්‍රේල් | 202.76 | 485.95 | 343.33 | 330.14 | 8.62 |
| | මැයි | 221.30 | 517.04 | 337.25 | 319.53 | 8.41 |
| | ජූනි | 250.04 | 550.68 | 343.16 | 336.91 | 9.53 |
| | ජූලි | 252.54 | 547.30 | 370.74 | 366.77 | 9.31 |
| | අගෝස්තු | 228.63 | 568.47 | 375.83 | 385.14 | 8.91 |
| | සැප්තැම්බර් | 191.37 | 525.37 | 377.01 | 344.05 | 10.64 |
| | ඔක්තෝබර් | 174.63 | 503.17 | 372.81 | 313.21 | 11.02 |
| | නොවැම්බර් | 163.74 | 511.98 | 369.00 | 309.45 | 10.19 |
| | දෙසැම්බර් | 180.44 | 533.65 | 376.40 | 290.89 | 10.67 |
| සාමාන්‍යය | | 197.6 | 512.9 | 352.9 | 327 | 9.2 |
| 2009 | ජනවාරි | 191.29 | 530.12 | 368.47 | 286.00 | 10.26 |
| | පෙබරවාරි | 207.20 | 516.17 | 359.24 | 268.75 | 8.87 |
| | මාර්තු | 198.24 | 480.98 | 366.47 | 253.67 | 7.78 |
| | අප්‍රේල් | 223.99 | 534.27 | 393.92 | 277.18 | 8.40 |
| | මැයි | 252.45 | 575.38 | 394.06 | 292.17 | 10.07 |
| | ජූනි | 256.56 | 593.99 | 395.86 | 294.92 | 12.07 |
| | ජූලි | 237.76 | 557.64 | 395.23 | 303.56 | 10.92 |
| | අගෝස්තු | 214.34 | 548.67 | 393.62 | 294.88 | 9.62 |
| | සැප්තැම්බර් | 176.59 | 537.37 | 396.28 | 290.72 | 12.03 |
| සාමාන්‍යය | | 217.6 | 541.6 | 384.7 | 284.65 | 10 |

වගු අංක 7 : පොල් තෙල් සඳහා සාමාන්‍ය මාසික සිල්ලර මිල (රු.මි.ලී.750) (2007-2009)

| මාසය | 2007<br>සිල්ලර මිල | 2008<br>සිල්ලර මිල | 2009<br>සිල්ලර මිල |
|---|---|---|---|
| ජනවාරි | 79.44 | 99.49 | 156.6 |
| පෙබරවාරි | 78.26 | 102.09 | 194.22 |
| මාර්තු | 77.76 | 105.77 | 219.88 |
| අප්‍රේල් | 77.61 | 111.79 | 231.90 |
| මැයි | 78.48 | 116.68 | 207.59 |
| ජූනි | 76.92 | 123.19 | 191.62 |
| ජූලි | 77.20 | 124.00 | 178.15 |
| අගෝස්තු | 77.71 | 124.25 | 163.89 |
| සැප්තැම්බර් | 79.83 | 123.53 | 149.77 |
| ඔක්තෝබර් | 80.45 | 130.21 | 142.93 |
| නොවැම්බර් | 83.67 | 162.75 | 131.83 |
| දෙසැම්බර් | 93.31 | 153.25 | 129.83 |
| සාමාන්‍ය | 80.05 | 123.0 | 174.86 |

වගු අංක 8 : සීනි සඳහා සාමාන්‍ය මාසික සිල්ලර මිල (රු කි.ග්‍රෑ.) (2007-2009)

| මාසය | 2007<br>සිල්ලර මිල | 2008<br>සිල්ලර මිල | 2009<br>සිල්ලර මිල |
|---|---|---|---|
| ජනවාරි | 46.43 | 59.30 | 62.59 |
| පෙබරවාරි | 54.30 | 57.90 | 65.18 |
| මාර්තු | 56.41 | 55.92 | 64.24 |
| අප්‍රේල් | 60.10 | 53.95 | 61.89 |
| මැයි | 59.45 | 52.12 | 61.47 |
| ජූනි | 58.77 | 52.12 | 60.75 |
| ජූලි | 60.74 | 51.23 | 61.45 |
| අගෝස්තු | 61.20 | 50.63 | 62.47 |
| සැප්තැම්බර් | 59.56 | 50.15 | 64.17 |
| ඔක්තෝබර් | 57.29 | 52.06 | 63.97 |
| නොවැම්බර් | 59.68 | 51.17 | 64.43 |
| දෙසැම්බර් | 60.31 | 51.68 | 64.46 |
| සාමාන්‍ය | 57.85 | 53.13 | 63.09 |

ඇමුණුම 03

## ප්‍රධාන සැපයුම් මූලාශ්‍ර

| අංශය | ස්වයං නිෂ්පාදන | | මිලට ගැනීමෙන් | | එකතුව |
|---|---|---|---|---|---|
| | ගෘහ ඒකක සංඛ්‍යාව | % | ගෘහ ඒකක සංඛ්‍යාව | % | ගෘහ ඒකක සංඛ්‍යාව |
| 4.1 සහල් | | | | | |
| නාගරික | 1.00 | 2.00 | 49.00 | 98.00 | 50.00 |
| ග්‍රාමීය | 80.00 | 53.33 | 7.00 | 46.67 | 150.00 |
| වතු | | | 5.00 | 100.00 | 50.00 |
| එකතුව | 81.00 | 32.40 | 218.00 | 87.20 | 250.00 |
| | | | | | |
| 4.2 බඩඉරිඟු | | | | | |
| නාගරික | | | 3.00 | 100.00 | 3.00 |
| ග්‍රාමීය | 40.0 | 25.00 | 12.00 | 75.00 | 16.00 |
| වතු | | | | | |
| එකතුව | 4.00 | 21.05 | 15.00 | 78.95 | 19.00 |
| | | | | | |
| 4.3 පාන්, තිරිඟුපිටි | | | | | |
| නාගරික | | | 42.00 | 100.00 | 42.00 |
| ග්‍රාමීය | | | 31.00 | 100.00 | 31.00 |
| වතු | | | 4.00 | 100.0 | 4.00 |
| එකතුව | | | 77.00 | 100.0 | 77.00 |
| | | | | | |
| 4.4 මඤ්ඤොක්කා | | | | | |
| නාගරික | | | 17.00 | 100.00 | 17.00 |
| ග්‍රාමීය | 24.00 | 48.00 | 26.00 | 52.00 | 50.00 |
| වතු | | | 9.00 | 100.00 | 9.00 |
| එකතුව | 24.00 | 31.58 | 52.00 | 68.42 | 76.00 |
| | | | | | |
| 4.5 බතල හා වෙනත් අල | | | | | |
| නාගරික | | | 16.00 | 100.00 | 16.00 |
| ග්‍රාමීය | 4.00 | 12.50 | 28.00 | 87.5. | 32.00 |
| වතු | | | 12.00 | 100.00 | 12.00 |
| එකතුව | 4.00 | 6.67 | 56.00 | 93.33 | 60.00 |
| | | | | | |
| 4.6 මුංඇට, කව්පි, රටකජු/වෙනත් මාංශ බෝග | | | | | |
| නාගරික | | | 35.00 | 100.00 | 35.00 |
| ග්‍රාමීය | 12.00 | 13.04 | 80.00 | 86.96 | 92.00 |
| වතු | | | 27.00 | 100.00 | 27.00 |
| එකතුව | 12.00 | 7.79 | 142.00 | 92.21 | 154.00 |
| | | | | | |
| 4.7 මාළු | | | | | |
| නාගරික | | | 31.00 | 100.00 | 31.00 |
| ග්‍රාමීය | 5.00 | 6.17 | 76.00 | 93.83 | 81.00 |
| වතු | | | 3.00 | 100.00 | 3.00 |
| එකතුව | 5.00 | 4.35 | 110.00 | 95.65 | 115.00 |

| අංශය | ස්වයං නිෂ්පාදන | | මිලට ගැනීමෙන් | | එකතුව |
|---|---|---|---|---|---|
| | ගෘහ ඒකක සංඛ්‍යාව | % | ගෘහ ඒකක සංඛ්‍යාව | % | ගෘහ ඒකක සංඛ්‍යාව |
| 4.8 මස් (හරක් මස්/ඌරු මස්/කුකුළු මස්) | | | | | |
| නාගරික | | | 22.97 | 100.00 | 22.97 |
| ග්‍රාමීය | | | 26.00 | 100.00 | 26.00 |
| වතු | | | 8.00 | 100.00 | 8.00 |
| එකතුව | | | 56.97 | 100.00 | 56.97 |
| 4.9 බිත්තර | | | | | |
| නාගරික | | | 26.00 | 100.00 | 26.00 |
| ග්‍රාමීය | 6.00 | 6.32 | 89.00 | 93.68 | 95.00 |
| වතු | | | 8.00 | 100.00 | 8.00 |
| එකතුව | 6.00 | 4.62 | 8.00 | 95.35 | 129.00 |
| 4.10 එළවළු (කොළ එළවළු ඇතුළු) | | | | | |
| නාගරික | 1.00 | 2.04 | 48.00 | 97.96 | 49.00 |
| ග්‍රාමීය | 26.00 | 18.06 | 118.00 | 81.94 | 144.00 |
| වතු | 5.00 | 11.90 | 37.00 | 88.10 | 42.00 |
| එකතුව | 32.00 | 13.62 | 203.00 | 86.38 | 235.00 |
| 4.11 පළතුරු | | | | | |
| නාගරික | 1.00 | 3.23 | 30.00 | 96.77 | 31.00 |
| ග්‍රාමීය | 9.00 | 13.24 | 59.00 | 86.76 | 68.00 |
| වතු | 1.00 | 14.29 | 6.00 | 85.71 | 7.00 |
| එකතුව | 11.00 | 10.38 | 95.00 | 89.62 | 106.00 |
| 4.12 සීනි සහ පැණිරස කෑම | | | | | |
| නාගරික | | | 49.00 | 100.00 | 49.00 |
| ග්‍රාමීය | 6.00 | 4.11 | 140.00 | 95.89 | 146.00 |
| වතු | | | 49.00 | 100.00 | 49.00 |
| එකතුව | 6.00 | 2.46 | 238.00 | 97.54 | 244.00 |
| 4.13 පොල් | | | | | |
| නාගරික | 5.00 | 10.00 | 45.00 | 90.00 | 50.00 |
| ග්‍රාමීය | 80.00 | 53.33 | 70.00 | 46.67 | 150.00 |
| වතු | | | 50.00 | 100.00 | 50.00 |
| එකතුව | 85.00 | 34.00 | 165.00 | 66.00 | 250.00 |
| 4.14 පොල්තෙල්/එළවළු තෙල්/සත්ව තෙල් | | | | | |
| නාගරික | | | 47.00 | 100.00 | 47.00 |
| ග්‍රාමීය | 21.00 | 14.58 | 123.00 | 85.42 | 144.00 |
| වතු | | | 50.00 | 100.00 | 50.00 |
| එකතුව | 21.00 | 8.71 | 220.00 | 91.29 | 241.00 |
| 4.15 කිරිපිටි | | | | | |
| නාගරික | | | 32.00 | 100.00 | 47.00 |
| ග්‍රාමීය | | | 64.00 | 100.00 | 64.00 |
| වතු | | | 14.00 | 100.00 | 14.00 |
| එකතුව | | | 110.00 | 100.00 | 110.00 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2009).

තැ.පෙ. 1522 දු.අ. 94 11 2696981 විද්‍යුත් තැපැල් : library@harti.lk
කොළඹ, 94 11 2696437
ශ්‍රී ලංකාව. ෆැක්ස් 94112692423. වෙබ් : www.harti.gov.lk

ISBN 978-955-612-131-5
9789556121315
Rs. 230/-

National Digitization Project

*National Science Foundation*

Institute : National Science Foundation

1. Place of Scanning : Sanje (Private) Ltd, Hokandara

2. Date Scanned : 02/06/2017

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : Angelo Melvin Luwis

Signature : A. M. Luwis

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Information Officer

Name : Renuka Sugathadasa

Signature : K. P. Sugathadasa

Date : 02/06/2017

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*